වාර්ෂික වාර්තාව

2021

NMRA
NATIONAL MEDICINES REGULATORY AUTHORITY

ජාතික ඖෂධ නියාමන අධිකාරිය (NMRA)
අංක 120, නොරිස් කැනල් පාර, කොළඹ 10.

පටුන

පිටු අංක.

වත්මන් සභාපතිතුමාගේ පණිවිඩය 04

වත්මන් ප්‍රධාන විධායක නිලධාරිතුමාගේ පණිවිඩය 05

අධ්‍යක්ෂ මණ්ඩලය - 2021 06

1 වන පරිච්ඡේදය - ආයතනික පැතිකඩ / විධායක සාරාංශය **07**

1.1 හැඳින්වීම 07

1.2 අධිකාරියේ දැක්ම, මෙහෙවර, අරමුණු 09

1.2.1 අධිකාරියේ දැක්ම 09

1.2.2 අධිකාරියේ මෙහෙවර 09

1.2.3 අධිකාරියේ අරමුණු 09

1.3 ප්‍රධාන කාර්යයන් 10

1.4 ජාතික ඖෂධ නියාමන අධිකාරිය යටතේ පවතින අංශ 11

1.4.1 ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරය (NMQAL) 11

1.4.1.1 හැඳින්වීම 11

1.4.1.2 ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරයෙහි ආංශික ව්‍යුහය 12

1.4.1.3 ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරයෙහි ප්‍රධාන කාර්යයන් 12

1.4.2 ඖෂධ නියාමන අංශය 13

1.4.2.1 හැඳින්වීම 13

1.4.2.2 ඖෂධ නියාමන අංශයේ ආංශික ව්‍යුහය 13

1.4.2.3 ඖෂධ නියාමන අංශයේ කාර්යයන් 14

1.4.3 මුල්‍ය අංශය 14

1.4.3.1 හැඳින්වීම 14

1.4.3.2 මුල්‍ය අංශයේ ආංශික ව්‍යුහය 14

1.4.3.3 මුල්‍ය අංශයේ කාර්යයන් 15

1.4.4 පරිපාලන අංශය 15

1.4.4.1 හැඳින්වීම 15

1.4.4.2 පරිපාලන අංශයේ ආංශික ව්‍යුහය 16

1.4.4.3 පරිපාලන අංශයේ කාර්යයන් 16

1.4.5 නීති අංශය 17

1.4.5.1 හැඳින්වීම 17

1.4.5.2 නීති අංශයේ ආංශික ව්‍යුහය 17

1.4.5.3 නීති අංශයේ ප්‍රධාන කාර්යයන් 17

පිටු අංක.

1.4.6 අධීක්ෂණ සහ බලාත්මක කිරීමේ අංශය 18

1.4.6.1 හැඳින්වීම 18

1.4.6.2 අධීක්ෂණ සහ බලාත්මක කිරීමේ අංශයේ ආංශික ව්‍යුහය..... 19

1.4.6.3 අධීක්ෂණ සහ බලාත්මක කිරීමේ අංශයේ කාර්යයන් 19

1.4.7 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ (ICT) අංශය 20

1.4.7.1 හැඳින්වීම 20

1.4.7.2 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශයේ ආංශික ව්‍යුහය 20

1.4.8 මානව සම්පත් අංශය 21

1.4.8.1 හැඳින්වීම 21

1.4.8.2 මානව සම්පත් අංශයේ ආංශික ව්‍යුහය 21

2 වන පරිච්ඡේදය - ප්‍රගතිය සහ දැක්ම **22**

2.1 ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරයේ (NMQAL) ප්‍රගතිය 22

2.2 ඖෂධ නියාමන අංශයේ ප්‍රගතිය 24

2.2.1 ඖෂධ නියාමන අංශය 25

2.2.2 වෛද්‍ය උපකරණ නියාමන අංශය 28

2.2.3 විලවුන් නිෂ්පාදන නියාමන අංශය 29

2.2.4 සිමාස්ථ නිෂ්පාදන නියාමන අංශය 31

2.2.5 නිෂ්පාදන නියාමන අංශය (MFRD) 31

2.2.6 මිල නියාමන ඒකකය 33

2.2.7 සායනික පරීක්ෂණ නියාමන අංශය 33

2.2.8 ඖෂධ සුරක්ෂිතතාවය පිලිබඳ අධීක්ෂණ අංශය 35

2.2.9 ජාතික ඖෂධ නියාමන අධිකාරියෙහි තොරතුරු, අධ්‍යාපනය, සන්නිවේදන සහ පර්යේෂණ අංශය විසින් 2021 දී පවත්වනු ලබන පුහුණු සහ දැනුවත් කිරීමේ වැඩසටහන්. 37

2.3 අධීක්ෂණ සහ බලාත්මක කිරීමේ අංශයේ (IED) ප්‍රගතිය..... 38

2.4 මූල්‍ය අංශයේ ප්‍රගතිය 45

2.5 පරිපාලන අංශයේ ප්‍රගතිය 45

2.6 නීති අංශයේ ප්‍රගතිය 46

2.7 මානව සම්පත් අංශයේ ප්‍රගතිය 50

3 වන පරිච්ඡේදය - සමස්ත මූල්‍ය කාර්ය සාධනය..... **54**

4 වන පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීමේ කාර්ය සාධනය (SDG) **95**

5 වන පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව **97**

කෙටි යෙදුම් ලැයිස්තුව

BPEC	සීමාස්ථ නිෂ්පාදන ඇගයීම් කමිටුව
CDD Act	විලවුන් උපකරණ සහ ඖෂධ පනත
CFDI	ප්‍රධාන ආහාර හා ඖෂධ පරීක්ෂක
DO	සංවර්ධන නිලධාරී
FDI	ආහාර සහ ඖෂධ පරීක්ෂක
GDP	යහපත් බෙදාහැරීමේ පරිචයන්
GLP	යහපත් රසායනාගාර පරිචයන්
GMP	යහපත් නිෂ්පාදන පරිචයන්
GPP	යහපත් ඔසුසල් පරිචයන්
ICT	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය
ID Card	හැඳුනුම්පත
IED	අධීක්ෂණ සහ බලාත්මක කිරීමේ අංශය
ISO	ප්‍රමිතිකරණය සඳහා ජාත්‍යන්තර සංවිධානය
IT	තොරතුරු තාක්ෂණය
KKS	කාර්යාල කාර්ය සහයක
MA	කළමනාකරණ සහකාර
MDEC	වෛද්‍ය උපකරණ ඇගයීම් කමිටුව
MEC	ඖෂධ ඇගයීම් කමිටුව
NDDCB	ජාතික අන්තරායකර ඖෂධ පාලන මණ්ඩලය
NDQAL	ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරය
NMQAL	ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරය
NMRA	ජාතික ඖෂධ නියාමන අධිකාරිය
PV	ඖෂධ සුරක්ෂිතතාවය පිලිබඳ අධීක්ෂණය
SCOCT	සායනික පර්යේෂණ අනු කමිටුව
SDG	තිරසාර සංවර්ධන අරමුණු
SSFFC	බාලකළ/ කූට/ ව්‍යාජ ලෙස ලේබල් කල/ ව්‍යාජ/ නොමඟ යවන සුළු
TRIPS	බුද්ධිමය දේපල හිමිකම් පිළිබඳ වෙළඳාමට අදාළ අංශ
UNDP	එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන
WD	ආපසු ගැනීම
WH	රඳවා ගැනීම
WHO	ලෝක සෞඛ්‍ය සංවිධානය

වත්මන් සභාපතිතුමාගේ පණිවිඩය

සෞඛ්‍ය අමාත්‍යාංශයේ යටතේ ක්‍රියාත්මක වන ස්වාධීන ආයතනයක් වන ජාතික ඖෂධ නියාමන අධිකාරියේ 2021 වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට ලැබීම ගැන මම සතුටු වෙමි. අධිකාරියේ ප්‍රධාන කාර්යය වන්නේ ශ්‍රී ලංකාවේ ජාතික ඖෂධ ප්‍රතිපත්තිය අනුගමනය කරමින් මහජනතාව සඳහා සියලු වර්ගවල ඖෂධ, වෛද්‍ය උපකරණ, සීමාස්ථ නිෂ්පාදන සහ විලවුන්හි ගුණාත්මකභාවයන්, ආරක්ෂාකාරීව, කාර්යක්ෂමතාව සහ දැරිය හැකි මිලකට පාරිභෝගිකයා වෙත ලබා දීමයි.

විශේෂයෙන්ම යටිතල පහසුකම් නොමැතිකම වැනි අභියෝග රැසකට මුහුණ දෙමින් රට තුළ භාවිත වන ඖෂධ, වෛද්‍ය උපකරණ, සීමාස්ථ නිෂ්පාදන, සහ විලවුන් කාර්යක්ෂමව, ඵලදායිව සහ ඉතා විනිවිදභාවයකින් යුතුව නියාමනය කිරීමට ජාතික ඖෂධ නියාමන අධිකාරියට හැකි වී තිබේ. වෛද්‍ය නිෂ්පාදන නියමිත ප්‍රමිතීන්ට අනුකූලද යන්න සොයා බැලීම සඳහා ජාතික ඖෂධ නියාමන අධිකාරියට තාක්ෂණික සහාය සපයන ජාතික වශයෙන් පිළිගත් ප්‍රමුඛතම රසායනාගාරය වන ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරය තිබීම ජාතික ඖෂධ නියාමන අධිකාරියට ආඩම්බරයකි.

2015 වර්ෂයේදී පිහිටුවන ලද ජාතික ඖෂධ නියාමන අධිකාරියේ 2017 වන විට මූල්‍යමය වශයෙන් ස්ථාවර වී කිසිදු මූල්‍ය ප්‍රතිපාදනයක් නොමැතිව මහා භාණ්ඩාගාරයෙන් ස්වාධීනව කටයුතු කිරීම පිළිබඳවද මම සතුටු වෙමි. ඖෂධ අලෙවිසැල් සහ අනෙකුත් ආශ්‍රිත නිෂ්පාදන සඳහා සහතික සහ බලපත්‍ර නිකුත් කිරීම වඩාත් කාර්යක්ෂම කිරීම සඳහා පද්ධති ජාලගත කිරීමට දැනටමත් පියවර කිහිපයක් ගෙන ඇති අතර මෙමගින් රටේ සෞඛ්‍ය සේවා පද්ධතියේ ගුණාත්මක භාවය සහ කාර්යක්ෂමතාව සෘජුවම ඉහළ නැංවිය හැකි බව මාගේ විශ්වාසයයි.

ප්‍රධාන විධායක නිලධාරීතුමාගේ නායකත්වය යටතේ ජාතික ඖෂධ නියාමන අධිකාරියට සුදුසු සුදුසුකම් ලත් නිලධාරීන් බඳවා ගැනීමටත්, සේවක තෘප්තිය සහ මානව සම්පත් මනාලෙස සංවර්ධනය කිරීම තුළින් ආයතනයේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට කාර්ය මණ්ඩලයට මග පෙන්වීමටත් මම බලාපොරොත්තු වෙමි.

මහාචාර්ය එස්.ඩී. ජයරත්න

සභාපති

ජාතික ඖෂධ නියාමන අධිකාරිය

වත්මන් ප්‍රධාන විධායක නිලධාරිතුමාගේ පණිවිඩය

අග්නිදිග ආසියාවේ ශීඝ්‍රයෙන් වර්ධනය වන ඖෂධ නියාමන අධිකාරියක් වන ජාතික ඖෂධ නියාමන අධිකාරියෙහි ප්‍රධාන විධායක නිලධාරියා වන මම, 2021 වසර සඳහා එහි වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට ලැබීම ගැන මම ආඩම්බර වෙමි. ආරම්භයේ සිටම අප අපගේ දැක්ම හඳුනාගෙන, අවබෝධ කරගත් අතර අපගේ ආයතනයේ මෙහෙවර සහ ඉලක්ක සපුරාගැනීම සඳහා එය ඉවහල් වූ අතර එසේම මෙම සියලු උත්සාහයන් පිටුපස ඇති මිල කළ නොහැකි ශක්තිය කණ්ඩායමේ සාමාජිකයින් වන සඳහන් කල යුතුමය.

මෙම වසරේදී ද ජාතික ඖෂධ නියාමන අධිකාරියෙහි සිය නියාමන ක්‍රියාකාරකම් හරහා සිය පිරිවැටුමේ සැලකිය යුතු වර්ධනයක් වාර්තා කර ඇත.

අධිකාරියේ පිරිවැටුම ප්‍රධාන වශයෙන් රඳා පවතින්නේ සැකසුම් ගාස්තු, ලියාපදිංචිය, නියැදි බලපත්‍ර, ආනයන බලපත්‍ර, නිෂ්පාදන බලපත්‍ර, සහ වෛද්‍ය උපකරණ සහ ඖෂධවලින් ලැබෙන තාවකාලික සහ සම්පූර්ණ ලියාපදිංචි ආදායම මත ය.

මෙම වර්ෂයේදී ද ශ්‍රී ලංකා මහා භාණ්ඩාගාරයේ දායකත්වයෙන් තොරව අධිකාරිය විසින් සැලකිය යුතු ආදායමක් වාර්තා කර ඇති අතර ජාතික ඖෂධ නියාමන අධිකාරිය භාණ්ඩාගාර බද්දක් ලෙසත්, එහි ශුද්ධ ආදායමෙන් ආදායම් බද්දක් ලෙසත් මහා භාණ්ඩාගාරයට දායක වීමට හැකිවීම පිළිබඳව මම බෙහෙවින් ආඩම්බර වෙමි.

අපගේ ආයතනයේ අනාගත උපායමාර්ගික ඉලක්කය වනුයේ අධිකාරියේ ව්‍යවස්ථාමය රාමුව ශක්තිමත් කිරීම බව අප හඳුනාගෙන ඇත්තෙමු. මෙහෙයුම් ඵලදායිතාව, මූල්‍ය කාර්ය සාධනය සහ ස්වාධීනත්වය වැඩිදියුණු කිරීම, මානව සම්පත වර්ධනය කිරීම සහ තොරතුරු තාක්ෂණ පද්ධතිවල නවීන ක්‍රම භාවිතා කිරීම මගින් එම ඉලක්කය සපුරා ගැනීමට මම සම්පූර්ණයෙන්ම කැපවීමට බලාපොරොත්තු වෙමි.



විශේෂඥ වෛද්‍ය විජිත් ගුණසේකර
ප්‍රධාන විධායක නිලධාරී
ජාතික ඖෂධ නියාමන අධිකාරිය

අධ්‍යක්ෂක මණ්ඩලය - 2021

1. වෛද්‍ය රසිත ඉන්දුල විජේවන්ත (සභාපති)
2. වෛද්‍ය සචීන් සේමගේ (ප්‍රධාන විධායක නිලධාරී)
3. වෛද්‍ය අසේල ගුණවර්ධන (DGHS)
4. මහාචාර්ය සිසිර සිරිබද්දන
5. වෛද්‍ය ආනන්ද විජේවික්‍රම
6. කේ. සජීවනි දයාරත්න මිය
7. වෛද්‍ය නිශ්ශංක ජයවර්ධන
8. වෛද්‍ය සනත් ලැනරෝල්
9. ඩබ්.එම්.ජී.එම්. විජේසුරිය මිය
10. මහාචාර්ය සුදීරා ජයසිංහ
11. වෛද්‍ය සෙව්වන්දි සුභසිංහ
12. රාජා ගුණරත්න මයා

1 වන පරිච්ඡේදය

ආයතනික පැතිකඩ/ විධායක සාරාංශය

1.1 හැඳින්වීම

ජාතික ඖෂධ නියාමන අධිකාරිය (NMRA) යනු සියලු වර්ගවල ඖෂධ, වෛද්‍ය උපකරණ සහ සීමාසහිත නිෂ්පාදන නියාමනය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ පිහිටුවා ඇති එකම රාජ්‍ය ආයතනයයි. එමෙන්ම මහජනතාවට දැරිය හැකි මිලකට රට තුළ අලෙවි කෙරෙන සියලුම ඖෂධ නිෂ්පාදනවල ගුණාත්මකභාවය, සඵලත්වය සහ සුරක්ෂිතතාවය සහතික කිරීම සම්බන්ධයෙන් වගකියනු ලබන ආයතනයද වේ.

රට තුළ බෙදා හරින ලද සියලුම ඖෂධ, වෛද්‍ය උපකරණ සහ විලවුන් නියාමනය කිරීමේ නීතිමය රාමුව 1980 අංක 27 දරන විලවුන්, උපකරණ සහ ඖෂධ පනත (CDD Act) සහ 1984 විලවුන්, උපකරණ සහ ඖෂධ රෙගුලාසි සහ 1980 සිට 2015 ජූලි දක්වා නිකුත් කරන ලද සංශෝධන මගින් සපයා ඇත. තවද, ජාතික ඖෂධ ප්‍රතිපත්තිය; විලවුන්, උපකරණ සහ ඖෂධ පනත මඟින් සකස් කරන ලද අතර 2007 වසරේදී ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දෙන ලදී. ඉහත පනත් ප්‍රතිස්ථාපනය කරමින් 2015 වසරේදී මෙම කරුණු වෙනුවෙන් 2015 අංක 05 දරණ ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත (NMRA Act) පාර්ලිමේන්තුවේදී සම්මත කරනු ලැබීය.

ජාතික ඖෂධ නියාමන අධිකාරී පනතට අනුව ජාතික ඖෂධ නියාමන අධිකාරිය 2015 මාර්තු මස සිට ස්ථාපිත වූ අතර, එය සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ අර්ධ රාජ්‍ය ආයතනයක් ලෙස 2015 ජූලි 01 වෙනි දින සිට රාජකාරීන් ආරම්භ කරන ලදී. ජාතික ඖෂධ නියාමන අධිකාරී පනත යටතේ ස්වාධීන අධිකාරියක් ලෙස ශ්‍රී ලංකාවේ රෝගීන්ට ලබා දෙන සියලුම ඖෂධ හා සම්බන්ධ නිෂ්පාදිතයන්හි සුරක්ෂිතභාවය, ගුණාත්මකභාවය, සඵලත්වය සහ සුලභත්වය පිලිබඳ තීරණය කරමින් ස්වයං තීරණ ගැනීමේ සහ එම අධිකාරියෙහි කාර්යයන් පාලනය කිරීමට හැකියාවක් මෙම ආයතනය සතුය.

ඒ අනුව, ජාතික ඖෂධ නියාමන අධිකාරීයේ ක්‍රියාකාරකම්වල සුමට ක්‍රියාකාරිත්වය සහතික කිරීම සඳහා පහත සඳහන් අංශ ස්ථාපිත කර සක්‍රිය කර ඇත.

- ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාරය (NMQAL)
- ඖෂධ නියාමන අංශය
- මූල්‍ය අංශය
- පරිපාලන අංශය
- මානව සම්පත් අංශය
- නීති අංශය
- අධීක්ෂණ සහ බලාත්මක කිරීමේ අංශය
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය

තවද, තීරණ ගැනීමේ ක්‍රියාවලිය සඳහා සහාය වීම සඳහා අදාළ ක්ෂේත්‍ර වල ප්‍රවීණයන්ගෙන් සමන්විත කමිටු කිහිපයක් ද ඇත;

- ඖෂධ ඇගයීම් කමිටුව (MEC)
- වෛද්‍ය උපකරණ ඇගයීම් කමිටුව (MDEC)
- සායනික පරීක්ෂණ අනු කමිටුව (SCCT)
- විලවුන් ඇගයීම් කමිටුව (CEC)

රට තුළ පවතින සියලුම නිෂ්පාදනවල ආරක්ෂාව, ගුණාත්මකභාවය සහ සඵලතාවය සහතික කිරීම සඳහා ඖෂධ, උපකරණ, සීමාස්ථ නිෂ්පාදන, සායනික පරීක්ෂණ සහ විලවුන් ඇගයීම සඳහා එම සියලු කමිටු වගකිව යුතුය.

මීට අමතරව, එම සියලුම ඖෂධ ද්‍රව්‍ය මහජනතාවට දැරිය හැකි මිලකට ලබා ගැනීම සහතික කිරීම සඳහා වෙළඳපල මිල නියාමනය කිරීම සඳහා වන මිල නියාමනය කිරීමේ කමිටුව (Pricing Committee) වගකිව යුතුය.

මීට අමතරව, මහජනතාවට විවෘත වූ අභියාචනා කමිටුවක් සහ ජාතික ඖෂධ නියාමන අධිකාරි පනත ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම සඳහා උපදේශක කමිටුවක් ද ඇත.

තවද, නීතිමය අවශ්‍යතා ලෙස ජාතික ඖෂධ නියාමන අධිකාරි පනත මඟින් යහපත් නිෂ්පාදන පරිවයන් (GMP), යහපත් බෙදාහැරීමේ පරිවයන් (GDP) සහ යහපත් ඔසුසල් පරිවයන් (GPP) පරීක්ෂා කරනු ලබයි.

1.2 අධිකාරියේ දැක්ම , මෙහෙවර සහ අරමුණු

1.2.1 අධිකාරියේ දැක්ම

"ගුණාත්මක බව සහතික කළ ඖෂධ සහ සෞඛ්‍ය ආරක්ෂණ නිෂ්පාදන සඳහා ප්‍රවේශය වැඩි දියුණු කිරීම."

1.2.2 අධිකාරියේ මෙහෙවර

"ඖෂධ සහ සෞඛ්‍ය ආරක්ෂණ නිෂ්පාදනවල ගුණාත්මකභාවය ආරක්ෂාව හා කාර්යක්ෂමතාව සහතික කිරීම සඳහා නියාමන අධීක්ෂණ සහ සාධක පදනම් තීරණ රෝගීන්ගේ යහපත සඳහා ලබා දීම."

1.2.3 අධිකාරියේ අරමුණු

(අ) ප්‍රත්‍යක්ෂ, ආරක්ෂාකාරී සහ නිවැරදි තත්වයෙන් යුතු ඖෂධ, ප්‍රත්‍යක්ෂ, ආරක්ෂාකාරී සහ නිවැරදි තත්වයෙන් යුතු වෛද්‍ය උපකරණ සහ ප්‍රත්‍යක්ෂ, ආරක්ෂාකාරී සහ නිවැරදි තත්වයෙන් යුතු සීමාස්ථ නිෂ්පාදන සාධාරණ මිලකට මහජනතාවට ලබා දෙන බවට තහවුරු කිරීම.

(ආ) ඖෂධ, වෛද්‍ය උපකරණ සහ සීමාස්ථ නිෂ්පාදන ලියාපදිංචි කිරීම, බලපත්‍ර ලබා දීම, ලියාපදිංචිය හෝ බලපත්‍ර අවලංගු කිරීම, නිෂ්පාදනය කිරීම, මිල නියම කිරීම, ආනයනය කිරීම, ගබඩා කිරීම, ප්‍රවාහනය කිරීම, බෙදා හැරීම, විකිණීම, ප්‍රචාරණය කිරීම සහ බැහැර කිරීම හා සම්බන්ධ සියලු කාරණා සඳහා මධ්‍යම නියාමක ලෙස කටයුතු කිරීම.

(ඇ) ඖෂධ, වෛද්‍ය උපකරණ, සීමාස්ථ නිෂ්පාදන සහ විමර්ශනාත්මක ඖෂධීය නිෂ්පාදන ලියාපදිංචි කිරීම, බලපත්‍ර ලබා දීම සහ ආනයනය කිරීමට අදාළ සියලු කටයුතු විනිවිදභාවයකින් යුතුව, තිරසාර ලෙස සහ සාධාරණ ආකාරයට සිදුකරන බවට තහවුරු කිරීම.

(ඇ) අත්‍යාවශ්‍ය ඖෂධ සාධාරණ මිලකට පැවතීම සහතික කිරීමේ අරමුණින් ශ්‍රී ලංකාව තුළ නිවැරදි තත්වයෙන් යුතු ඖෂධ නිෂ්පාදනය දිරිමත් කිරීම.

(ඉ) සෞඛ්‍ය සත්කාර වෘත්තිකයන් හා පාරිභෝගිකයන් විසින් ඖෂධ, වෛද්‍ය උපකරණ සහ සීමාස්ථ නිෂ්පාදන ආරක්ෂාකාරී ලෙස සහ විචාරශීලී ලෙස භාවිතය ප්‍රවර්ධනය කිරීම.

(ඊ) ඖෂධ, වෛද්‍ය උපකරණ සහ සීමාස්ථ නිෂ්පාදනවලට සම්බන්ධිත අදාළ නීති සඳහා උචිත සංශෝධන නිර්දේශ කිරීම.

(උ) ඖෂධ, වෛද්‍ය උපකරණ සහ සීමාස්ථ නිෂ්පාදන පිලිබඳ මහජනතාව, සෞඛ්‍ය සත්කාර වෘත්තිකයන් සහ ඒ පිළිබඳව සැලකිල්ලක් දක්වන සියලු දෙනා දැනුවත් කිරීම.

(ඌ) ඖෂධ, වෛද්‍ය උපකරණ සහ සීමාස්ථ නිෂ්පාදන ප්‍රවර්ධනය සහ අලෙවිකරණය නියාමනය කිරීම.

(එ) ඖෂධ, වෛද්‍ය උපකරණ සහ සීමාස්ථ නිෂ්පාදන පැවතීම නියාමනය කිරීම.

(ඒ) ඖෂධ, වෛද්‍ය උපකරණ සහ සීමාස්ථ නිෂ්පාදනවල තත්ත්වය, ආරක්ෂාකාරී බව සහ අහිතකර ප්‍රතික්‍රියාවන් පිළිබඳව පශ්චාත් අලෙවිකරණ සමීක්ෂණ පැවැත්වීම.

(ඔ) ශ්‍රී ලංකාවේ සායනික පරීක්ෂණ පැවැත්වීමට අදාළ සියලු කටයුතු නියාමනය කිරීම.

1.3 ප්‍රධාන කාර්යයන්

- නව ඖෂධ, වෛද්‍ය උපකරණ සහ සීමාස්ත නිෂ්පාදන ලියාපදිංචි කිරීම.
- වෙළඳපොලේ දැනටමත් ලියාපදිංචි නිෂ්පාදනවල සංශෝධනය කිරීම් නියාමනය කිරීම
- යහපත් නිෂ්පාදන පරිචයන් අධීක්ෂණය සහ ක්‍රියාත්මක කිරීම
- වෙළඳපලේ ඇති ඖෂධ නිෂ්පාදිත සහ වෙළඳ දැන්වීම් සම්බන්ධයෙන් සුපරීක්ෂාකාරී වීම
- සායනික පරීක්ෂණ නියාමනය සහ අධීක්ෂණය කිරීම.
- ඖෂධ නිෂ්පාදන අපනයනය කිරීම සඳහා යහපත් නිෂ්පාදන සහතික කිරීම
- යහපත් ඖෂධවේදාත්මන පරිචයන් බලාත්මක කිරීම
- වෙළඳපලේ ඇති ඖෂධීය නිෂ්පාදන පරීක්ෂා කිරීම සහ නීතිය බලාත්මක කිරීම

1.4 ජාතික ඖෂධ නියාමන අධිකාරිය යටතේ පවතින අංශ

ජාතික ඖෂධ නියාමන අධිකාරියේ මනා ක්‍රියාකාරිත්වය පිණිස එහි පහත පරිදි අංශ ස්ථාපිත කර ඇත.

1. ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාරය (NMQAL)
2. ඖෂධ නියාමන අංශය
3. මූල්‍ය අංශය
4. පරිපාලන අංශය
5. නීති අංශය
6. අධීක්ෂණ සහ බලාත්මක කිරීමේ අංශය
7. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය
8. මානව සම්පත් අංශය

1.4.1 ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරය (NMQAL)

1.4.1.1 හැඳින්වීම


ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරය (NDQAL) යනු විලවුන්, ඖෂධ උපකරණ සහ ඖෂධ පරීක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකාවේ පිහිටුවා ඇති ජාතික රසායනාගාරයයි. එය 1980 අංක 27 දරණ විලවුන්, උපකරණ සහ ඖෂධ පනත යටතේ නොර්වේජියානු උපදේශන සහ NORAD අරමුදල් මඟින් 1990 දී ස්ථාපිත කරන ලද අතර, ශ්‍රී ලංකාව තුළ පවතින ඉහත නිෂ්පාදනවල ගුණාත්මකභාවය, සුරක්ෂිතභාවය සහ සඵලත්වය සහතික කිරීමේ අරමුණ ඇතිව පිහිටුවා ඇත.

2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරි පනත මඟින් ජාතික ඖෂධ නියාමන අධිකාරිය (NMRA) 2015 ජූලි 1 දින සිට ස්ථාපිත වූ අතර, සෞඛ්‍ය දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වූ ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරය (NDQAL) එම නව අධිකාරිය යටතට පත් කරන ලදී. එබැවින් වර්තමානය වන විට ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරය (NDQAL) ජාතික ඖෂධ නියාමන අධිකාරිය යටතේ ක්‍රියාත්මක වන අතර, එය ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරය (NMQAL) ලෙස නම් කර ඇත.

ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරයෙහි ප්‍රධාන අංශ වන්නේ රසායනික, ක්ෂුද්‍රජීව, ජීව විද්‍යාත්මක, විමර්ශන ප්‍රමිතිය සහ ක්‍රමාංකනය සහ උපකරණ ය. ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරය විසින් සම්මත පරීක්ෂණ ක්‍රියාපටිපාටීන් සහ ගුණාත්මකභාවය සුරක්ෂිතතාවය හා සඵලතාවය තක්සේරු කිරීමේදී පිළිගත් (වලංගු) පරීක්ෂණ ක්‍රියා පටිපාටි අනුගමනය කරයි.

ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරය අවශ්‍ය වන විට අනුමත අතිරේක රස පරීක්ෂකවරයකු ලෙස ක්‍රියා කරයි.

1.4.1.2 ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරයෙහි ආංශික ව්‍යුහය



*Note: due to lack of qualified staff following amendments were made to approved organization Structure.

1. Biological tests are not carried out at present.
2. Staff of former Biological, Ref. Std & Calibration, Devices and Cytosis Division are merged temporarily under the name of 'Biological Division'. Accordingly, Chemical Tests, Physical Tests, Particulate Matter Tests are conducted by this division.

1.4.1.3 ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරයෙහි ප්‍රධාන කාර්යයන්

ඖෂධ, වෛද්‍ය උපකරණ, සීමාසථ නිෂ්පාදන සහ විලවුන් පිළිබඳ තත්ත්ව සහතික කිරීමේ ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික සහය ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂනාගාරය (NMQAL) විසින් සපයයි. ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරයෙහි මූලික කාර්යය වන්නේ නිෂ්පාදනවල ගුණාත්මකභාවය, සුරක්ෂිතතාවය සහ සඵලතාවය අවශ්‍යතාවයන්ට අනුකූලද යන්න තීරණය කිරීම සඳහා අවශ්‍ය රසායනාගාර පරීක්ෂණ පැවැත්වීමයි. ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරයෙහි කාර්යයන් වනුයේ,

- දේශීයව නිෂ්පාදනය කරනු ලබන හා ආනයනය කරනු ලබන ඖෂධ, වෛද්‍ය උපකරණ, සීමාසථ නිෂ්පාදන හා විලවුන් බෙදා හැරීමේ දාමයෙහි විවිධ වූ ස්ථානයන්හිදී විශ්ලේෂණය කිරීම.(පූර්ව හා පශ්චාත් වෙළඳ සමීක්ෂණ අදියරයන්). ලියාපදිංචි නියැදි, පැමිණිලි නියැදි, ටෙන්ඩර් නියැදි, පූර්ව නැවිගත කිරීමේ නියැදි, පූර්ව බෙදාහැරීමේ නියැදි සහ උසාවි මඟින් ලැබෙන නියැදි ලෙස නියැදි පරීක්ෂණාගාරය වෙත ලැබේ. ඊට අමතරව, රජයේ සහ පෞද්ගලික අංශයන් මඟින් සමීක්ෂණ නියැදි රැස් කරනු ලබයි.
- ඖෂධ, වෛද්‍ය උපකරණ සහ සීමාසථ නිෂ්පාදන ලියාපදිංචි කිරීම සඳහා ඇගයීම් කිරීමේදී අවශ්‍ය පරිදි සහ අවශ්‍ය විටදී තාක්ෂණික උපදෙස් ලබා දීම.
- යහපත් නිෂ්පාදන පරිවයන් පරීක්ෂා කිරීම සඳහා සහභාගී වීම.


- බාහිර තත්ත්ව සහතික කිරීමේ ඇගයීම් වැඩසටහන් වලට සහභාගී වීම (ප්‍රවීණතා පරීක්ෂණ)
- තත්ත්ව සහතික කිරීමේ පද්ධතිය පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම
- ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් තීරණය කරන ලද පරිදි දේශීය හෝ විදේශීය රසායනාගාරවල සේවාවන් අවශ්‍ය යැයි සලකන විට ඒවා සම්බන්ධීකරණය කිරීම.

1.4.2 ඖෂධ නියාමන අංශය

1.4.2.1 හැඳින්වීම

නිෂ්පාදනවල සුරක්ෂිත බව, සඵලත්වය, ගුණාත්මක බව හා ඒවායේ මිල පෙරදැරි කරගෙන රෝගීන්ගේ අවශ්‍යතා ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකාව තුළ භාවිතා කරනු ලබන ඖෂධ, වෛද්‍ය උපකරණ හා සීමාස්ථ නිෂ්පාදන නියාමනය කිරීමට අමතරව, ජාතික ඖෂධ නියාමන අධිකාරිය (NMRA) ඖෂධ නිෂ්පාදනය කරනු ලබන කර්මාන්තශාලා සහ දීපව්‍යාප්ත ඖෂධහල් නියාමනය කිරීමටද මැදිහත් වේ. ඖෂධ හා අදාල නිෂ්පාදන වලින් සිදුවන අහිතකර ප්‍රතිඵල අවම කිරීමට ඖෂධ බලපෑම් පිලිබඳ පසු විපරම (Pharmacovigilance) ද අදාළ අංශය මඟින් සිදුකරනු ලබයි.

1.4.2.2 ඖෂධ නියාමන අංශයේ ආංශික ව්‍යුහය



1.4.2.3 ඖෂධ නියාමන අංශයේ කාර්යයන්

ජාතික ඖෂධ නියාමන අධිකාරි පනත යටතේ ඖෂධ, වෛද්‍ය උපකරණ සහ සීමාස්ථ නිෂ්පාදනයන්ට අදාලව පහත සඳහන් දෑ ඇතුළුව සියලුම කාර්යයන් නියාමනය කිරීම;


- ඖෂධ, වෛද්‍ය උපකරණ, විලවුන් සහ සීමාස්ථ නිෂ්පාදන ඇගයීම, ලියාපදිංචි කිරීම සහ ආනයන බලපත්‍ර නිකුත් කිරීම
- දේශීය හා ජාත්‍යන්තර වශයෙන් ඇති ඖෂධ නිෂ්පාදන ස්ථාන නියාමනය කිරීම
- මිල නියාමනය
- දිවයින පුරා පිහිටා ඇති ඔසුසල් නියාමනය කිරීම
- ඖෂධ සුරක්ෂිතතාවය පිළිබඳ අධීක්ෂණය කිරීම (Pharmacovigilance)

1.4.3 මූල්‍ය අංශය

1.4.3.1 හැඳින්වීම

අධිකාරිය තුළ ඇති සියලුම මූල්‍ය ක්‍රියාකාරකම් පාලනය කිරීම මූල්‍ය අංශය මගින් සිදු කෙරේ. ඒ අනුව, සියලුම ආදායම් මූලාශ්‍ර හඳුනාගැනීම, සියළුම අදායම් ලබා ගැනීම සහ මුදල් ප්‍රවාහය ඵලදායී ලෙස හසුරුවා ගැනීම සිදුකරයි. වාර්ෂික අයවැය පුරෝකථනය සකස් කිරීමේදී නියමිත වේලාවට සියලුම වියදම් ඇතුළුව අවසන් ගිණුම් ඉදිරිපත් කිරීම මූල්‍ය අංශයේ ප්‍රධාන කාර්යය වේ. මීට අමතරව, ජාතික ඖෂධ නියාමන අධිකාරියේ අනෙකුත් අංශවල මනා ක්‍රියකරිත්වය සහතික කිරීම සඳහා අවශ්‍ය වන සියලුම ප්‍රසම්පාදන කටයුතු මූල්‍ය අංශය විසින් මෙහෙයවනු ලැබේ.

1.4.3.2 මූල්‍ය අංශයේ ආංශික ව්‍යුහය



1.4.3.3 මුල්‍ය අංශයේ කාර්යයන්

- ආදායම් මාර්ග දහඅටක් මගින් සියලුම ආදායම් ලබා ගැනීම.
- අවසන් ගිණුම් පිළියෙල කිරීම.
- ඉදිරි වර්ෂය සඳහා අයවැය පිළියෙල කිරීම සහ ඒ සඳහා අනුමැතිය ලබාගැනීම.
- අධිකාරියේ එදිනෙදා ක්‍රියාකාරකම් සිදුකරගෙන යාමට අවශ්‍ය කරනු ලබන සියලුම සැපයුම් පවත්වාගෙන යාම
- සියලුම මුදල් පාලන කටයුතු
- ප්‍රසම්පාදන කටයුතු


1.4.4 පරිපාලන අංශය

1.4.4.1 හැඳින්වීම

ජාතික ඖෂධ නියාමන අධිකාරිය ආරම්භයේ සිටම පරිපාලන අංශය අධිකාරිය සඳහා ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. පරිපාලන අංශයේ ප්‍රධාන කාර්යය වන්නේ ඖෂධ නියාමන අංශයේ අනුමැතිය මත සියලුම වර්ගයේ ඖෂධ නිෂ්පාදන සහ විලවුන් නිෂ්පාදන සැපයුම්කරුවන්ට බලපත්‍ර සහ ලියාපදිංචි සහතික නිකුත් කිරීම වේ.

මීට අමතරව, ගොඩනැගිලි නඩත්තු කිරීම, විදුලි උපකරණ අළුත්වැඩියා කිරීම, වාහන කළමනාකරණය, වාර සේවා සහ අළුත්වැඩියා කිරීම, සියලු ආකාරයේ බිල්පත් සහ අනෙකුත් ගෙවීම් සඳහා අනුමැතිය ලබා ගැනීම, නිවාඩු සහ අනෙකුත් කාර්ය මණ්ඩල විධිවිධාන පවත්වාගෙන යාම සහ කාර්ය මණ්ඩල සුබසාධනය ඉහළ නැංවීමට කටයුතු කිරීම සිදු කිරීමයි. එමඟින් අනෙකුත් ආයතන සමඟ ද විධිමත් සන්නිවේදනයක් ඇති කර ගනිමින් තම ගනුදෙනුකරුවන්ට උසස් තත්ත්වයේ සේවාවක් ලබා දීමට අධිකාරියට හැකියාව ලැබේ.

1.4.4.2 පරිපාලන අංශයේ ආංශික ව්‍යුහය



1.4.4.3 පරිපාලන අංශයේ කාර්යයන්

ජාතික ඖෂධ නියාමන අධිකාරියෙහි සියලුම පරිපාලන සහ නඩත්තු කටයුතු ආවරණය වන පරිදි මෙම අංශය ස්ථාපිත කර ඇති අතර විශේෂයෙන් ඖෂධ, වෛද්‍ය උපකරණ සහ සීමාසහිත මායිම් අයිතමවල බලපත්‍ර සහ ලියාපදිංචි සහතික නිකුත් කරයි.
ඒ අනුව, පරිපාලන අංශයේ ක්‍රියාත්මක වන ප්‍රධාන ක්‍රියාකාරකම් පහත පරිදි වේ.

- ඖෂධ ලිපිගොනු ඇගයීමෙන් පසුව නිකුත් කරනු ලබන බලපත් (නිෂ්පාදන සහ ආනයන බලපත්), උපකරණ (නිෂ්පාදන සහ ආනයන බලපත්), නියැදි බලපත් සහ ලියාපදිංචි බලපත් නිකුත් කිරීම (ඖෂධ හා උපකරණ), ලියාපදිංචි සහතික සහ බලපත් යතුරුලියනය සහ ඇගයීම්පත් විද්‍යුත් තැපෑල ඔස්සේ යැවීම.
- බලපත් සහ ලියාපදිංචි සහතික නිකුත් කිරීමේ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම
- අධිකාරිය තුළ පිරිස් කළමනාකරණය
- කාර්යාල පරිශ්‍රය නඩත්තු කිරීමට අදාල සියලුම ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීම
- උපයෝගිතා සේවා පවත්වාගෙන යාම
- අංශයට සම්බන්ධ අදාල වාර්තා පිළියෙල කිරීම
- වාහන සහ ප්‍රවාහන කළමනාකරණය
- කාර්යමණ්ඩලයේ නිවාඩු (රාජකාරි/දේශීය/විදේශීය) සම්බන්ධයෙන් ඇති කටයුතු සම්බන්ධීකරණය කිරීම.
- ස්ථීර සහ පුහුණු කාර්යමණ්ඩලයේ පැමිණීම සහතික කිරීම
- අධිකාරිය සඳහා බාහිර පාර්ශවයන් වෙතින් අවශ්‍ය කරනු ලබන ආරක්ෂක, පවිත්‍රතා, විදුලිය, විදුලි සෝපාන සේවා, වායුසමීකරණ, ඡායා පිටපත් ආදී සේවාවන් ලබාගැනීම සහ සියලුම බිල්පත් ගෙවීම් සිදුකිරීම
- බාහිර සහ අභ්‍යන්තර ලේඛනාගාර අධීක්ෂණය කිරීම
- කාර්යමණ්ඩලය සඳහා හැඳුනුම්පත් නිකුත් කිරීම

1.4.5 නීති අංශය


1.4.5.1 හැඳින්වීම

2017 අප්‍රේල් 21 දින සිට ක්‍රියාත්මක වන පරිදි ස්ථාපිත කරන ලද නීති අංශය, ජාතික ඖෂධ නියාමන අධිකාරිය පාර්ශවකරුවෙකු වන සියලුම නඩු කටයුතු ඇතුළුව සියලුම නීතිමය සහ නියාමන ගැටළු සම්බන්ධයෙන් අධිකාරියට උපදෙස් ලබා දීමේදී ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි.

ජාතික ඖෂධ නියාමන අධිකාරියෙහි නියාමන කාර්යයන් සඳහා නීති අංශයේ කාර්යභාරය අවශ්‍යවේ.

2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරි පනත සහ ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් සෘජුව සම්බන්ධවී සිදු කරනු ලබන අනෙකුත් නියාමන කටයුතු වලදී නීති ප්‍රකාරව නීතිමය අදහස් ලබාදීම නීති අංශය සතු වගකීම වේ.

1.4.5.2 නීති අංශයේ ආංශික ව්‍යුහය



1.4.5.3 නීති අංශයේ ප්‍රධාන කාර්යයන්

- ගිවිසුම්, ගැසට් පත්‍ර, අමාත්‍ය මණ්ඩල සංදේශය, අවබෝධතා ගිවිසුම් සහ වෙනත් නීතිමය ලියකියවිලි කෙටුම්පත් කිරීම.
- ප්‍රාථමික සහ ද්විතීයික නීති සංශෝධනය කිරීම, උපදෙස් දීම සහ සමාලෝචනය කිරීම.

  උදා: නීති, රීති, රෙගුලාසි, මාර්ගෝපදේශ සහ සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටි සැකසීම ජාතික ඖෂධ නියාමන අධිකාරියෙහි නීති අංශයේ වගකීම් සහ කාර්යයන් වේ.

- නියෝජිතායතන පැවරුම් කටයුතු සහ නීති අංශයට අදාළ වෙනත් ඕනෑම කරුණක් සඳහා අයදුම්පත් සැකසීම, අධීක්ෂණය සහ උපදේශන කටයුතු සිදුකිරීම.

- ජාතික ඖෂධ නියාමන අධිකාරියෙහි අනෙකුත් අංශ මෙන්ම බලපත්‍රලාභීන්, පාර්ශ්වකරුවන්, අමාත්‍යාංශ/ කොට්ඨාශ සහ වෙනත් සංසද මගින් යොමු කරනු ලබන කරුණු සම්බන්ධයෙන් නීති අංශය නීතිමය අදහස් ලබාදීම.
- පාර්ලිමේන්තු කටයුතු සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගැනීම.
- 2015 අංක 05 දරණ ජාතික ඖෂධ නියාමන අධිකාරී පනත යටතේ විවිධ නියාමන කරුණු සහ නීතිමය කටයුතු ආරම්භ කිරීමට අවශ්‍ය වන අවස්ථා වලදී නීති අංශය විසින් අධිකාරියට අවශ්‍ය උපදෙස් ලබාදීම.
- ජාතික ඖෂධ නියාමන අධිකාරිය කොටස්කරුවකු වන ශ්‍රේෂ්ඨාධිකරණය, අභියාචනාධිකරණය, මහේස්ත්‍රාත් අධිකරණය, වාණිජ මහාධිකරණය, මහාධිකරණය, කම්කරු විනිශ්චය සභාව සහ මානව හිමිකම් කොමිෂන් සභාව, තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ කොමිෂන් සභාව වැනි නීති උසාවිවල ගොනු කරන ලද නඩු කටයුතු හැසිරවීම සඳහා වගකිව යුතුය.
- අවශ්‍ය අවස්ථාවලදී ඕනෑම කොමිෂන් සභාවක විමර්ශන/ CID විමර්ශන සඳහා සහභාගී වීම.
- 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනත යටතේ ලැබෙන සියලුම අයදුම්පත් පිළිබඳ කටයුතු කිරීම.
- අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සම්බන්ධීකරණය කිරීම.
- නීති අංශයට අදාළ වෙනත් ඕනෑම රාජකාරීන්.

1.4.6 අධීක්ෂණ සහ බලාත්මක කිරීමේ අංශය


1.4.6.1 හැඳින්වීම

අධීක්ෂණ සහ බලාත්මක කිරීමේ අංශය යනු 2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරී පනත යටතේ ජාතික ඖෂධ නියාමන අධිකාරියේ පිහිටුවා ඇති අංශයකි.

ජාතික ඖෂධ නියාමන අධිකාරියේ (NMRA) අධීක්ෂණ හා බලාත්මක කිරීමේ අංශයේ ප්‍රධාන කාර්යය වන්නේ අධිකාරිය විසින් බලය පවරනු ලබන සහ විධානය කරනු ලබන පරිදි අධිකාරී පනතේ විධිවිධාන යථාපරිදි ක්‍රියාවට නැංවීමට අදාළ ගැටලු අධීක්ෂණය සහ විමර්ශනය කිරීමයි. මෙම කාර්යයන් ඉටු කිරීම පිණිස ගරු ඇමතිතුමා විසින් ජාතික ඖෂධ නියාමන අධිකාරිය (NMRA) පනත යටතේ බලයලත් නිලධාරීන් වශයෙන් ජ්‍යෙෂ්ඨ ආහාර හා ඖෂධ පරීක්ෂණ නිලධාරීන් තිදෙනෙකු මෙම අංශයට පත්කර ඇත. මේ වනවිට මෙම අංශය මෙහෙයවනු ලබන්නේ ප්‍රධාන ආහාර හා ඖෂධ පරීක්ෂක (CFDI) විසිනි.

ආහාර හා ඖෂධ පරීක්ෂණවරුන් අනිකුත් පුද්ගලයින් සමග නිරන්තරයෙන් සම්බන්ධතා පවත්වා ගැනීමට අවශ්‍ය කරනු ලබන රාජකාරී කටයුතු ඉටු කිරීමට වැඩිපුරම ක්ෂේත්‍රයේ සේවය කළ යුතු නිසා ඔවුන් ක්ෂේත්‍ර නිලධාරීන් වශයෙන් සලකනු ලැබේ.

1.4.6.2 අධීක්ෂණ සහ බලාත්මක කිරීමේ අංශයේ ආංශික ව්‍යුහය



1.4.6.3 අධීක්ෂණ සහ බලාත්මක කිරීමේ අංශයේ කාර්යයන්


- ජාතික ඖෂධ නියාමන අධිකාරිය (NMRA) පනත යටතේ බලයලත් නිළධාරීන් ලෙස කටයුතු කිරීම
- පශ්චාත් අලෙවි සමීක්ෂණ පැවැත්වීම
- අවශ්‍ය වූ විටෙකදී විධිමත් සහ අවිධිමත් ලෙස නියැදි ලබාගැනීම
- බලපත් නිකුත් කිරීම පිණිස ඖෂධ සම්බන්ධයෙන් කටයුතු කරන ආයතන පරීක්ෂා කිරීම සහ එම ආයතන නිර්දේශ කිරීම
- බලපත් නිකුත් කිරීම පිණිස ඖෂධ ප්‍රවාහනය කරන වාහන පරීක්ෂා කිරීම සහ එම වාහන නිර්දේශ කිරීම
- නිෂ්පාදන ආපසු කැඳවීමේ ක්‍රියාපටිපාටීන් ක්‍රියාත්මක කිරීමට වගබලා ගැනීම
- SSFFC විසින් සහ හොර බඩු ජාවාරම්වලින් රඳවාගනු ලැබූ ඖෂධ නිෂ්පාදන සම්බන්ධයෙන් විමර්ශන පැවැත්වීම සහ නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කිරීම
- පෞද්ගලික වෙළඳපොලේ රජයට අයත් ඖෂධ ලබාගැනීමේ හැකියාව විමර්ශනය කිරීම
- අන්තරායකර ඖෂධ යෙදවුම් පරීක්ෂා කිරීම සහ නිර්දේශ කිරීම
- අධ්‍යාපනික වැඩසටහන් සංවිධානය කිරීම හා පැවැත්වීම
- පනත යටතේ සිදුකරනු ලැබූ උල්ලංඝණය කිරීම්වලට එරෙහිව චෝදනා ඉදිරිපත් කොට කටයුතු කිරීම
- නීතිය බලාත්මක කිරීමේ අනිකුත් නියෝජිතායතන සමඟ සම්බන්ධීකරණය සහ සහයෝගයෙන් කටයුතු කිරීම

1.4.7 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ (ICT) අංශය

1.4.7.1 හැඳින්වීම

තොරතුරු හා සන්නිවේදන අංශය 2019 දී ආරම්භ කරන ලද අතර එක් සංවර්ධන නිලධාරියෙකු සහකාර අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ)ගේ අධීක්ෂණය යටතේ රාජකාරි කටයුතු සිදු කරයි. ස්වයංක්‍රියකරණ ක්‍රියාවලියට (e-NMRA) සමගාමීව, 2019 ඔක්තෝම්බර් මාසයේදී සහකාර අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ) බඳවා ගන්නා ලදී. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශයේ දැක්ම වනුයේ ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ව්‍යාපාර සහ සේවා සපුරාලීම සඳහා කාර්යක්ෂම, ආරක්ෂිත, විශ්වාසනීය සහ තිරසාර තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සැපයීමයි. ප්‍රාදේශීය ජාලකරණය (LAN), පරිගණක දෘඩාංග සහ මෘදුකාංග කළමනාකරණය, දත්ත පද්ධතිය, වෙබ් අඩවිය සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ප්‍රසම්පාදන පරිපාලනය ඇතුළු කටයුතු සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය වගකිව යුතු අතර, අවශ්‍ය පරිදි තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ව්‍යාපෘති කළමනාකරණය සම්බන්ධයෙන්ද ක්‍රියා කරයි. පවත්නා ජාලය පුළුල් කරමින් ආයතනයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා දත්ත මධ්‍යස්ථානයක් ක්‍රියාත්මක කිරීමට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය සැලසුම් කරනු ලබයි. සපයනු ලබන සේවාවන්හි විනිවිදභාවය, ප්‍රතිචාර දැක්වීම සහ වගවීම වැඩිදියුණු කිරීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය සැලසුම් කරයි. මෙම කාර්යයන් ඉටු කිරීමේදී ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොමැතිකම අංශය මුහුණපානු ලබන ප්‍රධාන ගැටලුව වන අතර නව කාර්ය මණ්ඩලය බඳවා ගැනීම මඟින් මෙම ගැටලුව මඟහරවා ගැනීමට හැකියාව පවතී.

1.4.7.2 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශයේ ආංශික ව්‍යුහය




1.4.8 මානව සම්පත් අංශය

1.4.8.1 හැඳින්වීම

ජාතික ඖෂධ නියාමන අධිකාරියේ මානව සම්පත් අංශය අධිකාරියට කාර්ය මණ්ඩලය බඳවා ගැනීම්, සංවර්ධනය, රඳවා තබා ගැනීම සහ සේවයෙන් ඉවත් කිරීම යන ක්‍රියාවලීන් හසුරුවනු ලබයි. ඒ අනුව අධිකාරියේ අරමුණු කාර්යක්ෂමව හා ඵලදායි ලෙස සාක්ෂාත් කර ගැනීම සඳහා සේවක පිරිස උපරිම ලෙස යොදා ගැනීම අංශයේ අරමුණ වේ.

1.4.8.2 මානව සම්පත් අංශයේ ආංශික ව්‍යුහය



2 වන පරිච්ඡේදය

ප්‍රගතිය සහ දැක්ම

අර්ධ රාජ්‍ය, විශේෂිත ඖෂධ නියාමන අධිකාරියක් ස්ථාපිත කිරීමේ රජයේ ප්‍රතිපත්තිමය තීරණයක් ලෙස, 2015 අංක 05 දරණ ජාතික ඖෂධ නියාමන අධිකාරි පනත මඟින් ජාතික ඖෂධ නියාමන අධිකාරිය පිහිටුවන ලදී. එහි වගකීම වන්නේ සුරක්ෂිතබව, සඵලත්වය, ගුණාත්මකභාවය සහ මිල කරණය සලකමින් මහජනතාවගේ වුවමනාවන් සාක්ෂාත් කිරීම පිණිස ඖෂධ නිෂ්පාදන (ඖෂධ, වෛද්‍ය උපකරණ සහ විලවුන්) නියාමනය කිරීමයි.

අධිකාරිය පිහිටුවනු ලැබූ මුල් වර්ෂවලදී එහි අරමුණු සාක්ෂාත් කිරීමේදී බොහෝ අඩුලුහුඬුකම් තිබුණි. එසේ තිබියදී වුවද රට වෙනුවෙන් විශිෂ්ඨ සේවයක් ලබාදීමට ජාතික ඖෂධ නියාමන අධිකාරියට හැකිවිය.

2.1 ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරයේ (NMQAL) ප්‍රගතිය

2021 වර්ෂයේ කාර්යභාර්ය:

ISO 17025 තත්ත්ව සහතිකය ලබා ගැනීම සඳහා SLAB මූලික තක්සේරුව (මාර්ගගතව) සිදු කරන ලදී.

උපදේශකයෙකු විසින් ISO 9001 මූලික විගණනය පවත්වන ලදී.

NMQAL කාර්ය මණ්ඩලය සඳහා පහත සඳහන් පුහුණු වැඩසටහන් සැලසුම් කර පවත්වන ලදී. සියලුම පුහුණු වැඩසටහන් මාර්ගගත ක්‍රමය ඔස්සේ (virtual meeting) සිදු කරන ලදී.

- ක්‍රම තහවුරු කිරීම - 2021 ජනවාරි 01 සිට 08 දක්වා - WHO උපදේශක විසින් පවත්වන ලදී
- ක්‍රම තහවුරු කිරීම - 2021 ජනවාරි 2 සිට 12 දක්වා - WHO උපදේශක විසින් පවත්වන ලදී
- NMQAL හි පරීක්ෂණ කටයුතු බාහිරින් ලබා ගැනීම - WHO උපදේශක විසින් පවත්වන ලදී
- ඖෂධ නිෂ්පාදනවල තත්ත්ව පාලනය සහ යොමු ලේඛණ සකස් කිරීම - WHO උපදේශක විසින් පවත්වන ලදී
- ප්‍රධාන කාර්යසාධන දර්ශක - WHO උපදේශක විසින් පවත්වන ලදී
- යහපත් නිෂ්පාදන පිළිවෙත් (GMP) පරීක්ෂණ - WHO උපදේශක විසින් පවත්වන ලදී

අනාගතය සඳහා සැලසුම්:

1) විවිධ විද්‍යාත්මක පසුබිම් සහ ඉහළ සුදුසුකම්ලත් කාර්යක්ෂම තාක්ෂණික කාර්යමණ්ඩයලක් හා අනිකුත් සහයක කාර්යමණ්ඩලයක් බඳවා ගැනීම.
2) ජාතික ඖෂධ නියාමන අධිකාරියේ සංවිධාන ව්‍යුහයට ගැළපෙන පරිදි ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාරයේ සංවිධාන ව්‍යුහයක් පිළියෙල කිරීම.
3) පශ්චාත් අලෙවිකරණ අදියරේදී නියැදි වැඩි ප්‍රමාණයක් විශ්ලේෂණය කිරීම නැවත ආරම්භ කිරීම.
4) දේශීය නියෝජිතයින් විසින් ලබාදෙන සහයෝගය ප්‍රමාණවත් නොවන නිසා නවීන හා ඉහළ සංවේදිතාවකින් යුත් විශ්ලේෂක උපකරණ නඩත්තු කිරීමේ ක්‍රියාපටිපාටියක් පිළියෙල කිරීම.
5) ජාතික ඖෂධ නියාමන අධිකාරියේ සියලුම විද්‍යාගාර අවශ්‍යතා සඳහා (උපකරණ, රසායනික ද්‍රව්‍ය, ද්‍රාවණ, ප්‍රතිකාරක, මූලික හා අනිකුත් ප්‍රමිතීන්, වීදුරු භාණ්ඩ හා අනිකුත් උපාංග ආදිය) ප්‍රසම්පාදනය කිරීම පිණිස වෙනම ප්‍රසම්පාදන ඒකකයක් ස්ථාපනය කිරීම.
6) වඩාත් හොඳ සේවයක් ලබාදීම පිණිස අභ්‍යන්තර සන්නිවේදනය/ක්‍රියාපටිපාටීන්/සහයෝගය ශක්තිමත් කිරීම.
7) ISO 17025 පිළිගැනීම සාක්ෂාත් කරගැනීම සඳහා සහ/හෝ ලෝක සෞඛ්‍ය සංවිධානයේ පූර්ව සුදුසුකම් තත්ත්වය ලබාගැනීම පිණිස විද්‍යාගාර ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීම.

අංශයේ කාර්ය සාධනය:

2021 වසර තුළ ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරය විසින් සාම්පල 389ක් පමණ විශ්ලේෂණය කර සාම්පල/කාණ්ඩ 86ක අසාර්ථක වීම් අනාවරණය වී ඇති අතර ඒ අනුව අසාර්ථකවීම් පිළිබඳ නිර්දේශ ලබා දෙන ලදී.

SDG සාක්ෂාත් කර ගැනීම සඳහා කාර්ය සාධනය:

2021.01.01 - 2021.12.31

නියැදි වර්ගය	සමත්	අසමත් රඳවා ගැනීම්/ ආපසු ගැනීම්	දැනටමත් ආපසු ගැනීම්	සිදු නොකරන ලද	එකතුව
පැමිණිලි	57	39	2	35	133
විධිමත්	25	10	-	52	87
අවිධිමත්	44	3	-	5	52
රසායනාගාර ඉල්ලීම්	7	3	-	-	10
නිශ්. ඉල්ලීම	1	-	-	-	1
ලියාපදිංචි කිරීම	36	8	-	-	44
SPC ටෙන්ඩරය	5	1	-	4	10

වෙනත්	27	14	-	-	41
වැටලීම්	83	8	-	-	91
අත් පිරිසිදුකාරක දියර					16
	285	**86**	**2**	**96**	**485**

නිකුත් කරන ලද තත්ත්ව සහතිකයේ ගණන = 485-96

= 389

නිකුත් කළ අසාර්ථක වාර්තාවේ සංඛ්‍යාව = 86

2020 දී නිකුත් කළ වාර්තා අතරින් අසාර්ථක වූ වාර්තා ප්‍රතිශතය (%). = 22

2.2 ඖෂධ නියාමන අංශයේ ප්‍රගතිය

ඖෂධ නියාමන අංශය උප අංශ වලින් සමන්විත වේ; එනම් ඖෂධ නියාමන අංශය, වෛද්‍ය උපකරණ නියාමන අංශය, විලවුන් නියාමන අංශය, සීමාස්ත නිෂ්පාදන නියාමන අංශය, නිෂ්පාදන නියාමන අංශය, ඔසුසල් නියාමන අංශය, ඖෂධ සුරක්ෂිතතාවය පිළිබඳ අධීක්ෂණ අංශය, මිල නියාමන ඒකකය, සායනික පරීක්ෂණ නියාමන අංශය, HS කේත නිෂ්කාශන අංශය, තොරතුරු,අධ්‍යාපන, සන්නිවේදන සහ පර්යේෂණ අංශය, පාලන සහ ප්‍රචාරණ ඒකකය, සහ QMS ඒකකය ලෙසය.
ජාතික ඖෂධ නියාමන අධිකාරියෙහි වගකීම් ඉටු කිරීම සඳහා බහුවිධ රැකියා භූමිකාවන් සහිත නියාමන කටයුතු සිදු කරනු ලබන ඖෂධවේදීන් විසින් උපරිම කාර්යක්ෂමතාවයෙන් යුතුව දෛනික රාජකාරි ඉටු කරනු ලබයි.

අනාගතය සඳහා සැලසුම්:

1) කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා සමාන රැකියා භූමිකාවන් සහිත කණ්ඩායම් නිර්මාණය කිරීම සඳහා අංශ වල අනුකොටසක් හඳුන්වා දීම
2) අදාළ අංශවල කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා සහ වැඩි පිරිසැකසුම් කිරීම අවම කිරීම සඳහා ඉලෙක්ට්‍රොනික පද්ධති අවශ්‍යතා සපුරාලීම.

2.2.1 ඖෂධ නියාමන අංශය

ඖෂධ ලේඛන ගොනු ඇගයීම

අයදුම්පත් වර්ගය	ලැබුණු අයදුම්පත් ගණන	ඇගයීමට ලක් කළ අයදුම්පත් ගණන
නව ඖෂධ අයදුම්පත්	239	562
MEDREG අයදුම්පත්	413	
නැවත ලියාපදිංචි කිරීමේ අයදුම්පත්	125	
අතිරේක ඇගයීම් පත්‍ර (Additional)	1251	

MEC ප්‍රමාණය - ලේඛන ඇගයීම සඳහා අනුකමිටු රැස්වීම්

මුළු ඇගයීම් ලිපි ලේඛන	MEC - අනු කමිටුව විසින් සමාලෝචනය කරන ලද අයදුම්පත් ගණන
682	682

New Molecular Entity (NME) සඳහා වන අයදුම්පත් සමාලෝචනය

(NME) සඳහා ලැබුණු මුළු අයදුම්පත්	සමාලෝචනය කර අනුමත කරන ලද අයදුම්පත් ගණන	සමාලෝචනය කර ප්‍රතික්ෂේප කරන ලද අයදුම්පත් සංඛ්‍යාව
69	46	23

පුද්ගලික භාවිතය සඳහා අවසර ලබාදීමට අයදුම්පත් ඇගයීම

පුද්ගලික පරිශීලක අවසර ලිපි සඳහා ලැබුණු මුළු අයදුම්පත්	සමාලෝචනය කර අනුමත කරන ලද අයදුම්පත් ගණන	සමාලෝචනය කර ප්‍රතික්ෂේප කරන ලද අයදුම්පත් සංඛ්‍යාව
145	136	09

නියැදි ආනයන බලපත්‍ර සඳහා වන අයදුම්පත් ඇගයීම

නියැදි ආනයන බලපත්‍රය සඳහා ලැබුණු අයදුම්පත් ගණන	සමාලෝචනය කර අනුමත කරන ලද අයදුම්පත් ගණන (29.5.2021 සිට)	සමාලෝචනය කර ප්‍රතික්ෂේප කරන ලද අයදුම්පත් සංඛ්‍යාව.
693	633	60

පවත්වන ලද MEC රැස්වීම් ගණන = 10 (ලුහුඩු සටහන් 10ක් ලියා ඇත.)

MEC අනුකමිටු සංඛ්‍යාව - අනු කමිටු 13

පාලිත ද්‍රව්‍ය (Controlled Substances) සඳහා ආනයන අවසර ලබා ගැනීම සඳහා වන අයදුම්පත්

ලැබුණු අයදුම්පත් ගණන	ඇගයීමට ලක් කර අනුමත කර ඇති මුළු අයදුම්පත් සංඛ්‍යාව	ඇගයීමට ලක් කර ප්‍රතික්ෂේප කරන ලද මුළු අයදුම්පත් සංඛ්‍යාව
125	125	0

පුද්ගලික රෝහල් වල අන්තරායකර ඖෂධ මාසික කෝටාව අනුමත කරන ලෙස ඉල්ලීම්

ලැබුණු අයදුම්පත් ගණන	නැවත සමාලෝචනය කර අනුමත කරන ලද අයදුම්පත් ගණන	නැවත සමාලෝචනය කර ප්‍රතික්ෂේප කරන ලද අයදුම්පත් සංඛ්‍යාව.
34	34	0

පුද්ගලික රෝහල් වල අන්තරායකර ඖෂධ හැසිරවීමට බලයලත් පුද්ගලයාගේ අනුමැතිය ඉල්ලා සිටීම

ලැබුණු අයදුම්පත් ගණන	සමාලෝචනය කර අනුමත කරන ලද අයදුම්පත් ගණන	සමාලෝචනය කර ප්‍රතික්ෂේප කරන ලද අයදුම්පත් සංඛ්‍යාව
23	23	0

ලියාපදිංචිය අත්හැරීම් ලිපි (Waiver of registration) නිකුත් කිරීම

සමාලෝචනය සඳහා WOR රැස්වීම් ගණන WOR යෙදුම් =

ලැබුණු මුළු අයදුම්පත් සංඛ්‍යාව	සමාලෝචනය කර අනුමත කරන ලද සම්පූර්ණ අයදුම්පත් සංඛ්‍යාව	සමාලෝචනය කර ප්‍රතික්ෂේප කරන ලද සම්පූර්ණ අයදුම්පත් සංඛ්‍යාව
351	254	97

තත්ත්ව අසාර්ථක වාර්තා සමාලෝචනය

ලැබුණු NMQAL වාර්තා ගණන	අදාළ පාර්ශවකරුවන්ට දැනුම් දුන් ගණන	පොරොත්තු ගණන
65	65	0

නැවතත කිරීම් නිෂ්කාශන අනුමැතිය සඳහා අයදුම්පත් සමාලෝචනය

ලැබුණු අයදුම්පත් ගණන	සමාලෝචනය කර අනුමත කරන ලද අයදුම්පත් ගණන	සමාලෝචනය කර ප්‍රතික්ෂේප කරන ලද අයදුම්පත් සංඛ්‍යාව
55	55	0

ලියාපදිංචි සහතික සහ ආනයන බලපත්‍රය දීර්ඝ කිරීම

ලැබුණු අයදුම්පත් ගණන	සමාලෝචනය කර අනුමත කරන ලද අයදුම්පත් ගණන	සමාලෝචනය කර ප්‍රතික්ෂේප කරන ලද අයදුම්පත් සංඛ්‍යාව
3892	2355	1537

ආනයන බලපත්‍රය දීර්ඝ කිරීම

ලැබුණු අයදුම්පත් ගණන	සමාලෝචනය කර අනුමත කරන ලද අයදුම්පත් ගණන	සමාලෝචනය කර ප්‍රතික්ෂේප කරන ලද අයදුම්පත් සංඛ්‍යාව
4067	3742	325

ඖෂධ දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම.

පරිපාලකගෙන් ලැබුණු ලියාපදිංචි සහතික ගණන	දත්ත පද්ධතියට ඇතුළත් කළ සහතික ගණන
1336	1336

2.2.2 වෛද්‍ය උපකරණ නියාමන අංශය

නියැදි ආනයන බලපත්‍ර අයදුම්පත්

ලැබුණු මුළු අයදුම්පත් ගණන	අනුමත කරන ලද මුළු අයදුම්පත් ගණන	ප්‍රතික්ෂේප කරන ලද මුළු අයදුම්පත් සංඛ්‍යාව
873	477	396

වෛද්‍ය උපකරණ අයදුම්පත්

ලැබුණු මුළු අයදුම්පත් ගණන	ඇගයීමට ලක් කළ මුළු අයදුම්පත් ගණන	තීරණ
නව - 259 නැවත ලියාපදිංචි කිරීම - 101 අලුත් කිරීම - 826	නව - 681 නැවත ලියාපදිංචි කිරීම - 63 අලුත් කිරීම - 375	FR - 207 PR - 777 RJ - 58 දත්ත ප්‍රමාණවත් නොවන (Awaiting)- 103 සහතික සංශෝධනය - 56

ලියාපදිංචිය අත්හැරීම

ලැබුණු මුළු අයදුම්පත් ගණන	අනුමත කරන ලද මුළු අයදුම්පත් ගණන	ප්‍රතික්ෂේප කරන ලද මුළු අයදුම්පත් සංඛ්‍යාව
1312	766	546

සහතිකය / බලපත්‍ර කාලය දිගු කිරීම්

ලැබුණු මුළු අයදුම්පත් ගණන	මුළු සහතික / බලපත්‍ර දීර්ඝ කිරීම්
2357	1724

ඖෂධවේදීන්	ඇගයුම් කරන ලද අයදුම්පත් ගණන						
	වෛද්‍ය උපකරණ අයදුම්පත්			නියැදි ආනයන බලපත්‍ර අයදුම්පත්	WORs	A/T ගොනු	සහතිකය / බලපත්‍ර දිගු කිරීම්
	නව	RR	අලුත් කිරීම				
P3	46	02	45	NIL	N/A	-	
P8	49	03	18	-	1312	-	
P7	84	10	47	831	-		
P27	84	05	37	-	-	-	
P25	30	04	56	-	-	-	
P24	93	05	22	-	-	-	
P9	75	09	19	05	-	-	
P33	74	10	57	24	-	-	
P39	60	01	NIL	13	-	-	-
P37	12	01	11			-	
P28	75	16	63	-	-	-	

2.2.3 විලවුන් නිෂ්පාදන නියාමන අංශය

යෙදුම් වර්ගය	ලද ලිපිගොනු ගණන	ඇගයීමට ලක් කල මුළු සංඛ්‍යාව
2021 වසරේදී ලද මුළු අයදුම්පත්	4232	4035
ලද මුළු නව අයදුම්පත්	2413	2367
ලද මුළු අලුත් කිරීමේ අයදුම්පත්	1681	1530
ලද නැවත ලියාපදිංචි කිරීමේ අයදුම්පත්	138	138

අයදුම්පත් වර්ගය	ලබා දී ඇති ලියාපදිංචි වර්ග	ඇගයීමට ලක් කළ අයදුම්පත් ගණන	වසර තුළ ඇගයීමට ලක් කළ මුළු අයදුම්පත්
නව අයදුම්පත්	තාවකාලික ලියාපදිංචිය	1940	2367
	සම්පූර්ණ ලියාපදිංචිය	-	
	දත්ත බලාපොරොත්තුවෙන් සිටින (Awaiting Data)	394	
	ප්‍රතික්ෂේප කල	33	
අලුත් කිරීමේ අයදුම්පත්	තාවකාලික ලියාපදිංචිය	710	1530
	සම්පූර්ණ ලියාපදිංචිය	634	
	දත්ත බලාපොරොත්තුවෙන් සිටින	170	
	ප්‍රතික්ෂේප කල	16	
නැවත ලියාපදිංචි අයදුම්පත්	තාවකාලික ලියාපදිංචිය	67	138
	සම්පූර්ණ ලියාපදිංචිය	53	
	දත්ත බලාපොරොත්තුවෙන් සිටින	13	

2.2.4 සිමාස්ථ නිෂ්පාදන නියාමන අංශය

2021 වසරේදී සිමාස්ථ නිෂ්පාදන නියාමන අංශයේ කාර්ය සාධනය

සිමාස්ථ නිෂ්පාදන නියාමන අංශයේ කාර්ය සාධනය	
නව අයදුම්පත් වර්ගීකරණය	
2021 වර්ෂයේදී පිළිගත් වර්ගීකරණ අයදුම්පත් ගණන	232
2021 වර්ෂයේ නිකුත් කරන ලද වර්ගීකරණ වාර්තා ගණන	57
2022.05.19 දිනට නිකුත් කරන ලද වර්ගීකරණ වාර්තා සංඛ්‍යාව (2021 වර්ෂයේ පිළිගත් අයදුම්පත් වලින් පමණි)	153
2021 වර්ෂයේදී ප්‍රතික්ෂේප කරන ලද වර්ගීකරණ අයදුම්පත්‍ර ගණන	9
ලියාපදිංචි අයදුම්පත්	
2021 වර්ෂයේදී පිළිගත් ලියාපදිංචි අයදුම්පත් ගණන	45
2021 වර්ෂයේ නිකුත් කරන ලද ලියාපදිංචි ඇගයීම් වාර්තා ගණන	48
2021 වර්ෂයේදී ප්‍රතික්ෂේප වූ මුළු ලියාපදිංචි අයදුම්පත් සංඛ්‍යාව	4
තොග නිෂ්කාශන ඉල්ලීම	
2021 දී ඉදිරිපත් කරන ලද තොග නිෂ්කාශන ඉල්ලීම් ගණන	42
2021 දී නිකුත් කරන ලද තොග නිෂ්කාශන ගණන	29
තොග නිෂ්කාශන ඉදිරිපත් කිරීම් සංඛ්‍යාව ප්‍රතික්ෂේප විය	13
නියැදි ආනයන බලපත්‍ර	
ඉදිරිපත් කළ නියැදි ආනයන බලපත්‍ර ගණන	54
නිකුත් කරන ලද නියැදි ආනයන බලපත්‍ර ගණන	64
නියැදි ආනයන බලපත්‍ර ගණන ප්‍රතික්ෂේප වීම්	28

2.2.5 නිෂ්පාදන නියාමන අංශය (MFRD)

1) දේශීය නිෂ්පාදකයින්ගේ GMP පරීක්ෂාව

ඖෂධ නිෂ්පාදකයන් - 23

උපකරණ නිෂ්පාදකයින් - 48

විලවුන් නිෂ්පාදකයින් - 103

එකතුව - 174

සැ.යු: එකම නිෂ්පාදකයාගේ පසු විපරම් පරීක්ෂන ඇතුළත් වේ

2) විදේශීය නිෂ්පාදන ආයතන අනුමත කිරීම සඳහා අයදුම්පත්

ලද අයදුම්පත් ගණන	- 51
අනුමත ගණන	- 41
ඌන දත්ත/GMP පරීක්ෂාව අපේක්ෂාවන්	- 09
ප්‍රතික්ෂේපිත ගණන	- 04

3) සකස් කිරීමේ අනුමැතිය

ලද අයදුම්පත් ගණන	- 540
අනුමත ගණන	- 533
ප්‍රතික්ෂේපිත ගණන	- 7

4) සහතික සහ බලපත්‍ර සැකසීම

i) GMP සහතික	- 34
ii) නොමිලේ විකුණුම් සහතික	-12
iii) ඖෂධ නිෂ්පාදන පිළිබඳ සහතික	-03
iv) නිෂ්පාදන බලපත්‍ර	-288
v) දේශීය නිෂ්පාදකයින් සඳහා අවශ්‍ය ද්‍රව්‍ය සහ උපකරණ රේගු නිෂ්කාශනය සඳහා පැහැදිලි කිරීමේ ලිපි	-289

5) මාර්ගෝපදේශ ප්‍රකාශණය

i. විදේශීය නිෂ්පාදන කම්හලක් අනුමත කිරීම පිළිබඳ මාර්ගෝපදේශය

6) ප්‍රමිතිගත මෙහෙයුම් ක්‍රියාපටිපාටි (SOPs) සකස් කිරීම

නිෂ්පාදන නියාමන අංශය සඳහා වාර්ෂික පුහුණු සැලැස්ම සකස් කිරීම

2.2.6 මිල නියාමන ඒකකය

නිමැවුම් සහ බෙදාහැරීම
<u>**ලේඛන**</u> ලද ඇගයීම් පත්‍රිකා ගණන - 232 පරිපාලන අංශයෙන් ලද ලිපි ලේඛන ගණන- 112 සමාලෝචනය කරන ලද සම්පූර්ණ අයදුම්පත් (නව/නැවත ලියාපදිංචි/අතිරේක ඇගයීම්පත්) - අයදුම්පත් 516යි. (අභියාචනා සහ විමසුම් ඇතුළුව) අනුමත අයදුම්පත් - 319 යි. උපරිම සිල්ලර මිල සාකච්ඡා කිරීම සඳහා දේශීය නියෝජිතයන් සමඟ සාකච්ඡා මට්ටම යටතේ අයදුම්පත් 25 යි. වැඩ අවසන් නොකරන ලද ලේඛන- අයදුම්පත් 25යි. <u>**ආනයන බලපත්‍ර.**</u> සමාලෝචනය කරන ලද සම්පූර්ණ අයදුම්පත් - අයදුම්පත් 130 යි. කමිටුව විසින්අනුමත කරන ලද - අයදුම්පත් 95 යි උපරිම සිල්ලර මිල සාකච්ඡා කිරීම සඳහා දේශීය නියෝජිතයන් සමඟ සාකච්ඡා මට්ටම යටතේ අයදුම්පත් 35 යි

2.2.7 සායනික පරීක්ෂණ නියාමන අංශය

සායනික පරීක්ෂණ ඇගයීම් කමිටුව (CTEC) පවත්වන ලද රැස්වීම් ගණන : 12

ඉලක්කය: වසරකට අවම වශයෙන් රැස්වීම් 10 ක් (ඉලක්කය සපුරා ඇත)

සමාලෝචනය සඳහා ඉදිරිපත් කරන ලද සායනික අත්හදා බැලීම් අයදුම්පත් වල සාරාංශය

2021.01.01 සිට 2021.12.31 දක්වා ලද මුළු අයදුම්පත් සංඛ්‍යාව : 09

නව ඖෂධ විමර්ශනය (INDs) පිළිබඳ අත්හදා බැලීම් අයදුම්පත් ගණන : 5

*2021 වර්ෂය සඳහා සමාලෝචනය කරන ලද මුළු අයදුම්පත් සංඛ්‍යාව : 11

තීරණ ගැනීමට නියමිතව තිබූ මුළු අයදුම්පත් සංඛ්‍යාව : 02

*2020 වර්ෂයේ සිට ඉදිරිපත් කරන ලද අයදුම්පත් 02 ක් ඇතුළත් වේ

විමර්ශන නිෂ්පාදනයේ වර්ගය අනුව සායනික අත්හදා බැලීම්

නිෂ්පාදන වර්ගය	අනුමත කරන ලද	අනුමත නොකරන ලද	පොරොත්තුවෙන්	වෙනත්	එකතුව
ඖෂධ	8	1	2	-	11
වෛද්‍ය උපකරණ	-	-	-	-	-
සිමාස්ථ නිෂ්පාදන	-	-	-	-	-
සමස්ත	8	1	2	-	11

NMRA යොමු අංකය	අයදුම්පත ලැබුණු දිනය	තීරණය දැනුම් දෙන ලිපියේ දිනය	අවසාන තීරණය සඳහා කාලය (නියමිත කාලය)	සටහන්
CLITRI/2020/0043	2020.10.30	2021.01.22	දින 56 යි	-
CLITRI/2021/0044	2021.11.18	2021.01.25	දින 49 යි	-
CLITRI/2021/0049	2021.05.17	2021.08.30	දින 36 යි	-
CLITRI/2021/0050	2021.06.04	2021.07.12	දින 19 යි	-
CLITRI/2021/0051	2021.06.07	2021.07.09	දින 58 යි	මණ්ඩලයට අභියාචනයක් ඉදිරිපත් කර ඇත
CLITRI/2021/0052	2021.06.09	2021.07.13	දින 22 යි	-
CLITRI/2021/0053	2021.06.28	2021.07.14	දින 10 යි	-
CTM/022/2021	2021.09.01	2021.11.12	දින 43 යි	-
CTM/023/2021	2021.09.01	2021.11.15	දින 47 යි	-
CTM/024/2021	2021.09.17	2021.09.29	-	ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් සිදු කරන ලද විමසීම්වලට ප්‍රතිචාර නොදැක්වීය.
CTM/025/2021	2021.10.04	-	-	සමාලෝචනය යටතේ පවතී.

සමාලෝචනය සඳහා සාමාන්‍ය කාලය* : දින 37

දින 75ක කාලරාමුව තුළ සිදු කරන ලද සමාලෝචන ප්‍රතිශතය : 100%

පවත්වන ලද පුහුණු / වැඩමුළුව

1. WHO විසින් පවත්වන ලද GCP පරීක්ෂණ වැඩමුළුව - 2021 සැප්තැම්බර් 22 සිට සැප්තැම්බර් 24 දක්වා.
2. ශ්‍රී ලංකා වෛද්‍ය සංගමය විසින් පවත්වන ලද FERCSL GCP වැඩමුළුව - 2021 ජුනි 28 සහ 2021 ජූලි 05

2.2.8 ඖෂධ සුරක්ෂිතතාවය පිලිබඳ අධීක්ෂණ අංශය

	සිදු කරන ලද ක්‍රියාකාරකම්	විස්තර/ ගණන	සටහන්
1.	මාර්ගෝපදේශ සකස් කිරීම සහ ප්‍රකාශයට පත් කිරීම	12	PV අංශය සඳහා WHO විසින් පත්කරන ලද විශේෂඥ උපදේශක සමඟ මෙම මාර්ගෝපදේශ කෙටුම්පත් කරන ලදී
2.	ප්‍රමිතිගත මෙහෙයුම් පටිපාටි (SOPs) සකස් කිරීම	09	ලෝක සෞඛ්‍ය සංවිධානයේ උපදේශක සමඟින් සකස් කරන ලදී
3.	ලෝක සෞඛ්‍ය සංවිධානයේ විශේෂඥ සමඟ රැස්වීම් පැවැත්වීම	21	මාර්ගෝපදේශ සහ SOPs සකස් කිරීම සඳහා
4.	පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වීම	03	WHO විසින් පවත්වන ලදී
5.	විද්‍යුත් වාර්තාකරණ පෝරම සකස් කිරීම	01	
6.	පාර්ශවකරුවන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම	03	
7.	PV ට අදාළ රෙගුලාසි (සංශෝධන සඳහා) කෙටුම්පත් කිරීම	WHO උපදේශකගේ උපදෙස් මත පදනම්ව සංශෝධනයන් සඳහා යෝජනා ලබා දෙන ලදී	
8.	ගුණාත්මක අසාර්ථකත්වයන් පිළිබඳ සන්නිවේදන ලිපි සකස් කිරීම සහ ප්‍රකාශ කිරීම	65	

9.	ආරක්ෂාව සහ අවදානම් ඇගයීමේ අනු කමිටු (SAFRESC) රැස්වීම පැවැත්වීම	03	

ලෝක සෞඛ්‍ය සංවිධානයේ මිණුම් සලකුණු තක්සේරුවට අනුව ඖෂධ සුරක්ෂිතතාවය පිලිබඳ අධීක්ෂණ (PV) අංශය විසින් පහත ක්‍රියාකාරකම් සිදු කිරීමට අවශ්‍ය වන අතර දැනට එම පද්ධතිය සංවර්ධනය කරමින් පවතී.

1. ජනගහනයේ පුද්ගලයන් 100,000කට ලැබුණු සුපරීක්ෂාකාරී සිදුවීම් ගණන/ADR වාර්තා
2. සැලැස්ම අනුව සෞඛ්‍ය සේවා සපයන්නන් සහ රෝගීන් සඳහා පවත්වනු ලබන දැනුවත් කිරීම් සංඛ්‍යාව
3. PV අංශය විසින් සතුටුදායක ලෙස හසුරුවන ලද සහ Vigibase වෙත යවන ලද අහිතකර සිදුවීම් වාර්තා සංඛ්‍යාවට එදිරිව ලැබුණු අහිතකර සිදුවීම් වාර්තා සංඛ්‍යාව
4. ලැබුණු දින සිට පැය 24ක් ඇතුළත විශ්ලේෂණය කර ලැබුණු මාරාන්තික සුපරීක්ෂාකාරී සිදුවීම්/ADR වාර්තා වල රිසිට්පත් ගණනට එදිරිව ලැබුණු මාරාන්තික සුපරීක්ෂාකාරී සිදුවීම්/ADR වාර්තා.
5. දින 5ක් ඇතුළත විශ්ලේෂණය කරන ලද බරපතල සුපරීක්ෂාකාරී සිදුවීම්/ ADR වාර්තා ගණනට එදිරිව ලැබුණු බරපතල සුපරීක්ෂාකාරී සිදුවීම්/ADR වාර්තා.
6. පිළිගත් සහ/හෝ වාර්තාකරු වෙත ප්‍රතිපෝෂණ නිකුත් කළ බැරුම් සුපරීක්ෂාකාරී සිදුවීම්/ ADR වාර්තා ගණනට එදිරිව ලැබුණු බරපතල සුපරීක්ෂාකාරී සිදුවීම්/ ADR වාර්තා.
7. WHO-UMC vigiGrade ™ (0.07 සිට 1 දක්වා පරාසය) මගින් මනිනු ලබන පරිදි ICSR ඉහළ සම්පූර්ණ ලකුණු.
8. වැඩ කරන දින 5ක් ඇතුළත මුලින් ඇගයීමට ලක් කළ දේශීය විභව සංඥා ගණනට එදිරිව දේශීය විභව සංඥා ගණන.
9. පරීක්ෂණ වැඩසටහනට අනුව පවත්වන ලද සුපරීක්ෂාකාරී පරීක්ෂණ ගණන.
10. ක්‍රියාකාරී PV පද්ධතියක් ඇති ඖෂධ සමාගම් සංඛ්‍යාවට එදිරිව රටේ මුළු ඖෂධ සමාගම් සංඛ්‍යාව.
11. PV අංශය විසින් තක්සේරු කරන ලද RMP සංඛ්‍යාවට එදිරිව ඉදිරිපත් කළ RMPs
12. පෙන්නුම් කළ ඖෂධ සමාගම්වලින් ඉල්ලා ඇති අතිරේක අවදානම් අවම කිරීමේ පියවර ගණනට එදිරිව අනුමත කළ අතිරේක අවදානම් අවම කිරීමේ පියවර.
13. නියමිත ඉදිරිපත් කිරීමේ කාලසටහනට අනුව PBRER ඉදිරිපත් කළ ඖෂධ සමාගම් සංඛ්‍යාව
14. PV අංශය විසින් තක්සේරු කරන ලද PBRER සංඛ්‍යාවට එදිරිව ඉදිරිපත් කළ PBRER සංඛ්‍යාව

15. PV අංශය විසින් වැඩ කරන දින 3ක් ඇතුළත තක්සේරු කරන ලද DHPCs සංඛ්‍යාවට එදිරිව ඉදිරිපත් කළ DHPC සංඛ්‍යාව.
16. සතුටුදායක ව්‍යාප්ති ප්‍රගතියක් ඇති DHPC සංඛ්‍යාවට එදිරිව බෙදා හරින ලද එම DPHC සංඛ්‍යාව
17. අතිරේක අධීක්ෂණය යටතේ ඖෂධ නිෂ්පාදන සම්බන්ධයෙන් ලැබුණු සුපරීක්ෂාකාරී සිදුවීම් සංඛ්‍යාව / ADR වාර්තා සංඛ්‍යාවට එදිරිව අනෙකුත් ඖෂධ නිෂ්පාදන සඳහා වාර්තා සංඛ්‍යාව.
18. PV ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලයක් ලෙස ගනු ලබන සුදුසු නියාමන ක්‍රියාමාර්ග ගණනට (ලේබල් වෙනස් කිරීම්, ආරක්ෂිත අනතුරු ඇඟවීම්, ඖෂධ ආපසු ගැනීම්, ආරක්ෂක සන්නිවේදනය, අවදානම් අවම කිරීමේ ක්‍රියාමාර්ග) එදිරිව මෙම කාර්ය සාධනය සඳහා අහඹු නියැදියක් ලෙස ගත් සුපරීක්ෂාකාරී ක්‍රියාමාර්ග ගණන (සැකසූ මාතෘකා) ඇගයීම

PV ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලයක් ලෙස පවත්වනු ලබන පාර්ශවකරුවන් (අභ්‍යන්තර හෝ බාහිර) සමඟ උචිත ප්‍රතිචාර/හඳුනාගැනීම්/සන්නිවේදන සංඛ්‍යාවට එදිරිව මෙම කාර්ය සාධන ඇගයීම සඳහා අහඹු නියැදියක් ලෙස ගත් සුපරීක්ෂාකාරී ක්‍රියාකාරකම් ගණන (සැකසූ මාතෘකා)

2.2.9 ජාතික ඖෂධ නියාමන අධිකාරියෙහි තොරතුරු, අධ්‍යාපනය, සන්නිවේදන සහ පර්යේෂණ අංශය විසින් 2021 දී පවත්වනු ලබන පුහුණු සහ දැනුවත් කිරීමේ වැඩසටහන්.

1. කුඩා පරිමාණ නිෂ්පාදකයින් සඳහා යහපත් නිෂ්පාදන පිළිවෙත් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන (මාර්ගගත) - 2021 ජනවාරි 23 (ශ්‍රී ලංකා ඖෂධ සංගමය විසින් සංවිධානය කරන ලදී)
2. අලෙවිකරණය සඳහා අවසරලත් නිමිකරුවන් සඳහා ඖෂධ සුපරීක්ෂාකාරිත්වය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන (මාර්ගගත) - 2022 මාර්තු 03 (ශ්‍රී ලංකා ඖෂධ සංගමය විසින් සංවිධානය කරන ලදී)
3. යහපත් ගබඩා කිරීම සහ බෙදා හැරීමේ පිළිවෙත් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන - 2021 අප්‍රේල් 23.
4. අලෙවිකරණ අවසරය සඳහා සාමාන්‍ය ඖෂධවල යෙදුම් ඇගයීම පිළිබඳ NMRA හි ඖෂධවේදීන් සඳහා පුහුණුව - 2021 අගෝස්තු 02 සහ 08.
5. අවසන් වසරේ B.Pharm උපාධි අපේක්ෂකයින් සඳහා ජාතික ඖෂධ නියාමන අධිකාරියෙහි පුහුණුව - ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ අවසාන වසරේ B.Pharm උපාධි අපේක්ෂකයින් සඳහා (මාර්ගගත) - 05 .03. 2021
6. වෛද්‍ය පරිපාලනය (MD) II කොටස පුහුණුව - මාර්තු 2021

2.3 අධීක්ෂණ සහ බලාත්මක කිරීමේ අංශයේ ප්‍රගතිය

2021 වසර සඳහා ජාතික ඖෂධ නියාමන අධිකාරියට අනුයුක්ත FDII විසින් සිදු කරන ලද නඩු පැවරීම් පිළිබඳ විස්තර

අනු අංකය.	නඩුව පවරා ඇති දිනය	නඩු අංකය.	අධිකරණය	චූදිතයාගේ නම	වරදේ ස්වභාවය	නියම කර ඇති දඩ (රු .)	පුවත්පත් දැන්වීම් ප්‍රකාශය පත් කිරීමට නියෝග කිරීම
01	2021.01.21	244/21	එම්.සී. මාලිගාකන්ද	ලිතුම් මලින්ත වීරසිංහ , සන්ශයින් හෙල්ත්කෙයා (පුද්) සමාගම , ශ්‍රී වික්‍රම මාවත , කොළඹ 15.	නිසි ගබඩා පහසුකම් නොමැතිව චිකිත්සක භාණ්ඩ ප්‍රවාහනය කිරීම	10,000	නැත
02	2021.01.21	245/21	එම්.සී. මාලිගාකන්ද	W.A.S. ධනුෂ්ක පෙරේරා, ශ්‍රී වික්‍රම මාවත, කොළඹ 15.	නිසි ගබඩා පහසුකම් නොමැතිව චිකිත්සක භාණ්ඩ ප්‍රවාහනය කිරීම	25,000	නැත
				ජනවාරි මස මුළු දඩ මුදල්		**35,000**	
03	2021.03.02	29471	එම්.සී.ගංගොඩවිල	එච් මනෝජ් ප්‍රියන්ත , පරණ කොට්ටාව පාර, දෙල්කඳ	කල් ඉකුත් වූ ඖෂධ අලෙවි කිරීම	පොරොත්තුවෙන්	
04	2021.03.02	29472	එම්.සී.ගංගොඩවිල _	WMT ප්‍රියදර්ශනී , පැරණි කොට්ටාව පාර, දෙල්කඳ	(i) කල් ඉකුත් වූ ඖෂධ ගබඩා කිරීම	පොරොත්තුවෙන්	

					(ii) වෛද්‍යවරුන්ගේ නියදි ගබඩා කිරීම		
05	2021.03.17	5233/17	එම්.සී. මහර	එච්.එම්.නදීශාන් මධුශංක පෙරේරා , සියඹලාවත්ත , දෙල්ගොඩ	(i) සීමා කරන ලද ඖෂධ සන්තකයේ තබා ගැනීම (Tramadol X ^{225} - 200) (ii) මත්ද්‍රව්‍ය ප්‍රවාහනය (ට්‍රැමඩෝල් X ^{225})	පොරොත්තුවෙන්	
06	2021.03.20	11235/20	එම්.සී. මාලිගාකන්ද	කේ.පී. ලහිරු නයනප්‍රිය , කදිරානවත්ත , මට්ටක්කුලිය	බලපත්‍රයක් නොමැතිව ඖෂධ ගබඩා කිරීම	4,000	නැත
07	2021.03.24	27424/18	එම්.සී, මාලිගාකන්ද	කේ.ඒ චරිත ලක්මාල් , දෙමටගොඩ , කලිපුල්ල වත්ත	බලපත්‍රයක් නොමැතිව ඖෂධ ගබඩා කිරීම (Pregabalin Capsules 18)	7,500	නැත
08	2021.03.24	22753/19	එම්.සී, මාලිගාකන්ද	(1) රවීන්ද්‍රන් රගු අරවින්දන් , ගිනිගත්හේන (2) ෂන්මුගරාජා ප්‍රසන්දන් , බෝධිරාජ මාවත , මාලිගාකන්ද	බලපත්‍ර නොමැතිව ඖෂධ වෑන් රථයකින් ප්‍රවාහනය කිරීම	25,000 25,000	නැත
09	2021.03.24	18191/20	එම්.සී. මාලිගාකන්ද	මොහොමඩ් ඉක්බාල් මොහොමඩ් මිරාන් , රාජ්‍ය පාර, කොළඹ 14	බලපත්‍රයක් නොමැතිව ඖෂධ ගබඩා කිරීම (Pregabalin Capsules 400)	20,000	නැත

10	2021.03.24	18346/20	එම්.සී. මාලිගාකන්ද	K.L.S.N. හේමමාලි , වෙහෙරගොඩැල්ල , වැල්ලම්පිටිය	බලපත්‍රයක් නොමැතිව ඖෂධ ගබඩා කිරීම (Pregabalin Capsules 25)	7,500	නැත
11	2021.03.24	18347/20	එම්.සී. මාලිගාකන්ද	ඩබ්ලිව්.ඒ. රසිකා සඳමාලි , අංක 104/221, වැල්ලම්පිටිය	බලපත්‍රයක් නොමැතිව ඖෂධ ගබඩා කිරීම (Pregabalin Capsules 70)	10,000	නැත
12	2021.03.24	23069/20	එම්.සී. මාලිගාකන්ද	රාජ්කුමාර් රොෂාන් කුමාර, අංක 140/1, ශ්‍රී ධර්මාරාම පාර	බලපත්‍රයක් නොමැතිව ඖෂධ ගබඩා කිරීම (Pregabalin Capsules 16)	7,500	නැත
13	2021.03.24	24511/20	එම්.සී. මාලිගාකන්ද	(1) ෂන්මුග තංගරාජා , වෙඩිකන්ද , රත්මලාන (2) ටී.ඒ සිරංජන් , යටපොල , දැරණියගල (3) ඒ. මොහොමඩ් නසාර් , වඩුල්වත	බලපත්‍රයක් නොමැතිව ලොරි රථයකින් ඖෂධ ප්‍රවාහනය (කැප් 18900)	50,000 50,000 50,000	නැත
14	2021.03.24	42/21	එම්.සී. මාලිගාකන්ද	මොහොමඩ් අමීර් මොහොමඩ් ඉහාම් , P.R.130, ශ්‍රී ධර්මාරාම පාර, දෙමටගොඩ	බලපත්‍රයක් නොමැතිව ඖෂධ ගබඩා කිරීම (Pregabalin Capsules 07)	5,000	නැත
15	2021.03.24	148/21	එම්.සී. මාලිගාකන්ද	ආර්.නවීන් ක්‍රිස්ටීන් , මුවදොර උයන , කොළඹ 15	බලපත්‍රයක් නොමැතිව ඖෂධ ගබඩා කිරීම (Pregabalin Capsules 21)	විවෘත වරෙන්තු	

16	2021.03.24	2740/21	එම්.සී. මාලිගාකන්ද	මොහොමඩ් අමීර් මොහොමඩ් ඉහාම්, PR 130, ශ්‍රී ධර්මාරාම පාර, දෙමටගොඩ	බලපත්‍රයක් නොමැතිව ඖෂධ ගබඩා කිරීම (Pregabalin Capsules 30)	10,000	නැත
				මාර්තු මස මුළු දඩ මුදල්		**271,500**	
17	2021.06.30	B/1870/21	එම්.සී. ගල්කිස්ස	මැට්‍රික්ස් ලයිෆ් කෙයා පුද්ගලික සමාගම, රබර් වත්ත පාර, නිකපේ , දෙහිවල (1) එම්.එන්.එම් සල්මාන් (2) එම්.එම්.එම් ජුබ්රන් (3) එම්.එන්.එම් රිසාන්	(i) "Enova" නැවත ඇසුරුම් කිරීම (ii) ලියාපදිංචි නොකළ ඖෂධ ආනයනය කිරීම	පොරොත්තුවෙන්	
				ජුනි මස මුළු දඩ මුදල්		**පොරොත්තුවෙන්**	
18	2021.07.22	14302/21	එම්.සී. මාලිගාකන්ද	(1) වමත් කමිල් ජෝෂප් ද සිල්වා විජයරත්න (2) මෙඩි ඩියාග් (පුද්ගලික) සමාගම, අංක 16, ගෝතමී පාර, කොළඹ 08	ලියාපදිංචි නොකළ, වංචනිකව ගෙන්වන ලද වෛද්‍ය උපකරණ ගබඩා කිරීම	40,000	ඔව්
				ජූලි මස මුළු දඩ මුදල්		**40,000**	
19	2021.09.08	16768/21	එම්.සී. මාලිගාකන්ද	මොහොමඩ් රිසෝ මොහොමඩ් , 61/1/1, මැසෙන්ජර් වීදිය, කොළඹ 12	ලියාපදිංචි නොකළ උපාංග (ස්පන්දන ඔක්සිමීටර) ප්‍රවාහනය කිරීම.	75,000	ඔව්

20	2021.09.08	16769/21	එම්.සී. මාලිගාකන්ද	අබ්දුල් සතෝර් මොහොමඩ් ඉෂාක් , හැම්ප්ඩෝ පටුමග, කොළඹ 06	ලියාපදිංචි නොකළ උපාංග (ස්පන්දන ඔක්සිමීටර) ප්‍රවාහනය කිරීම.	75,000	ඔව්
21	2021.09.08	16770/21	එම්.සී. මාලිගාකන්ද	අබ්දුල් අසීස් ෆසාල් මොහොමඩ් , ධවලසිංහාරාම මාවත , කොළඹ 15	ලියාපදිංචි නොකළ උපාංග (ස්පන්දන ඔක්සිමීටර) ප්‍රවාහනය කිරීම.	75,000	ඔව්
				සැප්තැම්බර් මුළු දඩ		**225,000**	
22	2021.11.30	24688/21	එම්.සී. මාලිගාකන්ද	මුරුගේසු පරනීදරන් , බෙස්ලයින් මාවත , කොළඹ 09	හොර රහසේ ඖෂධ ගබඩා කිරීම (Tozilusumab)	පොරොත්තුවෙන්	
23	2021.11.30	24689/21	එම්.සී. මාලිගාකන්ද	මොහොමඩ් අස්මීර් මොහොමඩ් යසින් , මාලිගාවත්ත , කොළඹ 10.	හොර රහසේ වෛද්‍ය උපකරණ ගබඩා කිරීම. (ප්‍රතිදේහජනක කට්ටල 420)	15,000	
24	2021.11.30	24690/21	එම්.සී. මාලිගාකන්ද	මොහොමඩ් අස්මීර් මොහොමඩ් යසින් , මාලිගාවත්ත , කොළඹ 10.	හොර රහසේ වෛද්‍ය උපකරණ ගබඩා කිරීම. (ස්පන්දන ඔක්සිමීටර 1610)	15,000	
25	2021.11.30	24691/21	එම්.සී. මාලිගාකන්ද	බදුර්දීන් මොහොමඩ් මොහොමඩ් අසිර් , කොළඹ 12.	හොර රහසේ වෛද්‍ය උපකරණ ගබඩා කිරීම. (ප්‍රතිදේහජනක කට්ටල 46)	20,000	

26	2021.11.30	24692/21	එම්.සී. මාලිගාකන්ද	බදුර්දීන් මොහොමඩ් මොහොමඩ් අසීර් , කොළඹ 12.	හොර රහසේ වෛද්‍ය උපකරණ ගබඩා කිරීම. (ස්පන්දන ඔක්සිමීටර 198)	25,000	
				නොවැම්බර් මස මුළු දඩ මුදල්		**75,000**	
2021 සම්පූර්ණ දඩ මුදල්						**646,500**	

වාර්ෂික පරීක්ෂණ - සිල්ලර ඔසුසල්, තොග ඔසුසල්, ඖෂධ ප්‍රවාහන වාහන - 2021

මාසික	සිල්ලර ඔසුසල්	තොග ඔසුසල්	ඖෂධ ප්‍රවාහන වාහන	එකතුව
ජනවාරි	0	0	48	48
පෙබරවාරි	0	0	63	63
මාර්තු	04	0	117	121
අප්‍රේල්	08	07	182	197
මැයි	15	05	129	149
ජූනි	17	10	119	146
ජූලි	26	08	201	235
අගෝස්තු	40	10	129	179
සැප්තැම්බර්	39	14	364	417
ඔක්තෝම්බර්	36	06	254	296
නොවැම්බර්	09	04	163	176
දෙසැම්බර්	07	05	121	133
එකතුව	**201**	**69**	**1890**	**2160**

උසාවියේ පෙනී සිටින සංඛ්‍යාව: - 61

පැමිණිලි ගණන: - 14

එකතු කරන ලද සාම්පල ගණන: - 16

ගොනු කර ඇති නඩු ගණන: - 26

එකතු කරන ලද මුළු දඩ මුදල්: - රු . 646,500.00 කි

2.4 මූල්‍ය අංශයේ ප්‍රගතිය

මෙම වසරේ කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා ආපදා ණය පහසුකම හඳුන්වා දීමට හැකි විය. එසේම, මෙම වසරේ දී e-NMRA පද්ධතිය සමඟ ක්‍රියාකාරකම් තවදුරටත් වැඩිදියුණු කරන ලදී.

අනාගතය සඳහා සැලසුම්

1. ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් හසුරවනු ලබන ගිණුම් සහ ආයතනික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ආදායම ඵලදායී ලෙස භාවිතා කිරීම.
2. ආදායම් වර්ග 52ක් මඟින් සහ වාර්තා බැලීම සඳහා පද්ධතියක් සැකසීමෙන් e-NMRA පද්ධතියට දායකත්වය වැඩි කිරීම.

2.5 පරිපාලන අංශයේ ප්‍රගතිය

සාමාන්‍ය පරිපාලන හා කළමනාකරණ රාජකාරි සිදු කරන ලද අතර, කාර්ය මණ්ඩල සුබසාධනය ගැන සොයා බලන ලදී. තවද ආයතනික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සියලුම අංශ වෙත ඔවුන්ගේ මූලික රාජකාරි අඛණ්ඩව කරගෙන යාමට පරිපාලන සහාය ලබා දෙන ලදී.
ඊට අමතරව, පරිපාලන අංශයේ ප්‍රධාන කාර්යය ලෙස බලපත්‍ර සහ ලියාපදිංචි සහතික පහත පරිදි නිකුත් කරනු ලැබීය.

	වර්ගය		සම්පූර්ණ බලපත්‍ර ගණන
1	ලියාපදිංචි සහතික	ඖෂධ	352
2		වෛද්‍ය උපකරණ	1099
3		සිමාස්ථ නිෂ්පාදන	42
4		විලවුන්	3236
5	ආනයන බලපත්‍ර	ඖෂධ	483
6		වෛද්‍ය උපකරණ	3164
7		සිමාස්ථ නිෂ්පාදන	76
8		විලවුන්	4061
9	නියැදි බලපත්‍ර	ඖෂධ	385
10		වෛද්‍ය උපකරණ	474

11		සිමාස්ථ නිෂ්පාදන	35
12		විලවුන්	1150
13	නිෂ්පාදන බලපත්‍ර	ඖෂධ	288
14		වෛද්‍ය උපකරණ	74
15		සීමාස්ත නිෂ්පාදන	1
16		විලවුන්	273
17	සිල්ලර ඔසුසල්		31
18	ඖෂධ ප්‍රවාහන		2490
19	තොග ගබඩා		7
	එකතුව		**17,721**

2.6 නීති අංශයේ ප්‍රගතිය

2021 වර්ෂයේ විවෘත කරන ලද ගොනු ගණන 241

අවසන් කරන ලද ගොනු 2021 (2021.01.01 දක්වා 2021.12.31 දක්වා) 221

2021.12.31 දක්වා මුළු පොරොත්තු ගොනු 384

නියෝජිතායතන මාරු කිරීම් සම්බන්ධයෙන් අවසන් කරන ලද ගොනු
(2021.01.01 සිට 2021.12.31 දක්වා)

ගාස්තු රහිත ලිපිගොනු සංඛ්‍යාව (2021.01.01 - 31.12.2021 දක්වා) 19

ගෙවීම් මූලික ගොනු ගණන (01.01.2021 - 31.12.2021 දක්වා) 88

එකතුව 107

නියෝජිතායතන මාරු කිරීම් සම්බන්ධයෙන් මුළු ආදායම
(2021.01.01 සිට - 2021.12.31දක්වා) රු . 38,375,062.88/-

2021.01.01 සිට 2021.12.31 දක්වා ජාතික ඖෂධ නියාමන අධිකාරී පනත යටතේ නිකුත් කරන ලද නියෝග/ ගැසට් පත්‍ර.

	ගැසට් අංක	ගැසට් නාමය
01	2241/43 - 19.08.2021	* 2019 මැයි 15 දින අංක 2123/35 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 2019 ඖෂධ (මිල ඉහළ සීමා) නියෝගයේ උපලේඛනය ඉවත්කොට සංශෝධනය කිරීම. 2019 මාර්තු 15 දිනැති අංක 2114/54 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග මගින් සංශෝධිත 2017 පෙබරවාරි 17 වැනි දින අංක 2006/45 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 2017 අංක 1 වෛද්‍ය උපකරණ මිල නියම කිරීමේ නියෝගයෙහි උපලේඛනය ඉවත් කොට සංශෝධනය කිරීම. *2019 මාර්තු මස 15 වැනි දින අංක 2114/54 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග මගින් සංශෝධිත 2018 අගෝස්තු 31 වැනි දින අංක 2086/37 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 2018 වෛද්‍ය උපකරණ (මිල නියම කිරීමේ) නියෝගයේ උපලේඛනය ඉවත් කොට සංශෝධනය කිරීම. 2019 මාර්තු 15 දින අංක 2114/54 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගය මගින් සංශෝධිත 2017 අගෝස්තු 4 වැනි දින අංක 2030/47 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 2017 අංක 5 දරන වෛද්‍ය උපකරණ මිල නියම කිරීමේ නියෝගයෙහි උපලේඛනය ඉවත් කොට සංශෝධනය කිරීම.
02	2243/20 - 04.09.2021	2021 අංක 1වෛද්‍ය (වෛද්‍ය උපකරණවල මිල කිරීමේ) නියෝග.

ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් ගොනු කරන ලද විභාග වෙමින් පවතින අධිකරණ නඩු (2021.12.31 දක්වා)

	LO අංකය	නඩුව	තත්ත්වය	අධිකාරිය කුමන පාර්ශවයද යන වග
01	NMRA/LO/10/2017	අංක J93933 දරන මීගමුව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුව	පොරොත්තුවෙන්	පැමිණිලිකරු
02	NMRA/LO/11/2017	70066 දරන මිනුවන්ගොඩ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුව	පොරොත්තුවෙන්	පැමිණිලිකරු
03	NMRA/LO/15/2017	අංක 45379/09 දරන වත්තල මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුව	පොරොත්තුවෙන්	පැමිණිලිකරු
04	NMRA/LO/16/2017	පානදුර මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුව	පොරොත්තුවෙන්	පැමිණිලිකරු
05	NMRA/LO/434/2018	අංක 53946 දරන පානදුර මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුව	පොරොත්තුවෙන්	පැමිණිලිකරු
06	NMRA/LO/439/2018	අංක 62475 දරන නුවරඑළිය මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුව	පොරොත්තුවෙන්	පැමිණිලිකරු
07	NMRA/LO/465/2018	CA Writ/400/2018 - Markss HLC (Pvt) Ltd	පොරොත්තුවෙන්	පැමිණිලිකරු
08	NMRA/LO/494/2019	අංක 90068 දරන අම්පාර මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුව	පොරොත්තුවෙන්	පැමිණිලිකරු
09	NMRA/LO/590/2019	අංක 92792 දරන අම්පාර මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුව	පොරොත්තුවෙන්	පැමිණිලිකරු
10	NMRA/LO/726/2019	අංක 82460 දරන ගම්පහ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුව	පොරොත්තුවෙන්	පැමිණිලිකරු
11	NMRA/FDI/ Investi /2019	අංක 28329/05/20 ඖෂධ නඩුව	පොරොත්තුවෙන්	පැමිණිලිකරු
12	NMRA/LO/1088/2021	14280/S/21 දරන ගල්කිස්ස මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුව	පොරොත්තුවෙන්	පැමිණිලිකරු

ජාතික ඖෂධ නියාමන අධිකාරියට එරෙහිව ගොනු කරන ලද විභාග වෙමින් පවතින අධිකරණ නඩු (2021.12.31 දක්වා)

	LO අංකය	නඩුව	තත්ත්වය	අධිකාරිය කුමන පාර්ශවයද යන වග
01	NMRA/LO/24/2017	SC/FR/102/2016 ලයනල් ගුරුගේ , CPA එදිරිව NMRA	පොරොත්තුවෙන්	වගඋත්තරකරු
02	NMRA/LO/411/2018	CA/Writ/285/18 නවලෝක හොස්පිට්ල්ස් පීඑල්සී සහ තවත් අයට එදිරිව ගරු දොස්තර රාජිත සේනාරත්න සහ තවත් අය	පොරොත්තුවෙන්	වගඋත්තරකරු
03	NMRA/LO/412/2018	CA/Writ/284/2012 ආසිරි හොස්පිට්ල් හෝල්ඩිංග්ස් පීඑල්සී සහ තවත් අයට එදිරිව ගරු දොස්තර රාජිත සේනාරත්න සහ තවත් අය	පොරොත්තුවෙන්	වගඋත්තරකරු
04	NMRA/LO/465/2019	CA/Writ/400/2018 Markss HLC (Pvt) Ltd	පොරොත්තුවෙන්	වගඋත්තරකරු
05	NMRA/LO/707/2019	CA/Writ/499/2019 Markss HLC (Pvt) Ltd vs. SPC සහ 4දෙනෙකු	පොරොත්තුවෙන්	වගඋත්තරකරු
06	NMRA/LO/720/2019	CA/Writ/517/2019 SLCPI තවත් 3 දෙනෙක්ට එදිරිව ගරු. පවිත්‍රා වන්නිආරච්චි සහ තවත් 8 දෙනෙක්.	පොරොත්තුවෙන්	වගඋත්තරකරු
07	NMRA/LO/731/2019	CA/Writ/501/2019 SLCPI එදිරිව ගරු. පවිත්‍රා වන්නිආරච්චි සහ තවත් 2 දෙනෙක්.	පොරොත්තුවෙන්	වගඋත්තරකරු
08	NMRA/LO/823/2020	CA/Writ/78/2020 Hemas Pharmaceuticals (Pvt) Ltd එදිරිව වෛද්‍ය අනිල් ජයසිංහ සහ තවත් අය	පොරොත්තුවෙන්	වගඋත්තරකරු
09	NMRA/LO/949/2021	CA/Writ/417/2020 Ace Healthcare (Pvt) Ltd සහ තවත් දෙදෙනෙක්ට එදිරිව රේගු අධ්‍යක්ෂ ජනරාල් සහ තවත් 15 දෙනෙක්.	පොරොත්තුවෙන්	වගඋත්තරකරු
10	NMRA/LO/1007/2021	SC/FR/108/2021 රෝගීන්ගේ අයිතිවාසිකම් සඳහා වූ ජනතා ව්‍යාපාරය සහ තවත් දෙදෙනෙකුට එදිරිව ගරු සෞඛ්‍ය අමාත්‍ය පවිත්‍රා	පොරොත්තුවෙන්	වගඋත්තරකරු

		වන්නිආරච්චි මහත්මිය සහ තවත් 23 දෙනෙක්.		
11	NMRA/LO/1109/2021	SC/FR/321/2021 ආචාර්ය. දාරිනි රාජසිංහම් සහ තවත් දෙදෙනෙක්ට එදිරිව ගරු. කෙහෙළිය රඹුක්වැල්ල , සෞඛ්‍ය අමාත්‍ය සහ තවත් 4 දෙනෙක්.	පොරොත්තුවෙන්	වගඋත්තරකරු
12	NMRA/LO/1116/2021	2/1130/2021 - LT නඩුව එෆ්.ආර්. ගෆූර්ට එදිරිව සභාපති, NMRA	පොරොත්තුවෙන්	වගඋත්තරකරු
13	NMRA/LO/1153/2021	මානව හිමිකම් කොමිසමේ පැමිණිලි අංක HRC-HO-2244-21	පොරොත්තුවෙන්	වගඋත්තරකරු

2.7 මානව සම්පත් අංශයේ ප්‍රගතිය

2021.12.31 දිනට කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු

තනතුර	වැටුප් කේතය	සේවා මට්ටම	DMS අනුමත සේවක සංඛ්‍යාව			තත්‍ය සේවක සංඛ්‍යාව			
			ස්ථිර	කොන්ත්‍රාත්	අනියම්	ස්ථිර	කොන්ත්‍රාත්	දිවිනියන	සෞඛ්‍ය අමාත්‍යාංශයේ සේවකයින්
අධ්‍යක්ෂ ජනරාල් / ප්‍රධාන විධායක නිලධාරී	HM 2-1-2016	1	1	-	-	1	-	-	-
අධ්‍යක්ෂ	HM 1-1-2016	1	4	-	-	-	-	-	1
අධ්‍යක්ෂ (මානව සම්පත්)	HM 1-1-2016	1	1	-	-	-	-	-	-
වෛද්‍ය නිලධාරී	MM 1-3-2016	1	4	-	-	-	-	-	-
ගණකාධිකාරී	MM 1-1-2016	1	1	-	-	1	-	-	-
අභ්‍යන්තර විගණක	MM 1-1-2016	1	1	-	-	-	-	-	-
සහකාර අධ්‍යක්ෂ / නියෝජ්‍ය අධ්‍යක්ෂ	MM 1-1-2016	1	6	-	-	-	-	-	1
සහකාර අධ්‍යක්ෂ / නියෝජ්‍ය අධ්‍යක්ෂ (ICT)	MM 1-1-2016	1	1	-	-	1	-	-	-
පිරිවැය ගණකාධිකාරී	MM 1-1-2016	1	1	-	-	-	-	-	-
නීති නිලධාරී	MM 1-1-2016	1	1	-	-	1	-	-	-
ඖෂධ විශ්ලේෂක	MM 1-1-2016	1	13*	12	-	-	-	-	6
ඖෂධ ඇගයීම් නිලධාරී	MM 1-1-2016	1	30	-	-	-	-	-	-
සහකාර ඖෂධ ඇගයීම් නිලධාරී	JM 1-1-2016	2	40	-	-	28	-	-	-
පරිපාලන නිලධාරී	JM 1-1-2016	2	1	-	-	1	-	-	-

පිරිවැය නිලධාරී	MA 5-2 2016	2	5	-	-	-	-	-	-
ඖෂධවේදී	MA 5-1 2016	3	- **	-	-	-	-	1	37
සංවර්ධන නිලධාරී	MA 3- 2016	3	10	-	-	7	-	-	-
ඖෂධ පරීක්ෂක	MA 5-1 2016	3	20	-	-	-	-	-	3
තාක්ෂණ නිලධාරී (සිවිල්)	MA 2-2-2016	3	1	-	-	-	-	-	-
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර	MA 2-1-2016	3	1	-	-	-	-	-	-
කළමනාකරණ සහකාර	MA 1-1-2016	3	43	10	-	42	-	-	-
රියදුරු	PL 3-2016	4	10	-	-	4	-	-	1
ජලනල කාර්මික	PL 2-2016	4	1	-	-	-	-	-	-
විදුලි කාර්මික	PL 2-2016	4	1	-	-	1	-	-	-
රසායනාගාර සහයක	PL 2-2016	4	8	-	-	-	-	-	-
කාර්යාල කාර්ය සහයක	PL 1-2016	4	30	-	-	23	-	-	-
එකතුව			**235**	**22**	**-**	**110**	**0**	**1**	**49**

* ඖෂධ විශ්ලේෂක තනතුරු 13 එම නිලධාරීන් විශ්‍රාම ගැනීමෙන් පසු අහෝසි වේ.

** ඖෂධවේදී තනතුර 2020.11.03 දින සිට ක්‍රියාත්මක වන පරිදි යටපත් කර ඇති අතර ඒ වෙනුවට ඖෂධ ඇගයීම් නිලධාරී (PA) සහ සහකාර ඇගයීම් නිලධාරී (APA) තනතුරු ස්ථාපිත කර ඇත. කෙසේ වෙතත්, සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ සිටින ඖෂධවේදීන් මෙම නව තනතුරු සඳහා (PA සහ APA) බඳවා ගැනීම් අවසන් වන තෙක් ජාතික ඖෂධ නියාමන අධිකාරියෙහි සේවයේ යොදවා ඇත.

පිරිස් කළමනාකරණය

සේවා මට්ටම	**අනුමත සේවක සංඛ්‍යාව**	**තත්‍ය සේවක සංඛ්‍යාව**	**පුරප්පාඩු**
ජ්‍යෙෂ්ඨ	76	12	64
තෘතියික	46	29	17
ද්විතියික	85	90 (අනුමත සේවක සංඛ්‍යාවේ නොවන සෞඛ්‍ය අමාත්‍යාංශයේ ඖෂධවේදීන් ඇතුළුව)	
ප්‍රාථමික	50	29	21
එකතුව	**257**	**160**	

මානව සම්පත් අංශයේ කාර්ය සාධනය

- 2021 වසර තුළ බඳවා ගැනීමේ විස්තර

තනතුර	බඳවාගත් දිනය	බඳවාගත් තනතුරු ගණන
ප්‍රධාන විධායක නිලධාරි	2021.11.10	01
අධ්‍යක්ෂ මානව සම්පත්	2021.02.25	01
පරිපාලන නිලධාරි	2021.04.29	01
සහකාර ඇගයීම් නිලධාරී	2021.12.15	15
	2021.12.16	09
	2021.12.20	01
	2021.12.27	03
කළමනාකරණ සහකාර	2021.16.15	17
	2021.06.21	01
	2021.06.28	02
	2021.07.05	02
	2021.08.02	01
	2021.12.01	02
	2021.12.07	01
බඳවාගත් සම්පූර්ණ තනතුරු ගණන		**57**

- මීට අමතරව, අධ්‍යක්ෂ මානව සම්පත්, අභ්‍යන්තර විගණක සහ ඖෂධ ඇගයීම් නිලධාරී තනතුරු සඳහා බඳවා ගැනීම සඳහා පුරප්පාඩු පිලිබඳ දැන්වීම් පළ කරන ලදී.
- උපාධි අපේක්ෂකයින් දාහතක් (17) සඳහා පුහුණු අවස්ථා ලබා දී ඇත.
- කළමනාකරණ සේවා දෙපාර්තුමේන්තුවෙහි අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලද බඳවා ගැනීමේ පරිපාටි සහ තනතුරු සඳහා අනුමැතිය ලබා ගැනීම;

  ඖෂධ විශ්ලේෂක (කොන්ත්‍රාත්) - සංශෝධනය සඳහා නැවත ඉදිරිපත් කර ඇත.

  ඖෂධ ඇගයීම් නිලධාරී

  සහකාර ඖෂධ ඇගයීම් නිලධාරී

- ජාතික ඖෂධ නියාමන අධිකාරියේ සේවකයින්ගේ වසර තුනක පරිවාස කාලය සම්පූර්ණ කිරීමෙන් පසු ඔවුන්ගේ සේවය ස්ථීර කිරීම.

  නීති නිලධාරි (1)

  කාර්යාල කාර්ය සහායක (23)

- පශ්චාත්-වෙළඳපොල නිරීක්ෂණ ශක්තිමත් කිරීම සඳහා ආහාර සහ ඖෂධ පරීක්ෂකවරුන් පත් කරන ලදී.
- ජාතික ඖෂධ නියාමන අධිකාරියේ කාර්ය මණ්ඩලය සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාගය පවත්වන ලදී.
- රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය 03/2020 අනුව සියලුම සේවකයින්ට ප්‍රසාද දීමනාව ලබා දීම.
- කාර්යමණ්ඩලයේ සහ අනෙකුත් ආයතන වල ඉල්ලීම පරිදි සේවා ලිපි සහ විවිධ ලිපි නිකුත් කිරීම.
- අධිකාරියේ කාර්ය මණ්ඩලයේ වාර්ෂික වැටුප් වර්ධක ගෙවීම සහ අමාත්‍යාංශ කාර්ය මණ්ඩලයේ වාර්ෂික වැටුප් වර්ධක නිර්දේශ කිරීම.
- ජාතික ඖෂධ නියාමන අධිකාරියේ කාර්ය මණ්ඩලය සඳහා ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි පිලිබඳ දෙදින වැඩමුළු (වැඩමුළු 02ක්) පවත්වන ලදී .

3 වන පරිච්ඡේදය

සමස්ත මුල්‍ය කාර්ය සාධනය

ජාතික ඖෂධ නියාමන අධිකාරිය

2021 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා

මූල්‍ය ප්‍රකාශය

ජාතික ඖෂධ නියාමන අධිකාරිය

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

දෙසැම්බර් 31 දිනට,	සටහන	2021 රු.	2020 රු.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපල,පිරියක සහ උපකරණ	2	114,561,686	49,892,359
කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ	2.1		5,600,619
මුළු ජංගම නොවන වත්කම්		**114,561,686**	**55,492,978**
ජංගම නොවන වත්කම්			
ආපදා ණය ශේෂය		5,125,570	
ජංගම වත්කම්			
තොගය	3	1,947,084	1,655,865
කැන්පතු සහ අනෙකුත්ලැබිය යුතු දෑ	4	16,561,415	22,544,810
කෙටිකාලීන ආයෝජන	5	2,141,652,055	3,149,130,138
මුදල් සහ මුදල් සමාන දෑ	6	1,624,514,939	129,108,499
මුළු ජංගම වත්කම්		**3,784,675,492**	**3,302,439,312**
මුළු වත්කම්		**3,904,362,748**	**3,357,932,290**
හිමිකම් සහ වගකීම්			
හිමිකම්			
සමුච්චිත අරමුදල		2,994,730,451	2,404,402,438
ප්‍රාග්ධන ලාභය		64,275,375	
මුළු හිමිකම්		**3,059,005,826**	**2,404,402,488**
ජංගම නොවන වගකීම්			
පාරිතෝෂිකය සඳහා වෙන්කිරීම්		2,834,700	
ප්‍රාග්ධන ප්‍රදාන	7	5,920,019	157,364
විලම්බිත බදු	8	13,488,345	7,102,486
මුළු ජංගම නොවන වගකීම්		**22,243,064**	**7,259,850**
ජංගම වගකීම්			
අත්තිකාරම් ලැබීම්	9	87,185,512	76,702,510
ආදායම් බදු සඳහා වෙන්කිරීම්	19	151,836,233	575,361,535
ගෙවිය යුතු වැට් බදු	10	52,463,719	68,856,674
ගෙවිය යුතු මුද්දර බදු	11	30,299,888	22,747,938
භාණ්ඩාගාර බදු සඳහා වෙන්කිරීම්	12	400,000,000	146,929,966
උපචිත වියදම් සහ අනෙකුත් ගෙවිය යුතු දෑ	13	101,328,507	55,671,329
මුළු ජංගම වගකීම්		**823,113,858**	**946,269,952**
මුළු හිමිකම් සහ වගකීම්		**3,904,362,748**	**3,357,932,290**

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ මූල්‍ය ප්‍රකාශනවලට අමුණා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල මූලික අංගයකි.

කේ.එම්.වයි.කේ. කරුණාරත්න
ගණකාධිකාරී

මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇති අතර ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලදී.

Dr. වෛද්‍ය රසිත විජේවන්ත
සභාපති

Dr.සවින් සේමගේ
ප්‍රධාන විධායක නිලධාරී

..... 2022

ජාතික ඖෂධ නියාමන අධිකාරිය
විස්තීර්ණ ආදායම පිළිබඳ ප්‍රකාශය

දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා,	සටහන	2021 රු.	2020 රු.
ආදායම	**14**	1,252,757,342	1,059,441,826
පොලී ආදායම		148,182,620	177,652,925
වෙනත් ආදායම්	**15**	8,853,050	1,239,604
පරිපාලන වියදම්	**16**	(119,812,930)	(93,984,429)
වැටුප් සහ වේතන	**17**	(152,382,467)	(146,730,584)
වෙනත් වියදම්	**18**	(12,182,753)	(58,605,113)
ප්‍රාග්ධන ප්‍රදානය ක්‍රමක්ෂ කිරීම			1,342,902
බදුවලට පෙර ශුද්ධ ආදායම		**1,125,414,862**	**940,357,130**
වර්ෂය සඳහා ආදායම් බදු	**19**	(158,222,092)	(266,752,264)
බදුවලට පසු ශුද්ධ ආදායම		967,192,769	673,604,866
භාණ්ඩාගාර බදු සඳහා වෙන්කිරීම්		(400,000,000)	
2021 සඳහා ශුද්ධ ආදායම		**567,192,769**	**673,604,866**

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ මූල්‍ය ප්‍රකාශනවලට අමුණා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල මූලික අංගයකි.

ජාතික ඖෂධ නියාමන අධිකාරිය
හිමිකම් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනය

අවසන් වූ වර්ෂය සඳහා,	සමුච්චිත අරමුදල රු.
2018 දෙසැම්බර් 31 දිනට ශේෂය	**1,047,449,960**
පූර්ව වර්ෂ නිවැරදි කිරීම	(17,831,726)
2018 දෙසැම්බර් 31 දිනට සංශෝධිත ශේෂය	**1,029,618,234**
වර්ෂයේ ලාභය	795,694,791
භාණ්ඩාගාර බඳු සඳහා වෙන්කිරීම්	(79,569,479)
2019 දෙසැම්බර් 31 දිනට ශේෂය	**1,745,743,546**
පූර්ව වර්ෂ නිවැරදි කිරීම	52,414,563
2020 දෙසැම්බර් 31 දිනට සංශෝධිත ශේෂය	**1,798,158,109**
වර්ෂයේ ලාභය	673,604,866
භාණ්ඩාගාර බඳු සඳහා වෙන්කිරීම්	(67,360,487)
2020 දෙසැම්බර් 31 දිනට ශේෂය	**2,404,402,488**
පූර්ව වර්ෂ නිවැරදි කිරීම	23,135,193
2021 දෙසැම්බර් 31 දිනට සංශෝධිත ශේෂය	**2,427,537,681**
වර්ෂයේ ලාභය	567,192,769
භාණ්ඩාගාර බඳු සඳහා වෙන්කිරීම්	-
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය	**2,994,730,451**

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ මූල්‍ය ප්‍රකාශනවලට අමුණා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල මූලික අංගයකි.

ජාතික ඖෂධ නියාමන අධිකාරිය
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

දෙසැම්බර් 31 දිනට,	2021 රු.	2020 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහය		
බදුවලට පෙර ශුද්ධ ආදායම	1,125,414,862	940,357,130
ගැලපීම්:		
ක්ෂයවීම්	21,870,537	17,515,637
පොලී ආදායම්	(148,182,620)	(177,652,925)
ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය		(1,342,902)
පාරිතෝෂික වියදම්	683,972	1,257,060
පෙර වර්ෂයේ ගැලපීම්	(51,820,238)	
කාරක ප්‍රාග්ධන වෙනස්වීම් වලට පෙර මෙහෙයුම් ලාභය	**947,966,513**	**780,134,001**
කාරක ප්‍රාග්ධන අයිතම්වල වෙනස්කම්		
තොග (වැඩිවීම්)/ අඩුවීම	(291,219)	336,999
තැන්පතු සහ අනෙකුත් ලැබිය යුතු දෑ (වැඩිවීම්)/අඩුවීම	(857,825)	(21,560,582)
අත්තිකාරම් ලැබීම් (වැඩිවීම්)/අඩුවීම	10,483,002	(183,249,343)
ගෙවිය යුතු වැට බදු (වැඩිවීම්))/අඩුවීම	(14,608,754)	5,653,112
ගෙවිය යුතු මුද්දර ගාස්තු (වැඩිවීම්)/අඩු වීම	7,551,950	16,566,202
භාණ්ඩාගාර බදු සඳහා වෙන්කිරීම් (වැඩිවීම්)/අඩු වීම		
උපචිත වියදම් සහ අනෙකුත් ගෙවිය යුතු දෑ(වැඩිවීම්)/අඩුවීම	45,241,658	5,801,201
කෙටිකාලීන ආයෝජන වැඩිවීම්/		-
6		
මෙහෙයුම් වලින් උපයන මුදල්	**995,485,324**	**603,681,589**
භාණ්ඩාගාර බදු ගෙවීම්	(146,929,966)	(80,917,066)
බදු ගෙවීම්	(536,936,978)	(306,965,632)
(උපයෝජනය කරන ලද) මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල්	**311,618,380**	**215,798,891**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් මුදල් ගලා ඒම		
දේපල පිරියක සහ උපකරණ අත්පත් කර ගැනීම	22,396,988	(6,935,359)
කෙරීගෙන යන වැඩවල වෙනස්කම්	5,600,619	(128,543)
කෙටි කාලීන තැන්පතු වල ආයෝජනය	1,007,478,083	(669,499,875)
පොලී ආදායම්	148,182,620	177,652,925
(උපයෝජනය කරන ලද) ආයෝජන ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල්	**1,183,658,310**	**(498,910,853)**
මුදල් සහ මුදල් සමාන මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩිවීම / අඩුවීම	1,495,276,690	(283,111,962)
වර්ෂය ආරම්භයේදී මුදල් සහ මුදල් සමාන දෑ	129,108,499	412,220,462
වර්ෂය අවසානයේ මුදල් සහ මුදල් සමාන දෑ	**1,624,385,189**	**129,108,499**

ඖෂුමීකරණ ප්‍රතිපත්ති සහ මූල්‍ය ප්‍රකාශනවලට අමුණා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල මූලික අංගයකි.

ජාතික ඖෂධ නියාමන අධිකාරිය

මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

2021 දෙසැම්බර් 31 දිනට

1. ගිණුම්කරණ ප්‍රතිපත්ති

1.1 වාර්තා කිරීමේ ආයතනය

ජාතික ඖෂධ නියාමන අධිකාරිය ("අධිකාරිය") 2015 ජූලි 01 දින සිට බලපැවැත්වෙන පරිදි 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන පනත යටතේ සංස්ථාපිත විය. එය සෞඛ්‍ය හා පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ විෂය පථය යටතේ ඇති රජයේ අධිකාරියක් වන අතර, එය ශ්‍රී ලංකාවේ කොළඹ 10, නොරිස් කැනල් පාර, අංක 120 හි පිහිටා ඇත. ජාතික ඖෂධ තත්ත්ව සහතික කිරීමේ විද්‍යාගාරයේ (NMQAL) අධිකාරය සහ සියලුම කාර්යයන් අධිකාරියට පවරා ඇත.

1.2 ප්‍රධාන ක්‍රියාකාරිත්වය සහ මෙහෙයුම් ස්වභාවය

අධිකාරියේ පරමාර්ථය වන්නේ කාර්යක්ෂමව, ආරක්ෂිතව සහ හොඳ තත්ත්වයේ ඖෂධ, වෛද්‍ය උපකරණ සහ සීමාස්ථ නිෂ්පාදන සාමාන්‍ය ජනතාවට දැරිය හැකි මිලකට ලබා ගැනීම සහතික කිරීමයි. අධිකාරිය විසින් බලපත්‍ර ලියාපදිංචි කිරීම සහ නිකුත් කිරීම සහ ඖෂධ, වෛද්‍ය උපකරණ, සීමාස්ථ නිෂ්පාදන, සායනික අත්හදා බැලීම් සහ ඔසුසැල් සම්බන්ධයෙන් වෙනත් නියාමන ක්‍රියාකාරකම්වලට සම්බන්ධ වේ.

2. පිළියෙල කිරීමේ පදනම

2.1 අනුකූලතා ප්‍රකාශය

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLFRS / LKAS) අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ වගකීම

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතුය.

2.3 මිණුම් කිරීමේ පදනම

මූල්‍ය ප්‍රකාශන සඳහා අදාළ සටහන්වල පැහැදිලි කර ඇති පරිදි සාධාරණ අගය හඳුනා ගන්නා ලද වත්කම් සහ බැරකම් හැර ඓතිහාසික පිරිවැය පදනම මත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත.

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත්තේ අධිකාරිය අපේක්ෂා කළ හැකි අනාගතය සඳහා අඛණ්ඩව පවතින්නේය යන පදනම මත ය.

ජාතික ඖෂධ නියාමන අධිකාරිය

මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

2.4 ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල් වර්ගය

මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත්තේ අධිකාරියේ ක්‍රියාකාරී මුදල් වර්ගය වන ශ්‍රී ලංකා රුපියල් වලින් ය.

2.5 ඇස්තමේන්තු සහ විනිශ්චයන් භාවිතා කිරීම

මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට යොදා ගන්නා විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන සහ කළමනාකරණය භාවිතා කරන ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වාර්තා කරන වත්කම්, බැරකම්, ආදායම් සහ වියදම් ප්‍රමාණයන් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් විසින් ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතවලට අනුකූලව යෙදීමට අවශ්‍ය වේ. සත්‍ය ප්‍රතිඵල එම ඇස්තමේන්තුවලට වඩා වෙනස් විය හැක.

ඇස්තමේන්තු සහ පහතින් දක්වා ඇති අඛණ්ඩ පදනමක් මත සමාලෝචනය කෙරේ. ඇස්තමේන්තු හා උපකල්පනවලට කරනු ලබන සංශෝධනයන් එම සංශෝධනය කරන කාල පරිච්ඡේදයට සහ ඕනෑම අනාගත කාල පරිච්ඡේදයකට බලපාන පරිදි සංශෝධනය කෙරේ.

ගිණුම්කරණ ප්‍රතිපත්ති ඉදිරිපත් කිරීමේදී මූල්‍ය ප්‍රකාශන තුලින් වටිනාකම් හඳුනා ගන්නා ලද , වඩාත්ම සැලකිය යුතු බලපෑමක් ඇති කරන ගනුදෙනු සම්බන්ධයෙන් තීරණාත්මක විනිශ්චයන් පහත සඳහන් පරිදි වේ.

- විශ්‍රාම ප්‍රතිලාභ වගකීම
- ක්ෂය කළ හැකි වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය

2.6 ප්‍රමාණාත්මකභාවය හා එකතු කිරීම්

සමාන අයිතමවල සෑම ප්‍රමාණාත්මක පන්තියක්ම මූල්‍ය ප්‍රකාශනවල වෙන වෙනම ඉදිරිපත් කර ඇත. අසමාන ස්වභාවයේ හෝ ක්‍රියාකාරී අයිතම ප්‍රමාණාත්මක නොවන්නේ වුව ද වෙන වෙනම ඉදිරිපත් කෙරේ.

2.7 සංසන්දනාත්මක තොරතුරු

සංසන්දනාත්මක තොරතුරු අවශ්‍ය විට ප්‍රවර්තන වර්ෂයේ ඉදිරිපත් කිරීම් තහවුරු කිරීම සඳහා නැවත වර්ගීකරණය කර ඇත.

3. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය

පහත දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති වර්ෂය තුළ අඛණ්ඩව අනුගමනය කරනු ලැබේ.

3.1 පිරියත සහ උපකරණ

3.1.1 හඳුනා ගැනීම සහ මැනීම

පිරියත සහ උපකරණ අයිතම මනිනු ලබන්නේ සමුච්චිත ක්ෂයවීම් සහ සමුච්චිත හානි වලින් අඩු කිරීමෙන්ය.

දේපල පිරියත සහ උපකරණවල සියලුම අයිතම ආරම්භයේදී පිරිවැයට හඳුනාගෙන ඇත. පිරියත සහ උපකරණවල පිරිවැයට වත්කම් අත්පත් කර ගැනීම සඳහා සෘජුවම අදාළ කර ගත හැකි වියදම් ඇතුළත් වේ. ආයතනය තුළ සාදන ලද වත්කම්වල පිරිවැයට ද්‍රව්‍යවල පිරිවැය සහ සෘජු ශ්‍රමය, වත්කම එහි අපේක්ෂිත භාවිතය සඳහා ක්‍රියාකාරී තත්ත්වයට ගෙන ඒම සඳහා සෘජුවම අදාළ කර ගත හැකි වෙනත් වියදම් ඇතුළත් වේ. අදාළ උපකරණවල ක්‍රියාකාරීත්වයට අත්‍යවශ්‍ය වන මිලදී ගත් මෘදුකාංග එම උපකරණයේ කොටසක් ලෙස ප්‍රාග්ධනීකරණය කර ඇත.

පිරියත සහ උපකරණවල කොටස් විවිධ ප්‍රයෝජනවත් ආයු කාලයක් ඇති විට, ඒවා පිරියත හා උපකරණවල වෙනම අයිතම (ප්‍රධාන සංරචක) ලෙස සලකනු ලැබේ.

3.1.2 පසුකාලීන පිරිවැය

පිරියත සහ උපකරණ අයිතමයක කොටසක් ප්‍රතිස්ථාපනය කිරීමේ පිරිවැය අයිතමයේ ධාරණ අගයෙන් හඳුනාගන්නා අතර, එම කොටස තුළ අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ අධිකාරිය වෙත ගලා යාමට ඉඩ ඇති අතර එහි පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකිය. ප්‍රතිස්ථාපනය කරන ලද කොටස්වල ධාරණ අගය වත්කම්වල පිරිවැයෙන් ඉවත් කරනු ලැබේ.

පිරියත සහ උපකරණවල එදිනෙදා සේවා සඳහා වන පිරිවැය, දරන ලද වියදම් ලෙස විස්තීරණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගෙන ඇත.

3.1.3 ක්ෂය වීම්

පිරියත හා උපකරණ අයිතමයේ එක් එක් කොටසෙහි අයිතමවල ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය සරල රේඛීය පදනමක් මත විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ ක්ෂයවීම් ලෙස හඳුනාගෙන ඇත. ප්‍රවර්තන සහ සංසන්දනාත්මක කාල පරිච්ඡේද සඳහා ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය පහත පරිදි වේ.

ගෘහ භාණ්ඩ සහ උපාංග	අවුරුදු 05
කාර්යාල උපකරණ	අවුරුදු 05
පරිගණක උපකරණ	අවුරුදු 04
ගොනු කිරීමේ ගබඩාව	අවුරුදු 05
රසායනාගාර උපකරණ	අවුරුදු 05
පරිගණක මෘදුකාංගය	අවුරුදු 04

වත්කම් ක්ෂය වීම ආරම්භ වන්නේ භාවිතයට ගන්නා අවස්ථාවේ සහ ක්ෂය කිරීම නතර කරනු ලබන්නේ වත්කම් ඉවත් කරන දිනය හෝ වත්කම විකිණීමට වෙන් කිරීමට යන දිනයට පෙර දින වේ.

ක්ෂයවීම් ක්‍රම, ප්‍රයෝජනවත් ජීවිත කාලය සහ සුන්බුන් අගයන්, වාර්තා කරන දිනයේදී නැවත තක්සේරු කෙරේ.

3.1.4 වත්කම් ඉවත් කිරීම්

දේපල, පිරියත සහ උපකරණ පොත්වලින් ඉවත් කරනු ලබන්නේ වත්කම ඉවත් කිරීමේ දිනට පසු හෝ තවදුරටත් අනාගත ආර්ථික ප්‍රතිලාභ ජනනය නොවන විටදීය. දේපල, පිරියත සහ උපකරණ ඉවත් කිරීම තුලින් ලාභය හෝ අලාභය, ඉවත් කිරීමෙන් පසු ලාභ අලාභ ප්‍රකාශනය ට ගලපනු ලැබේ.

3.2 මූල්‍ය උපකරණ

3.2.1 මූලික හඳුනාගැනීම සහ පසුකාලීන මිනුම්

මූල්‍ය උපකරණයක් යනු එක් ආයතනයක මූල්‍ය වත්කමක් සහ වෙනත් ආයතනයක මූල්‍ය වගකීමක් හෝ හිමිකම් උපකරණ සමග ඇති කරන ඕනෑම ගිවිසුමකි.

මූල්‍ය වත්කම් වර්ගීකරණය කරනු ලබන්නේ එහි මූලික හඳුනාගැනීම අනුව, ක්‍රමක්ෂය කරන ලද පසුව හඳුනාගැනීම, වෙනත් විස්තීර්ණ ආදායම් (OCI) හරහා සාධාරණ වටිනාකමට සහ ලාභ හෝ අලාභ ප්‍රකාශනය හරහා සාධාරණ අගයට වේ.

3.2.2 පසුකාලීන මිනුම්

මූල්‍ය වත්කම් පසුකාලීන මිනුම්වල අරමුණ අනුව වර්ග හතරකට වර්ගීකරණය කර ඇත.

i. ක්‍රමක්ෂය කරන ලද පිරිවැයට මූල්‍ය වත්කම් (ණය උපකරණ)
ii. සමුච්චිත ලාභ සහ අලාභ (ණය උපකරණ) ප්‍රතිවක්‍රීකරණය සමඟ වෙනත් විස්තීර්ණ ආදායම් (OCI) හරහා සාධාරණ වටිනාකමින් යුත් මූල්‍ය වත්කම්
iii. ඉවත්කිරීම් හා සමගම හඳුනාගැනීමෙන් පසු සමුච්චිත ලාභ සහ අලාභ ප්‍රතිවක්‍රීකරණය කිරීම සමඟ වෙනත් විස්තීර්ණ ආදායම් (OCI) හරහා සාධාරණ වටිනාකමකින් නිර්මාණය කර ඇති වත්කම් (හිමිකම් උපකරණ)
iv. ලාභ හෝ අලාභ ප්‍රකාශනය හරහා සාධාරණ වටිනාකමකින් යුත් මූල්‍ය වත්කම්.

3.2.3 ක්‍රමක්ෂය කරන ලද පිරිවැයට මූල්‍ය වත්කම් (ණය උපකරණ)

මෙම කාණ්ඩය අධිකාරියට වඩාත්ම අදාළ වන කාණ්ඩය වේ. පහත සඳහන් කොන්දේසි දෙකම සපුරා ඇත්නම් සමූහය විසින් මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය කරන ලද පිරිවැය යටතේ මනිනු ලැබේ.

මුදල් ප්‍රවාහයට එකතු කිරීම සඳහා ගිවිසුම්ගත මූල්‍ය වත්කම් තබා ගැනීමේ අරමුණින් මූල්‍ය වත්කම් ව්‍යාපාර ආකෘතියක් තුළ තබා ඇති අතර

ගිවිසුම්ගත මූල්‍ය වත්කම් මුදල් ප්‍රවාහයන් සඳහා මූලික වශයෙන් නිශ්චිත දිනවලදී ලැබියයුතු මූලික මුදල සහ නිශ්චිත දිනට ඒ මත ලැබියයුතු පොලී වටිනාකම නිරූපනය වේ.

ක්‍රමක්ෂය කරන ලද පිරිවැය යටතේ හඳුනා ගන්නා ලද මූල්‍ය වත්කම් පසුකාලීන මිනුම් කරනු ලබන්නේ ඵලදායී පොලී (EIR) ක්‍රමය යටතේ වන අතර ඒවා හානිකරණයට යටත් වේ. එම වත්කම් පොත්වලින් ඉවත් කිරීම, වෙනස්කම්වලට ලක් කිරීම හෝ හානිකරණය සිදුකරන විට එමගින් ඇතිවන ලාභ හෝ අලාභ, ලාභ හෝ අලාභ ප්‍රකාශනය තුල හඳුනා ගැනේ.

3.2.4 මූල්‍ය වත්කම් පොත්වලින් ඉවත් කිරීම

මූල්‍ය වත්කම් මූලික වශයෙන් පොත්වලින් ඉවත් කරනු ලබන්නේ එම වත්කම්වලින් මුදල් ප්‍රවාහ ලබා ගැනීමේ අයිතිය කල් ඉකුත් වූ පසුවය.

3.3 වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ

වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ ඒවායේ ඇස්තමේන්තුගත අයකර ගත හැකි වටිනාකම්වලින් දක්වා ඇත.

3.4 මුදල් සහ මුදල් සමාන දෑ

මුදල් සහ මුදල් හා සමාන මුදල් ශේෂයන් සහ ඉල්ලුම් තැන්පතු වලින් සමන්විත වේ. ඉල්ලුම මත ආපසු ගෙවිය යුතු සහ සහ අධිකාරියේ මුදල් කළමනාකරණයේ අනිවාර්ය අංගයක් වන බැංකු අයිරා මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුදල් සහ මුදල් සමාන දෑ වල අංගයක් ලෙස ඇතුළත් වේ. ප්‍රමිතයේ වගන්ති අංක 07 ට අනුකූලව වක්‍ර ක්‍රමය යටතේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කර ඇත.

3.5 තොග

තොග 'පළමුවෙන් ලැබීම් පළමු නිකුතු' යන පදනමින් අගය කරනු ලබන අතර යල් පැන ගිය සහ සෙමින් වලනය වන අයිතම සඳහා නියමිත දීමනාව ලබා දීමෙන් පසු අඩු කිරීමෙන් පසු ගණනය කරනු ලබන තොගවල ධාරන අගය හෝ නැවත අය කරගත හැකි ශුද්ධ වටිනාකමට පොත්වල හඳුනා ගනු ලැබේ.

3.6 වගකීම් සහ ප්‍රතිපාදන

මූල්‍ය තත්ත්වය ප්‍රකාශය මත ජංගම වගකීම් ලෙස වර්ගීකරණය කර ඇති වගකීම් යනු ඉල්ලුම් මත ගෙවීම් සඳහා හෝ වාර්තා කළ දින සිට වසරක් ඇතුළත ගෙවිය යුතු වගකීම් වේ. ජංගම නොවන වගකීම් යනු වාර්තා කළ දින සිට වසරකට පසුව ගෙවීමට නියමිත ශේෂයන් වේ.

හඳුනාගත් සියලුම වගකීම් ගිණුම්ගත කර ඇති අතර මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා ගණනයට ගෙන ඇත.

3.6.1 වෙන්කිරීම්

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස, අධිකාරියට විශ්වාසදායක ලෙස තක්සේරු කළ හැකි වර්තමාන නෛතික හෝ සාධනීය වගකීමක් තිබේ නම්, එම වගකීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ පිටතට ගලායාමක් අවශ්‍ය වේ නම්, ප්‍රතිපාදනයක් ලෙස හඳුනා ගනු ලැබේ.

3.7 සේවක ප්‍රතිලාභ

3.7.1 නිශ්චිත දායකත්ව සැලැස්ම

නිශ්චිත දායකත්ව සැලැස්මක් යනු පශ්චාත්-රැකියා ප්‍රතිලාභ සැලැස්මක් වන අතර ඒ යටතේ ආයතනයක් වෙනම ආයතනයකට ස්ථාවර දායක මුදල් ගෙවන අතර තවදුරටත් මුදල් ගෙවීමට නීතිමය හෝ සාධනීය බැඳීමක් නොමැත. නිර්වචනය කරන ලද දායකත්ව විශ්‍රාම වැටුප් සැලසුම් සඳහා වන වගකීම් දායක මුදල් ගෙවීමට නියමිත විට විස්තීරණ ආදායමේ ප්‍රකාශයේ සේවක ප්‍රතිලාභ වියදමක් ලෙස පිළිගැනේ. පෙර ගෙවන ලද දායක මුදල් ආපසු ගෙවීමක් හෝ තවදුරටත් ගෙවීම්වල අඩුවීමක් ඇති ප්‍රමාණයට වත්කමක් ලෙස පිළිගනු ලැබේ.

අධිකාරිය සේවකයින්ගේ දළ වැටුපෙන් 12% සහ 3% පිළිවෙළින් අර්ථසාධක අරමුදල (EPF) සහ භාර අරමුදල (ETF) දායකත්වය ලෙස දායක වේ.

3.7.2 නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම

නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මක් යනු නිර්වචනය කළ දායක සැලැස්මකට වඩා පශ්චාත් රැකියා ප්‍රතිලාභ සැලැස්මකි. නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම සඳහා වන වගකීම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුල හඳුනා ගනු ලබමින් නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මෙහි වාර්තා කරනු ලබන දිනයේ දී වර්තමාන වටිනාකමට අනුව වේ. නිශ්චිත ප්‍රතිලාභ වගකීම ප්‍රක්ෂේපිත ඒකක බැරකම් ක්‍රමය අනුව වාර්ෂිකව ගණනය කරනු ලබන්නේ LKAS 19 මගින් නිර්දේශ කර ඇති පරිදි සුදුසුකම් සහිත තක්සේරුකරුවෙකු විසිනි. නිශ්චිත ප්‍රතිලාභ වගකීමේ වර්තමාන වටිනාකම තීරණය කරනු ලබන්නේ පොළී අනුපාතිකය භාවිතා කරමින් ඇස්තමේන්තුගත මුදල් ප්‍රවාහයන් වට්ටම් කිරීමෙන් සහ ප්‍රතිලාභ ගෙවනු ලබන්නේ වගකීම් කොන්දේසි වලට කල්පිරුණු පසුවය.

1983 අංක 12 දරණ පාරිතෝෂික පනතට අනුකූලව සේවකයින්ගේ අඛණ්ඩ සේවය වසර පහක් සම්පූර්ණ කිරීමෙන් පසු විශ්‍රාම පාරිතෝෂික සඳහා මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසනු ලැබේ.

3.8 වෙළඳ සහ ගෙවිය යුතු වෙනත් දෑ

වෙළඳ සහ ගෙවිය යුතු අනෙකුත් දෑ පිරිවැයට සඳහන් කර ඇත.

3.9 ආදායම

3.9.1 සේවාවන්

සපයනු ලබන සේවාවන්හි ආදායම් වාර්තා කරන දිනට ගනුදෙනු වක්‍රය සම්පූර්ණ කිරීම සහ අවදානම් සහ ප්‍රතිලාභ පැවරීම අනුව විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ හඳුනා ගැනේ.

3.9.2 පොලී ආදායම්

ආදායම් ප්‍රකාශයේ එකතු උපචිත පදනමින් පොලී ආදායම් හඳුනා ගැනේ. දිගු කාලීන මූල්‍ය උපකරණවල පොලී ආදායම් ඵලදායී පොලී අනුපාතය (EIR) භාවිතයෙන් වාර්තා කෙරේ.

3.10 රජයේ ප්‍රදාන

රජයේ ප්‍රදානයන් යනු ආයතනයකට සම්පත් මාරු කිරීමේ ආකාරවලින් රජයෙන් ලැබෙන ආධාරය.

වත්කම්වලට අදාළ රජයේ ප්‍රදාන, සාධාරණ වටිනාකමින් යුත් මූල්‍ය නොවන ප්‍රදාන, විලම්බිත ආදායමක් ලෙස පිහිටුවීමෙන් හෝ වත්කම් ධාරන අගයට ගණනයේදී ප්‍රදානය අඩු කිරීමෙන් මූල්‍ය තත්ත්වය ප්‍රකාශයේ ඉදිරිපත් කළ යුතුය.

3.11 වියදම්

ව්‍යාපාරය පවත්වාගෙන යාමේදී දරන ලද සියලුම වියදම් වර්ෂය සඳහා ලාභය ගණනයේදී විස්තීරණ ආදායම් ප්‍රකාශනයට සටහන් කරනු ලැබේ.

3.12 විදේශ මුදල් ගනුදෙනු

අධිකාරිය විසින් විදේශ මුදල් ගනුදෙනු මුලිකව වාර්තා කරනු ලබන්නේ ගනුදෙනුව හඳුනා ගැනීම සඳහා ප්‍රථමයෙන් සුදුසුකම් ලබන දිනයේ ඔවුන්ට අදාළ ක්‍රියාකාරී මුදලේ ස්ථානීය අනුපාතයට අනුවයි.

වාර්තා කරන දිනයේදී විදේශීය මූල්‍ය වත්කම් සහ වගකීම් පරිවර්තනය කරනු ලබන්නේ ක්‍රියාකාරී විනිමයන්හි ස්ථානීය අනුපාතවලට අනුවයි.

3.13 බදු වියදම්

ආදායම් බදු වියදම ප්‍රවර්තන සහ විලම්බිත බදු වලින් සමන්විත වේ. නිමිකම් වශයෙන් සෘජුවම පිළිගත් අයිතමයට අදාළ වන ප්‍රමාණයට හැර, ආදායම් බදු වියදම විස්තීරණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගනු ලබයි.

3.13.1 ප්‍රවර්තන බද්ද

ප්‍රවර්තන බද්ද යනු වාර්තා කරන දිනයේ දී පනවන ලද හෝ සැලකිය යුතු ලෙස පනවන ලද බදු අනුපාත භාවිතා කරමින්, සහ පෙර කාල සීමාවන් සම්බන්ධයෙන් ගෙවිය යුතු බදු සඳහා යම් ගැලපීමක් භාවිතා කරමින් කාල සීමාව සඳහා බදු අය කළ හැකි ආදායම මත ගෙවිය යුතු අපේක්ෂිත බද්දයි.

2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන සහ එහි සංශෝධනවලට අනුව අධිකාරියේ බදු වගකීම් ගණනය කර ඇත.

3.13.2 විලම්බිත බදු

විලම්බිත බදු, වගකීම් ක්‍රමය භාවිතා කර හඳුනාගෙන ඇති අතර, මූල්‍ය වාර්තාකරණ අරමුණු සඳහා වත්කම් සහ වගකීම් හි ධාරණ අගය ප්‍රමාණයන් සහ බදුකරණ අරමුණු සඳහා භාවිතා කරන ප්‍රමාණයන් අතර තාවකාලික වෙනස්කම් සඳහා සපයයි.

පහත සඳහන් තාවකාලික වෙනස්කම් සඳහා විලම්බිත බදු හඳුනා නොගනී. ව්‍යාපාර සංයෝජනයක් නොවන ගනුදෙනුවක වත්කම් හෝ වගකීම් මූලික වශයෙන් හඳුනා ගැනීම සහ ගිණුම්කරණයට හෝ බදු ගෙවිය හැකි ලාභයට හෝ අලාභයට බලපාන්නේ නැත.

තාවකාලික වෙනස්කම් භාවිතා කළ හැකි අනාගත බදු අය කළ හැකි ලාභ ලබා ගත හැකි ප්‍රමාණයට විලම්බිත බදු වත්කම් හඳුනාගෙන ඇත. විලම්බිත බදු වත්කම් සෑම වාර්තාකරණ දිනයකදීම සමාලෝචනය කරනු ලබන අතර අදාළ බදු ප්‍රතිලාභය සාක්ෂාත් කර ගැනීමට තවදුරටත් හැකියාවක් නොමැති ප්‍රමාණයට අඩු කරනු ලැබේ.

3.14 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

LKAS 7 "මුදල් ප්‍රවාහ ප්‍රකාශය" අනුව "වක්‍ර ක්‍රමය" භාවිතා කරමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කර ඇත.ගෙවන පොලී මෙහෙයුම් මුදල් ප්‍රවාහ ලෙසත්, ලැබෙන පොලී ආයෝජන මුදල් ප්‍රවාහ ලෙසත්, භාණ්ඩාගාර බද්ද මූල්‍ය මුදල් ප්‍රවාහ ලෙසත් මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඉදිරිපත් කිරීමේදී වර්ග කෙරේ.

3.15 බැඳීම් සහ අසම්භාව්‍යයන්

අසම්භාව්‍යයන් යනු අතීත සිදුවීමකින් පැන නගින වත්කම් හෝ බැඳීම් වන අතර අධිකාරියේ පාලනයෙන් ඔබ්බට ඇති අවිනිශ්චිත අනාගත සිදුවීම් ඇතිවීම හෝ ඇති නොවීම මත පමණක් තහවුරු වේ.

3.16 සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු

අසම්භාව්‍යයන් යනු අතීත සිදුවීමෙන් පැන නගින වත්කම් හෝ බැඳීම් වන අතර එය තහවුරු වන්නේ සමූහයේ සම්පූර්ණයෙන්ම පාලනයට යටත් නොවන අවිනිශ්චිත අනාගත සිදුවීමක් ඇතිවීම හෝ ඇති නොවීම මත පමණි.

3.17 වාර්තා කළ දිනට පසු සිදුවීම්

වාර්තා කරන දිනට පසු සියලුම වැදගත් සිදුවීම් සලකා බලා ඇති අතර මූල්‍ය ප්‍රකාශනවල සටහන්වල සුදුසු ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් සිදු කර ඇත.

2 දේපල, පිරියත සහ උපකරණ

පිරිවැය	පිරවුම් ගබඩාව රු.	රසායනාගාරය උපකරණ රු.	ගෘහ භාණ්ඩ සහ සවි කිරීම් රු.	කාර්යාල උපකරණ රු.	පරිගණක උපකරණ රු.	පරිගණක මෘදුකාංග රු.	එකතුව රු.
2019 ජනවාරි 01 දිනට සංශෝධිත ශේෂය	15,257,976	9,451,740	2,084,965	5,319,876	7,915,653	224,400	40,583,935
නිවැරදි කිරීම - කෙරීගෙන යන වැඩ	-	-	-	-	-	-	(329,325)
වර්ෂය තුළ එකතු කිරීම්	-	31,436,266	714,659	852,070	170,500	-	33,173,495
2019 දෙසැම්බර් 31 දිනට ශේෂය	15,257,976	40,888,006	2,799,624	6,171,946	8,086,153	224,400	73,428,105
2020 ජනවාරි 01 දිනට සංශෝධිත ශේෂය	15,257,976	40,888,006	2,799,624	6,171,946	8,086,153	224,400	73,428,105
නිවැරදි කිරීම - කෙරීගෙන යන වැඩ							-
වර්ෂය තුළ එකතු කිරීම්	-	9,789,666	1,602,640	1,988,433	3,853,610	549,000	17,783,349
2020 දෙසැම්බර් 31 දිනට ශේෂය	15,257,976	50,677,672	4,402,264	8,160,379	11,939,763	773,400	91,211,454
2021 ජනවාරි 01 දිනට සංශෝධිත ශේෂය	15,257,976	50,677,672	4,402,264	8,160,379	11,939,763	773,400	91,211,454
නිවැරදි කිරීම - කෙරීගෙන යන වැඩ		64,275,375			(123,120)		64,152,255
වර්ෂය තුළ එකතු කිරීම්	-		6,881,019.25	9,088,839	149,250	6,277,880	22,396,988
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය	15,257,976	114,953,047	11,283,283	17,249,218	11,965,893	7,051,280	177,760,697
සමුච්චිත ක්ෂයවීම්							
2020 දෙසැම්බර් 31 දිනට ශේෂය	9,765,104	17,806,655	2,054,421	4,252,765	7,188,694	251,456	41,319,095
2021 ජනවාරි 01 දිනට සංශෝධිත ශේෂය	9,765,104	17,806,655	2,054,421	4,252,765	7,188,694	251,456	41,319,095
පෙර වර්ෂ නිවැරදි කිරීම				16,211	(6,831)		9,380
වර්ෂය සඳහා අය කිරීම	3,051,595	11,473,871	2,023,543	2,559,425	2,058,353	703,749	21,870,537
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය	12,816,699	29,280,526	4,077,964	6,828,400	9,240,216	955,205	63,199,011
ඉදිරියට ගෙන යාම							
2021 දෙසැම්බර් 31 දිනට	**2,441,277**	**85,672,521**	**7,205,319**	**10,420,818**	**2,725,677**	**6,096,075**	**114,561,686**

මේ වන විට අධිකාරිය සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයට අයත් ගොඩනැගිලි, වාහන සහ වෙනත් වත්කම් වැනි යටිතල පහසුකම් භාවිතා කරමින් සිටින අතර අධිකාරිය එම වත්කම් තමන් වෙත පවරා ගැනීමට කටයුතු කරමින් සිටී.

ජාතික ඖෂධ නියාමන අධිකාරිය

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන

දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා,		2021	2020
		රු.	රු.
2.1	**කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ**		
	කෙරීගෙන යන පොදු ඇඟිලි සලකුණු ස්කෑනර්		-
	කෙරීගෙන යන මහජන ඇමතුම් පද්ධතිය සඳහා පිරිවැය		543,591
	කෙරීගෙන යන සීසීටීවී පද්ධතිය සඳහා පිරිවැය		4,658,794
	කෙරීගෙන යන නාරහෙන්පිට ගොඩනැගිල්ල සඳහා පිරිවැය		215,484
	කෙරීගෙන යන ආරක්ෂක ප්‍රවේශය සඳහා පිරිවැය		182,750
		-	**5,600,619**
3	**තොගය**		
	ආරම්භක තොගය	1,655,865	1,992,864
	වර්ෂය සඳහා මිලදී ගැනීම්	3,960,087	1,773,231
		5,615,952	3,766,095
	උපයෝජනය	(3,668,868)	2,110,230
	අවසන් තොගය	1,947,084	**1,655,865**
4	**තැන්පතු සහ වෙනත් ලැබිය යුතු දෑ**		
	ඉන්ධන සඳහා තැන්පතුව	50,000	50,000
	වෙනත් ලැබිය යුතු දෑ		5,550
	පෙරගෙවුම්	1,019,375	62,000
	උත්සව අත්තිකාරම්	(1,500)	126,000
	ලැබිය යුතු අත්තිකාරම්		5,000
	ගොඩනැගිලි කුලී	13,500,000	13,500,000
	ලැබිය යුතු ආපදා ණය	1,926,540	8,796,260
	පානීය ජලය සඳහා තැන්පතුව	67,000	
	මුළු තැන්පතු සහ පෙරගෙවුම්	**16,561,415**	**22,544,810**
5	**කෙටිකාලීන ආයෝජන**		
	ආරම්භක ශේෂය	3,149,130,138	2,479,226,476
	වර්ෂය සඳහා ආයෝජනය	299,999,999	492,250,737
	වර්ෂය සඳහා පොළිය	148,182,620	177,652,925
	ආයෝජන කල්පිරීම්	(1,455,660,702)	
		2,141,652,055	**3,149,130,138**
6	**මුදල් සහ මුදල් සමාන දෑ**		
	BOC ජංගම සහ ඉතිරිකිරීමේ ගිණුම(ZIBA)	1,624,514,939	129,108,496
	සුළු මුදල්	-	3
	මුළු මුදල් හා මුදල් සමාන දෑ	**1,624,514,939**	**129,108,499**
7	**ප්‍රාග්ධන ප්‍රදාන**		
	ප්‍රාග්ධන ප්‍රදාන	5,920,019	1,500,266
	ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය		(1,342,902)
	මුළු ප්‍රාග්ධන ප්‍රදාන	**5,920,019**	**157,364**
8	**විලම්බිත බදු වගකීම**		
	දේපල පිරියත සහ උපකරණවල වටිනාකම් ගිණුම්වලින්ලියා හැරීම	114,561,684	49,892,359
	දේපල පිරියත සහ උපකරණවල බදු පදනම	(66,389,022)	24,526,336
	බදු අය කළ හැකි තාවකාලික වෙනස	48,172,661	25,366,023
	බදු @ 28%	13,488,345	7,102,486
	වර්ෂය අවසානයේදී විලම්බිත වගකීම	13,488,345	**7,102,486**
	වර්ෂය ආරම්භයේදී විලම්බිත වගකීම	(7,102,486)	2,971,330
	වර්ෂය තුළ විලම්බිත බද්දක් ලෙස අයකිරීම	**6,385,859**	**4,131,156**

ජාතික ඖෂධ නියාමන අධිකාරිය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන

		2021	2020
		රු.	රු.
9	**අත්තිකාරම් ලැබීම්**		
	කලින් ලැබුණු ගාස්තු	72,972,666	72,972,666
	වර්ගීකරණය කළ යුතු තැන්පතු	11,894,247	2,628,262
	වැඩිපුර ගෙවීම්	2,318,598	1,101,582
	මුළු අත්තිකාරම් ලැබීම්	87,185,512	**76,702,510**

		2021	2020
		රු.	රු.
10	**ගෙවිය යුතු වැට්**		
	ආරම්භක ශේෂය	68,856,674	63,915,809
	වර්ෂය සඳහා වැට්	100,323,931	-
	වර්ෂය සඳහා වැට් යෙදවුම්	(3,089,222)	72,768,399
	වැට් යෙදවුම්		(3,199,478)
	වෙනත් ගැලපීම්	303,335	29,051,265
	වර්ෂය සඳහා ගෙවීම්	(113,931,000)	(92,967,074)
	පෙර වර්ෂ නිවැරදි කිරීම්		(712,247)
	ගෙවිය යුතු වැට්	52,463,719	**68,856,674**
11	**ගෙවිය යුතු මුද්දර බදු**		
	ආරම්භක ශේෂය	22,747,938	6,181,736
	වර්ෂය සඳහා මුද්දර බදු	45,019,763	22,747,938
	වර්ෂය සඳහා ගෙවීම්	(37,467,813)	(6,978,956)
	පෙර වර්ෂ නිවැරදි කිරීම්		797,220
	ගෙවිය යුතු මුද්දර බදු	30,299,888	**22,747,938**
12	**භාණ්ඩාගාර බදු සඳහා වෙන්කිරීම්**		
	බදු පසු ශුද්ධ ආදායම	967,735,433	673,604,866
	වර්ෂය සඳහා 30% වෙන්කිරීම්	400,000,000	67,360,487
	ආරම්භක ශේෂය	146,929,966	79,569,479
	වර්ෂය සඳහා ගෙවීම්	(146,929,966)	
		400,000,000	**146,929,966**
13	**උපචිත වියදම් සහ අනෙකුත් ගෙවිය යුතු දෑ**		
	ගෙවිය යුතු ගිණුම්	9,636,600	9,198,979
	උපචිත වියදම්	4,180,765	129,950
	වෙනත් ගෙවිය යුතු දෑ	1,794,043	-
	රඳවා ගැනීමේ තැන්පතුව	108,646	14,977
	ගෙවිය යුතු EPF		13,607
	ගෙවිය යුතු ETF		2,041
	ගෙවිය යුතු අයලාභීන්		-
	ගෙවිය යුතු විශ්‍රාම වැටුප්		104,087
	ගෙවිය යුතු ද්විතීයනය දීමනා	21,235	79,794
			2,150,728
	ගෙවිය යුතු විගණන ගාස්තු	2,400,000	2,223,000
	ගෙවිය යුතු කමිටු සහ ඇගයීම් දීමනා	117,475	179,475
	MOH කාර්ය මණ්ඩල වැටුප් සඳහා ආයකත්වය	83,069,743	41,500,000
	ගෙවිය යුතු වැටුප්		62,543
	ගෙවිය යුතු වැන්දඹු හා අනත්දරු දීමනා		12,148
	මුළු උපචිත වියදම්	**101,328,507**	**55,671,329**

ජාතික ඖෂධ නියාමන අධිකාරිය

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන

		2021	2020
		රු.	රු.
14	ආදායම		
	ඖෂධ සාම්පල බලපත්‍ර ආදායම	7,835,689	889,460
	උපාංග සාම්පල බලපත්‍ර ආදායම	9,702,717	7,956,394
	රූපලාවණ්‍ය සාම්පල බලපත්‍ර ආදායම	468,800	278,800
	සීමාසහිත සාම්පල බලපත්‍ර ආදායම	598,164	747,821
	ඖෂධ ආනයන බලපත්‍ර ආදායම	128,877,215	65,457,634
	උපාංග ආනයන බලපත්‍ර ආදායම	95,323,161	44,851,068
	රූපලාවන්‍ය ආනයන බලපත්‍ර ආදායම	8,012,734	4,344,000
	සීමාසහිත ආනයන බලපත්‍ර ආදායම	1,388,942	767,295
	ඖෂධ නිෂ්පාදන බලපත්‍ර ආදායම් ඒ	10,894,168	4,937,907
	ඖෂධ නිෂ්පාදන බලපත්‍ර ආදායම් බී	161,990	
	උපාංග නිෂ්පාදන බලපත්‍ර ආදායම් ඒ	1,147,073	382,264
	උපාංග නිෂ්පාදන බලපත්‍ර ආදායම් බී	415,305	
	රූපලාවන්‍ය නිෂ්පාදන බලපත්‍ර ආදායම	401,000	334,000
	ඖෂධ ලියාපදිංචි කිරීමේ ආදායම FR දේශීය ඒ	686,488	82,769,330
	ඖෂධ ලියාපදිංචි කිරීමේ ආදායම FR දේශීය බී	20,289	
	ඖෂධ ලියාපදිංචි කිරීමේ ආදායම් FR විදේශීය	10,511,017	
	ඖෂධ ලියාපදිංචි කිරීමේ ආදායම PR දේශීය ඒ	4,885,524	
	ඖෂධ ලියාපදිංචි කිරීමේ ආදායම PR දේශීය බී	61,069	
	ඖෂධ ලියාපදිංචි කිරීමේ ආදායම PR විදේශීය	103,457,358	
	උපාංග ලියාපදිංචි කිරීමේ ආදායම FR දේශීය ඒ	823,018	48,962,225
	උපාංග ලියාපදිංචි කිරීමේ ආදායම FR දේශීය බී	81,072	
	උපාංග ලියාපදිංචි කිරීමේ ආදායම FR විදේශීය	15,491,862	
	උපාංග ලියාපදිංචි කිරීමේ ආදායම PRදේශීය ඒ	687,715	
	උපාංග ලියාපදිංචි කිරීමේ ආදායම PR දේශීය බී	593,769	
	උපාංග ලියාපදිංචි කිරීමේ ආදායම PR විදේශීය	102,588,782	
	රූපලාවන්‍ය ලියාපදිංචි කිරීමේ FR විදේශීය	3,120,500	6,147,500
	රූපලාවන්‍ය ලියාපදිංචි කිරීමේ FR දේශීය	48,000	
	රූපලාවන්‍ය ලියාපදිංචි කිරීමේ PR විදේශීය	7,217,344	
	රූපලාවන්‍ය ලියාපදිංචි කිරීමේ PR දේශීය	547,500	
	රූපලාවන්‍ය ලියාපදිංචි කිරීමේ අලුත් කිරීම	57,500	
	සීමාසහිත ලියාපදිංචි කිරීමේ ආදායම PR විදේශීය	1,470,583	1,231,297
	සීමාසහිත ලියාපදිංචි කිරීමේ ආදායම PR දේශීය	19,987	
	රසායනාගාර පරීක්ෂණය	10,483,170	8,519,342
	ඖෂධ සැකසුම් ගාස්තු දේශීය ඒ	9,346,269	83,960,364
	ඖෂධ සැකසුම් ගාස්තු දේශීය බී		
	ඖෂධ සැකසුම් MP විදේශීය	10,464,835	
	ඖෂධ සැකසුම් ඒකාබද්ධ	913,496	
	ඖෂධ සැකසුම් New Dosage	304,019	
	ඖෂධ සැකසුම් Foreing	28,718,995	
	ඖෂධ සැකසුම් ගාස්තු අලුත් කිරීම් දේශීය ඒ	1,930,959	
	ඖෂධ සැකසුම් ගාස්තු අලුත් කිරීම් විදේශීය	29,505,191	
	ඖෂධ සැකසුම් ගාස්තු චිකිත්සක	16,224,433	
	ඖෂධ සැකසුම් ගාස්තු NCE	6,944,235	
	ඖෂධ සැකසුම් ගාස්තු NCE පොලි	3,343,032	
	උපාංග සැකසුම් ගාස්තු දේශීය ඒ	3,326,424	122,948,986.14
	උපාංග සැකසුම් ගාස්තු දේශීය බී	2,015,922	
	උපාංග සැකසුම් ගාස්තු MP විදේශීය	21,941,608	
	උපාංග සැකසුම් ගාස්තු විදේශීය	34,849,066	
	උපාංග සැකසුම් ගාස්තු අලුත් කිරීම් දේශීය ඒ	98,310	
	උපාංග සැකසුම් ගාස්තු අලුත් කිරීම් දේශීය බී	9,459	

14 ආදායම් Cont.....

ජාතික ඖෂධ නියාමන අධිකාරිය

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන

උපාංග සැකසුම් ගාස්තු අලුත් කිරීම විදේශීය	17,379,972	
රූපලාවන්‍ය සැකසුම් ගාස්තු	1,356,000	976,500
සීමාස්ථ සැකසුම් ගාස්තු විදේශීය	10,718,145	3,247,209
සීමාස්ථ සැකසුම් ගාස්තු දේශීය	447,808	
සීමාස්ථ සැකසුම් ගාස්තු විදේශීය බොලී සඳහා	16,973,578	
සායනික පරීක්ෂණ සැකසුම් ගාස්තු	1,361,039	93,958
ඖෂධ ප්‍රචාරණ ගාස්තු	805,313	372,257
සිල්ලර ෆාමසි බලපත්‍ර ආදායම	43,174,597	1,873,949
තොග ෆාමසි බලපත්‍ර ආදායම්	36,125,829	375,784
ප්‍රවාහන ෆාමසි බලපත්‍ර ආදායම	18,041,828	17,806,634
ඖෂධ WOR	3,167,994	28,463,728
උපාංග WOR	21,055,896	15,614,479
සීමාස්ථ WOR		93,399
GMP උපාංග දේශීය Repac	40,427	-
උපාංග GMP - දේශීය ඒ	442,903	588,194
උපාංග GMP - දේශීය බී	944,952	
උපාංග GMP - දේශීය ඒ	560,702	23,966,690
උපාංග GMP -දේශීය බී	179,238	
ඖෂධ WHO පරීක්ෂාව	486,887	245,365
උපාංග WHO පරීක්ෂාව	383,507	74,798
උපාංග COPP සහතිකය	49,902	261,557
අතිරේක ඖෂධ විදේශීය	85,536,487	126,286,003
අතිරේක ඖෂධ දේශීය ඒ	5,588,762	90,134,252
අතිරේක ඖෂධ දේශීය බී	1,477,119	
අතිරේක ඖෂධ විචලනය	14,504,402	
අතිරේක ඖෂධ MP	2,285,117	
අතිරේක ඖෂධ උපාංග විදේශීය	89,334,411	
අතිරේක ඖෂධ උපාංග දේශීය ඒ	1,774,416	
අතිරේක ඖෂධ උපාංග දේශීය බී	472,763	
අතිරේක ඖෂධ උපාංග විචලනය	2,894,477	
අතිරේක ඖෂධ සීමාස්ථ - විදේශීය	5,644,946	3,118,960
අතිරේක ඖෂධ සීමාස්ථ දේශීය	80,574	
නියෝජිතායතන මාරු කිරීම්	35,581,888	31,933,754
උපාංග නොමිලේ විකුණුම් සහතික	152,249	46,288
පැහැදිලි කිරීම්		-
උපාංග පැහැදිලි කිරීම්	1,476,411	719,174
ඖෂධ පැහැදිලි කිරීම්	963,678	48,699
උපාංග සංශෝධනය	1,118,013	1,007,820
ඖෂධ සංශෝධනය	1,333,413	3,911,282
රූපලාවන්‍ය සංශෝධනය	65,000	98,000
සීමාස්ථ සංශෝධනය	79,495	
ඖෂධ සැකසුම් අනුමැතිය	2,644,301	850,679
සීමාස්ථ සැකසුම් අනුමැතිය		112,914
සීමාස්ථ ප්‍රචාරණය	399,740	
උපාංග ප්‍රචාරණය	2,032,505	
උපාංග අනුපිටපත් සහතික	99,361	
ඖෂධ නොමිලේ විකුණුම්		36,697
රූපලාවන්‍ය අලුත් කිරීම		150,000
ස්වයංක්‍රිය ආදායම	125,505,536	71,277,943
2018 · අත්තිකාරම් ලැබීම් ආදායම	-	20,307,230
2019 · අත්තිකාරම් ලැබීම් ආදායම	-	129,861,944
මුළු ආදායම	**1,252,757,342**	**1,059,441,826**

19

ජාතික ඖෂධ නියාමන අධිකාරිය

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන

		2021	2020
		රු.	රු.
15	වෙනත් ආදායම්		
	ටෙන්ඩර් ඉල්ලුම් පත් ගාස්තු	12,000	15,000
	අනෙකුත් ආදායම්	39,901	-
	සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම්	285,000	444,000
	විභාග ගාස්තු ආදායම්		594,000
	ආපදා ණය පොලී	311,289	186,604
	ඉතුරුම් ගිණුම් පොලී	8,204,860	-
		8,853,050	**1,239,604**
16	පරිපාලන වියදම්		
	ක්ෂය වීම්	21,870,537	17,515,637
	ජලය	483,928	252,597
	විදුලිය	6,691,499	6,913,019
	දුරකථන	1,944,800	1,339,143
	තැපෑල් ගාස්තු	138,763	181,705
	ලිපි ද්‍රව්‍යය	3,668,868	2,110,230
	ගමන් වියදම් - දේශීය -	15,662,199	5,967,566
	ගමන් වියදම් - විදේශීය -		32,823
	පුහුණු හා සංවර්ධන වියදම්	1,259,700	1,054,847
	ඉන්ධන වියදම්	1,452,280	2,449,145
	ආරක්ෂක ගාස්තු	6,362,757	3,998,503
	ලේඛන හැසිරවීමේ ගාස්තු	1,559,470	1,474,015
	ප්‍රකාශන, පරිවර්තන සහ ප්‍රචාරණ ගාස්තු	3,765,858	5,485,127
	පවිත්‍රතා සේවා	3,603,950	3,883,700
	වාහන නඩත්තුව	5,630,350	3,251,319
	රසායනාගාර උපකරණ නඩත්තු	9,257,490	6,453,384
	ගිනි නිවන උපකරණ නඩත්තු	113,800	12,500
	වායු සමීකරණ නඩත්තු	108,100	566,235
	ගොඩනැගිලි නඩත්තු	7,782,372	1,599,802
	පරිගණක අයිතම සහ අනෙකුත් නඩත්තු කිරීම්	2,463,240	6,880,627
	වෙබ් අඩවිය නඩත්තු	45,920	458,200
	කාර්යාල උපකරණ නඩත්තු	541,947	619,709
	මෘදුකාංග සහ පැකේජ නඩත්තු	3,931,022	232,563
	යහ නිෂ්පාදන පුහුණුවීම් සඳහා වියදම්		7,178,988
	WHO රැස්වීම් වියදම්		-
	සම්මන්ත්‍රණ ශාලාව වෙන්කර ගැනීම්	429,910	1,134,920
	ගාස්තු සහ බදු	495,670	475,999
	විගණන ගාස්තු	1,200,000	1,200,000
	අධිකරණ වෛද්‍ය විගණන ගාස්තුව		3,200,000
	සාම්පල පරීක්ෂණ වියදම්	16,072	23,204
	පොත්, සඟරා සහ තොරතුරු	929,200	3,308,791
	උපදේශන ගාස්තුව		23,301
	සනීපාරක්ෂක අයිතම වියදම්		29,115
	ගොඩනැගිලි කුලී	16,200,000	2,700,000
	පරිභෝජන වියදම්	227,338	531,190
	Covid 19 වියදම්	1,390,212	819,485
	සම්මුඛ පරීක්ෂණ ගාස්තු	24,210	26,400
	වාහන රක්ෂණය	545,495	573,784
	වාහන ගාල්කිරීමේ ගාස්තු	15,975	26,855
	එකතුව	**119,812,930**	**93,984,429**

ජාතික ඖෂධ නියාමන අධිකාරිය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන

		2021 රු.	2020 රු.
17	**වැටුප් සහ වේතන**		
	වැටුප් සහ වේතන	35,621,594	32,089,561
	වෙනත් දීමනා	49,042,457	14,360,516
	MOH කාර්ය මණ්ඩල වැටුප්	51,727,213	82,675,993
	අතිකාල සහ 1/20 ගෙවීම	8,236,021	7,319,886
	ද්විතියනය දීමනා	187,721	1,326,781
	විශ්‍රාම වැටුප් සඳහා දායකත්වය	73,553	1,217,983
	සේවක අර්ථසාධක අරමුදල සඳහා දායකත්වය	3,896,579	3,556,390
	සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල සඳහා දායකත්වය	974,145	889,097
	W & OP සඳහා දායකත්වය		-
	ජාතික රක්ෂණ භාර අරමුදල ඊ		-
	පාරිතෝෂික වියදම්	683,972	1,257,060
	කාර්ය මණ්ඩල ප්‍රසාද දීමනා	1,939,213	2,037,317
	එකතුව	152,382,467	**146,730,584**
18	**වෙනත් වියදම්**		
	සංග්‍රහ වියදම් සහ අනෙකුත් වියදම්	2,331,483	1,175,826
	බැංකු ගාස්තු		500
	කාර්ය මණ්ඩල තේ	2,237,601	1,662,271
	නීති වියදම්	1,061,500	1,733,570
	කමිටු සඳහා ගෙවීම්	4,703,734	1,820,033
	විවිධ වියදම්	99,748	104,726
	Dossiers සමාලෝචනය සඳහා විශේෂඥ වියදම්		1,534,966
	අධිභාර	13,216	-
	COVID 19 අරමුදල සඳහා පරිත්‍යාග කිරීම		50,000,000
	තක්සේරු ගාස්තුව		488,220
	සායනික පාලන ගිණුම		85,000
	සංයුක්ත සැලසුම් වියදම්	1,519,987	
	යෝජිත නාරාහේන්පිට ගොඩනැගිල්ලේ මූලික අවශ්‍යතා සඳහා වියදම්	215,484	
	එකතුව	**12,182,753**	**58,605,113**

ජාතික ඖෂධ නියාමන අධිකාරිය

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන

		2021	2020
		රු.	රු.
19	**වර්ෂය සඳහා ආදායම් බදු**		
19.2	වර්ෂය සඳහා ආදායම් බදු වියදම්	151,836,233	262,621,108
	වර්ෂය සඳහා විලම්බිත බදු වියදම්	6,385,859	4,131,156
	වර්ෂය සඳහා බදු වියදම්	158,222,092	**266,752,264**
19.2	බදුවලට පෙර ශුද්ධ ආදායම්	1,125,414,862	940,357,130
	එකතු කළා: ඉඩදිය නොහැකි වියදම්	24,202,020	24,202,020
	අඩු කළා: ඉඩදිය හැකි වියදම්	(65,072,359)	(65,072,359)
	අඩු කළා : ආදායම් බද්දට යටත් නොවන ආදායම්		-
	වර්ෂය සඳහා ගැලපන ලද ලාභය	1,084,544,523	899,486,791
	බදු වලට යටත් වන වෙනත් ලාභ සහ ආදායම්		-
	මුළු ව්‍යවස්ථාපිත ආදායම් / බදු අය කළ හැකි ආදායම්	1,084,544,523	899,486,791
	වර්ෂය සඳහා ආදායම් බදු	151,836,233	251,856,301
	බදු බැර:		-
	මනිමාත්‍ර බදු		-
	පෙර වර්ෂ නිවැරදි කිරීම්	(38,424,557)	240,506
	වර්ෂය සඳහා ආදායම් බදු වියදම්	151,836,233	262,621,108
	ආරම්භක ශේෂය	575,361,535	312,499,921
	වර්ෂය සඳහා ගෙවීම්	(536,936,978)	
	වර්ෂය අවසානයේ ගෙවිය යුතු මුළු බදු	**151,836,233**	**575,361,535**
20	**පූර්ව වර්ෂ ගැලපීම්**	**23,135,193**	**52,414,563**
	පහත සඳහන් කරුණු නිවැරදි කිරීම් සඳහා පෙර වර්ෂයේ ගැලපීම් සිදු කරන ලදී.		
	අත්තිකාරම්		-
	වෙනත්		-
	2018 මනිමාත්‍ර බදු නිවැරදි කිරීම්		(5,666,983)
	ආපදා ණය		15,900
	ආදායම් බදු	38,424,557	5,426,477
	උත්සව අත්තිකාරම්		(13,500)
	අත්තිකාරම්		966
	වැටුප් ප්‍රතිපූරණය		440,455
	සේවක අර්ථසාධක අරමුදල		521,790
	සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල		240,832
	උපයනවිට බදු ගෙවීම්		170,312
	ජාතික රක්ෂණ භාර අරමුදල		(375)
	වැන්දඹු හා අනන්දරු අරමුදල		(6,960)
	ගෙවිය යුතු විශ්‍රාම් වැටුප්		13,998,017
	ගෙවිය යුතු ද්විතීයනය දීමනා		11,162,236
	උපචිත වියදම්	(7,274,029)	2,994,615
	ස්ථාවර වත්කම්	(123,120)	10,847,990
	ක්ෂය වීම්		(602,212)
	රඳවා ගැනීම්		(242,906)
	අත්තිකාරම් ලැබීම්		11,980,542
	එකතු කළ අගය මත බදු	(1,305,021)	712,247
	කෙටි කාලීන ආයෝජන		403,787
	රඳවා ගැනීමේ බදු		31,333
	මුදල් පොත	(951,159)	
	විගණන ගාස්තු	108,000	
	ප්‍රාග්ධන ප්‍රදාන	(5,762,655)	
	Acc .Dip.	(9,380)	
	පෙරගෙවුම්	(0)	
	ගෙවිය යුතු ගිණුම්	28,000	
		23,135,193	**52,414,563**

එළ

21 2020 වසරට සාපේක්ෂව 2021 වර්ෂය සඳහා ආදායම් සහ වියදම් විශ්ලේෂණය කර විස්තරාත්මකව ඉදිරිපත් කර ඇත.

22 **වාර්තා කළ දිනට පසු සිදුවීම්**

e-NMRA හි අයදුම්පත් සඳහා උපයෝගී ලියවිලි නොමැති බව NMRA විසින් හඳුනා ගන්නා ලදී.
2021 ජූලි 9 වැනි දින පද්ධතිය.
සිද්ධිය සම්බන්ධයෙන් NMRA අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට (CID) පැමිණිල්ලක් කරන ලදි.
2021 ජූලි 22 වන දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් විමර්ශන ආරම්භ කරන ලදී.
E-nmra පද්ධති දත්ත ප්‍රතිසාධන මෙහෙයුම් Epic Lanka Technologies විසින් ප්‍රතිසාධනය කිරීම සඳහා ආරම්භ කරන ලදී.
දත්ත නැති වී ඇති අතර දැනට තාක්ෂණික විශේෂඥ කමිටුවක අධීක්ෂණය යටතේ පවතී.
ඖෂධ නිෂ්පාදන, සැපයුම් සහ නියාමනය පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කරන ලදී

23 **අසම්භාව්‍ය වගකීම්**

වාර්තා කරන දිනය වන විට කිසිදු බැඳීමක් සහ අවිනිශ්චිතතාවයක් නොමැත.

24 **නඩු සහ නිමිකම්**

2021 දී හඳුනාගත් උල්ලංඝනය කිරීම් සඳහා FDII විසින් නඩු 26 ක් ගොනු කර ඇත. විභාග වෙමින් පවතින නඩු සංඛ්‍යාව 05.මුළු එකතුව - රු. 646,500.00. පළාත් FD II මගින් පවත්වනු ලබන නඩු පැවරීම් පිළිබඳ විස්තර - 2021. නඩු සංඛ්‍යාව 16 .කටයුතු කෙරෙමින් ඇති නඩු සංඛ්‍යාව 02. මුළු එකතුව රු. 473,000.00

සීමාසහිත බී.ජේ. ඉන්ටර්නැෂනල් (පුද්.) සමාගම විසින් ජාතික ඖෂධ නියාමන අධිකාරිය ට එරෙහිව ලියාපදිංචි සහතික අළුත් කිරීම නිකුත් නොකිරීමට අභියෝග කිරීම සහ මුළු මුදල රුපියල් 497,700,000/= ඉල්ලා සිටීම සඳහා කොළඹ වාණිජ මහාධිකරණයේ නඩු අංක HC.CIVIL 425/2017/MR දරණ නඩුවක් ගොනු කළේය . නියෝගය 2021.11.11 දින ලබා දෙන ලදී. දැනට, සීමාසහිත බී.ජේ. ඉන්ටර්නැෂනල් (පුද්.) සමාගම සිවිල් ක්‍රියා පටිපාටි සංග්‍රහයේ 755 (1) වගන්තියට අනුව අභියාචනා කළේය. තවද, 2019 වසර දක්වා ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් ගොනු කරන ලද අධිකරණය හමුවේ නඩු 13ක් විභාග වෙමින් තිබූ අතර ජාතික ඖෂධ නියාමන අධිකාරිය ට එරෙහිව ගොනු කර ඇති අධිකරණයේ නඩු 11ක් විභාග වෙමින් පවතී. 2020 දක්වා ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් ගොනු කරන ලද අධිකරණය හමුවේ නඩු 11ක් විභාග වෙමින් තිබූ අතර ජාතික ඖෂධ නියාමන අධිකාරිය ට එරෙහිව ගොනු කර ඇති අධිකරණය හමුවේ නඩු 9ක් විභාග වෙමින් තිබුණි. ඉහත සියලු නඩු කටයුතු නීති අංශය මගින් සිදු කරනු ලැබේ. 2020 දෙසැම්බර් 31 දක්වා නඩු 20ක් විභාග වෙමින් පවතී.

25 **අධ්‍යක්ෂක මණ්ඩලයේ වගකීම**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂක මණ්ඩලයේ වගකීම වේ.

26 **මූල්‍ය ප්‍රකාශන අනුමත කිරීම**

මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂක මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර .... 2022 නිකුත් කිරීමට අවසර ලබා දී ඇත.

27 **පෙර වර්ෂ ගැලපුම් ස්වභාවය**

පෙර වසරේ ගැලපුමේ ස්වභාවය වන්නේ ආරම්භක ශේෂයන් නිවැරදි කිරීමයි.

ආදායම් බදු ගණනය කිරීම
කක්සේරු වර්ෂය 2021

බදුවලට පෙර ශුද්ධ ආදායම	1,125,414,862
එකතුකළා :ඉඩදෙනු නොලබන වියදම්	
ක්ෂයවීම්	21,870,537
සංග්‍රහ වියදම්	2,331,483
	1,149,616,881
අඩුකළා :ඉඩදෙනු ලබන වියදම්	
ප්‍රාග්ධන දීමනාව	(65,072,359)
අඩුකළා :ආදායම් බද්දට යටත් නොවන ආදායම	-
ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය	
වර්ෂය සඳහා වූ ශුද්ධ ලාභය	1,084,544,522
බදු අය කළ හැකි වෙළඳා ලාභ සහ	**1,084,544,522**
බදු අලාභ:	-
මූළු ව්‍යවස්ථාපිත ආදායම	1,084,544,522
කාලපරිච්ඡේදය සඳහා බදු වියදම්, @ 14%	151,836,233
කාලපරිච්ඡේදය සඳහා බදු වියදම	151,836,233
බදු බැර	
ගෙවිය යුතු ආදායම් බදු	**151,836,233**

විලම්බිත බදු ගණනය කිරීම

ගිණුම්ගත PPP ලියා හැරී වටිනාකම	114,561,686
PPP හි බදු පදනම	(66,389,022)
බදු අය කළ හැකි තාවකාලික වෙනස	48,172,664
බදු අනුපාතය @ 28%	13,488,346
වර්ෂය ආරම්භක දිනට විලම්බිත වගකීම	7,102,486
වර්ෂය තුළ විලම්බිත බදු ලෙස ගාස්තු	6,385,860

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. එම්එස්යූ/බී/එන්එම්ආර්ඒ/1/21/1 | ඔබේ අංකය உமது இல. Your No. | දිනය திகதி Date 2022 සැප්තැම්බර්09 දින

National Medicines Regulatory Authority
13 SEP 2022
Chairman Office

සභාපති
ජාතික ඖෂධ නියාමන අධිකාරිය

ජාතික ඖෂධ නියාමන අධිකාරියේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික ඖෂධ නියාමන අධිකාරියේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 1 හි 106 හා 108 ඡේද ප්‍රකාරව ස්කන්ධයේ සියළුම සංරචක ඇතුළත් වන පරිදි ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය පිළියෙළ කළ යුතු වුවද, 2021 දෙසැම්බර් 31 දිනට ප්‍රාග්ධන ප්‍රදාන රු.5,920,019 ක් හා ප්‍රාග්ධන ලාභ රු.64,275,375 ක් ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය තුළ හෙළිදරව් කර නොතිබුණි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු මුදල් ප්‍රවාහ ප්‍රකාශය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 7 හි සඳහන් නියමයන්ට අනුකූලව පිළියෙල කර නොතිබීම හේතුවෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය රු.35,614,587 කින් අඩුවෙන්ද, ආයෝජන ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය රු.34,533,678 කින් වැඩියෙන්ද, 2021 ජනවාරි 01 දිනට මුදල් හා මුදල් සමාන දෑ වල අගය රු.951,159 කින් වැඩියෙන්ද හා 2021 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ වල අගය රු.129,750 කින් වැඩියෙන්ද දැක්වුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 8 හි 36 ඡේදය ප්‍රකාරව ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් ප්‍රවර්තන වර්ෂයේ විස්තිරණ ආදායම් ප්‍රකාශය තුළ ගැලපිය යුතු වුවද, රු.108,000 ක විගණන ගාස්තු අධි වෙන් කිරීම හා රු.270,777 ක එකතු කළ අගය මත බදු ඌන වෙන් කිරීම ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය තුළ රඳවා ගත් ලාභයට ගලපා තිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 12 හි 81 (ඇ) ඡේදය ප්‍රකාරව, පෙර ගිණුම්කරණ කාලපරිච්ඡේදවලට සාපේක්ෂව අදාළ බදු අනුපාතයන්හි වෙනස්කම් පිළිබඳ පැහැදිලි කිරීමක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කළ යුතු වුවද, අධිකාරිය විසින් පෙර වර්ෂවල අදාළ කර ගත් සියයට 28 ක බදු අනුපාතය සමාලෝචිත වර්ෂයේදී සියයට 14 දක්වා වෙනස් කිරීම පිළිබඳව මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කර නොතිබුණි.

(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 61 ඡේදය ප්‍රකාරව, දේපළ, පිරියත හා උපකරණවල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය කර, අපේක්ෂා කරන තත්ත්වයන් ඇස්තමේන්තුවලින් වෙනස් වන්නේ නම් එම වෙනස්කම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 8 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කළ යුතු වුවද, එපරිදි කටයුතු නොකිරීම හේතුවෙන් 2021 දෙසැම්බර් 31 දිනට පොත් අගය ශූන්‍ය වූ පිරිවැය රු.7,233,052 ක් වූ වත්කම් අයිතම 187 ක් තව දුරටත් භාවිතා කරමින් පැවතුණු අතර මෙම ප්‍රමිතියේ 76 ඡේදය ප්‍රකාරව ඒ පිළිබඳව හෙළිදරව් කිරීමටද කටයුතු කර නොතිබුණි.

(ඊ) අධිකාරිය පිහිටි කාර්යාල ගොඩනැගිල්ල, ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාර ගොඩනැගිල්ල හා එම ඉඩම් සහ වාහන 06 ක් අධිකාරිය වෙත පවරාගැනීමට, තක්සේරු කිරීමට හා ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණු අතර අධිකාරිය වෙත පවරාගෙන තිබුණු වාහන 03 ක් තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(උ) 2021 දෙසැම්බර් 31 දින වන විට සෘජුවම බැංකුව වෙත ලැබී තිබුණු රු.11,894,247 ක් හඳුනාගෙන නිසි පරිදි ගිණුම්වල ගැලපීමට කටයුතු නොකර හඳුනා නොගත් තැන්පතු ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු බැවින් සමාලෝචිත වර්ෂයේ ලාභය හා 2021 දෙසැම්බර් 31 දිනට ජංගම වගකීම් ඊට සමාන අගයකින් පිළිවෙළින් අඩුවෙන් හා වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි.

(ඌ) අධිකාරිය විසින් 2018 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා ආදායම් බදු ගණනය කිරීමේදී, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 16 වගන්තිය ප්‍රකාරව පනතේ 04 වන උපලේඛනය මගින් ප්‍රාග්ධන දීමනාව ප්‍රදානය කරනු ලබන වර්ෂ ගණන සංශෝධනය කර තිබීම හා 2021 අංක 10 දරන දේශීය ආදායම් (සංශෝධන) පනතේ 51(2)(4)(ඌ) වගන්තිය ප්‍රකාරව 2020 ජනවාරි 01 දින සිට බලාත්මක වන පරිදි සෞඛ්‍ය රැකවරණ සේවා සැපයීමෙන් ලබන ලැබීම් හා ලාභ මත පනවනු ලබන බද්ද සියයට 14 දක්වා අඩුකර තිබීම පිළිබඳව සැලකිලිමත් නොවීම, 2020 වර්ෂයේ විලම්බිත බදු වියදම ගණනය කිරීමේදී ආරම්භක ශේෂය වැරදි ලෙස යොදා ගෙන තිබීම හා ගිණුම්කරණ දෝෂ සහිතව සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන දීමනාව වැරදි ලෙස ගණනය කර තිබීම යන කරුණු හේතුවෙන් වත්මන් ආදායම් බදු වියදම (Current Income Tax) රු.124,779,725 ක්ද, විලම්බිත ආදායම් බදු වියදම (Differed Income Tax) රු.13,359,739 ක්ද වශයෙන් මුළු ආදායම් බදු වියදම රු.138,139,464 ක් වැඩියෙන් ගණනය කර ගිණුම් ගත කර තිබුණි. තවද 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ ජංගම වගකීම් යටතේ ගෙවිය යුතු ආදායම් බද්ද රු.124,779,725 ක්ද, ජංගම නොවන වගකීම් යටතේ විලම්බිත ආදායම් බද්ද රු.10,413,183 ක්ද වැඩියෙන් දක්වා තිබුණි. ඒ අනුව 2021 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු නිවැරදි ආදායම් බද්ද රු.27,056,510 ක් වුවද, අධිකාරිය විසින් 2022 ජුනි 16 දින රු.151,836,233 ක් ආදායම් බදු වශයෙන් ගෙවා තිබීම හේතුවෙන් රු.124,779,723 ක් ආදායම් බදු ලෙස වැඩියෙන් ගෙවා තිබුණි.

(එ) අධිකාරිය වෙත 2019, 2020 හා 2021 වර්ෂවලදී ලැබී තිබුණු ආදායම්වලින් නැවත ගෙවීම සඳහා අනුමත කර තිබුණු නමුත් 2021 දෙසැම්බර් 31 දින වන විටත් ගෙවා නොතිබුණු රු.692,031 ක් එදිනට ගෙවිය යුතු වියදම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ඒ) අධිකාරිය විසින් පවත්වා තිබුණු එළිමහන් පුහුණු වැඩසටහනට අදාළ රු.527,065 ක වියදම පුහුණු කිරීම් හා සංවර්ධන වියදම් (Training and Development) ලෙස ගිණුම්ගත කළ යුතු වුවද, ඉන් රු.65,025 ක් වෙනත් වියදම් යටතේද, රු.45,290 ක් දේශීය ගමන් වියදම් යටතේද ගිණුම්ගත කර තිබුණි. තවද සමරු තිලිණ සඳහා ගෙවිය යුතු රු.138,250 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඔ) 2021 දෙසැම්බර් 31 දිනට අත්තිකාරම් ලැබීම් ගිණුමේ රු.72,972,666 ක්වූ ශේෂයට අදාළ විස්තරාත්මක උපලේඛන හා ලැබීම් විස්තර විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 අධිකාරියේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන අධිකාරියේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන්නා අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

අධිකාරියේ 2021 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මහහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරවිකිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම් කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අධිකාරිය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම් කොටසේ (ඔ) ඡේදයේ දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණු වලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, අධිකාරියේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අධිකාරිය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීති රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම්
(අ) 2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත	
(i) 58, 59, 82 , 83 හා 109 වගන්ති	යම් ඖෂධයක් හෝ වෛද්‍ය උපකරණයක් අධිකාරියේ ලියාපදිංචි නොකර හා අධිකාරියෙන් බලපත්‍රයක් ලබා නොගෙන නිෂ්පාදනය කිරීම හෝ ආනයනය කිරීම නොකළ යුතු අතර ජීවිතයක් බේරාගැනීමට, බෝවන රෝග හෝ චසංගත රෝගයක් පැතිරීම වැළැක්වීමට, ජාතික අවශ්‍යතාවයක් හා ජාතික ආරක්ෂාව වැනි විශේෂිත අවස්ථාවලදී පමණක් ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි නිකුත් කිරීමට අධිකාරිය වෙත බලය ලැබී තිබුණි. නමුත් එවැනි තත්ත්වයන් යටතට නොවැටෙන, ලියාපදිංචිය අවලංගුවීම, ලියාපදිංචි සැපයුම්කරුවන් නොසිටීම වැනි හේතු මත රාජ්‍ය ඖෂධ නිනිගත සංස්ථාව හා පෞද්ගලික ආයතන වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි ඖෂධ වෙනුවෙන් 67 ක්ද වෛද්‍ය උපකරණ වෙනුවෙන් 140 ක්ද නිකුත් කර තිබුණි.

(ii) 60 (2), 61, 84(2), 85, 103(2) හා 104 වගන්ති හා උප වගන්ති

අධිකාරිය විසින් ඖෂධ, වෛද්‍ය උපකරණ හා සීමාසහිත නිෂ්පාදන ලියාපදිංචි කිරීම මෙන්ම ලියාපදිංචිය ප්‍රතික්ෂේප කළ අවස්ථාද ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයන් මඟින් මහජනතාව වෙත දැනුම් දිය යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළදී අධිකාරිය විසින් නිකුත් කර තිබුණු ඖෂධ ලියාපදිංචි සහතික 2,948 ක් හා ප්‍රතික්ෂේප කර තිබුණු අයදුම්පත් 991 ක්ද, වෛද්‍ය උපකරණ ලියාපදිංචි සහතික 315 ක් හා ප්‍රතික්ෂේප කර තිබුණු අයදුම්පත් 23 ක්ද, ගැසට් පත්‍රයේ පළ කිරීමට කටයුතු කර නොතිබුණු අතර ඒ වෙනුවට අධිකාරියේ වෙබ් පිටුවේ පළ කර තිබුණි.

(iii) 69(1)(අ)(i) උපවගන්තිය

වෛද්‍ය උපකරණ ඇගයීම් කමිටුවේ සභාපති වශයෙන් වෛද්‍ය උපකරණ නියාමන අංශයේ ප්‍රධානියා කටයුතු කළ යුතු වුවද, වෛද්‍ය උපකරණ නියාමන අංශයේ ප්‍රධානී තනතුරට නිලධාරියෙකු පත් කර නොතිබීම හේතුවෙන් අධිකාරයේ සභාපති හෝ ප්‍රධාන විධායක නිලධාරී විසින් වෛද්‍ය උපකරණ ඇගයීම් කමිටුවේ සභාපති ධූරය හොබවා තිබුණි.

(iv) 142 වගන්තිය ප්‍රකාරව නිකුත් කර තිබුණු 2019 ඔක්තෝබර් 14 දිනැති අංක 2145/1 දරන අති විශේෂ ගැසට් නිවේදනය මඟින් ස්ථාපිත කර තිබුණු ඖෂධ ලියාපදිංචි කිරීමේ හා බලපත්‍ර ලබාදීමේ නියෝග

- ❖ නියෝග අංක 4, 133 (5) හා නියෝග අංක 134 හි XXIII වන උපලේඛනයේ 08 ඡේදය

ඖෂධ ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කරන සෑම ඉල්ලීමක්ම ලේඛනගත කිරීමට එක් පොදු ලේඛනයක් පවත්වා නොතිබුණි. ඒ හේතුවෙන් ඖෂධ ලියාපදිංචිය සඳහා ඉල්ලුම්පත ලද දිනය, ඉල්ලුම් පත්‍රයේ අංකය, නිෂ්පාදකයාගේ නම, නිෂ්පාදිත රට, බලය ලත් ආනයනකරු, ඖෂධීය නාමය, එම ඖෂධය ඖෂධීය සංයෝගයක් නම් එහි සක්‍රීය සංඝටකවල ඖෂධීය නාමයන්, ඖෂධයේ වෙළඳනාමය, ඖෂධයේ මාත්‍රා ආකාරය, ඖෂධයේ ප්‍රබලතාවය, අයදුම්පත නව හෝ අළුත් කිරීමක් සඳහා වන අයදුම්පතක්ද යන බව, ඖෂධයේ වර්ගය ආදී වූ විස්තර මෙන්ම ඒ ඒ අයදුම්පත වෙනුවෙන් ලද මුදල් පිළිබඳ විස්තර, ඒ ඒ අයදුම්පත ඖෂධ නියාමන අංශය වෙත ඇගයීම සඳහා ඉදිරිපත් කළ දිනය, ඒ ඒ අංශ විසින් ප්‍රතික්ෂේපිත අයදුම්පත්

පිටුව 7 | 17

		ප්‍රමාණය හා අනුමත කළ අයදුම්පත් ප්‍රමාණය, ඒ ඒ අංශවල තවදුරටත් ක්‍රියාත්මක වෙමින් පවතින අයදුම්පත් ප්‍රමාණය, ඒ ඒ අංශ විසින් ලියාපදිංචියට ගත කළ කාලය ආදී වූ තොරතුරු විගණනය සඳහා ලබාගත නොහැකි විය. ඒ හේතුවෙන් ඉලක්කගත සැකසුම් කාලසීමාව තුළ ලියාපදිංචි සහතික නිකුත් කරන බව තහවුරු කරගැනීමට නොහැකි විය. ඒ අනුව ඖෂධ ලියාපදිංචිය සහ බලපත්‍ර ලබාදීමේ ක්‍රියාවලිය විනිවිදභාවයෙන් සිදුකර නොතිබුණු බව නිරීක්ෂණය විය. 2021 නොවැම්බර් මස සිට සියළු තොරතුරු ආවරණය වන පරිදි google sheet පවත්වාගෙන යන බවට සභාපති විසින් අදහස් ඉදිරිපත් කර තිබුණු නමුත් 2022 අගෝස්තු 31 දින දක්වාම එම google sheet වෙත පිවිසීම සඳහා අවශ්‍ය මුරපද විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.
(ආ)	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තිය	අධිකාරිය වෙනුවෙන් අභ්‍යන්තර විගණකවරයෙක් පත්කර නොතිබුණි.
(ඇ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ VIII පරිච්ඡේදයේ 4.1, 10.1 ඡේද	සති අන්තයන්හි සහ රජයේ නිවාඩු දින රාජකාරිවල නිරතවීම වෙනුවෙන් 1/20 දීමනාව හිමි මාණ්ඩලික නිලධාරියකුට අතිකාල දීමනා ලබාගැනීමට හිමිකමක් නොමැති වුවද, අධිකාරියේ සේවය කරන විධායක නිලධාරියෙකු ඇතුලු මාණ්ඩලික නිලධාරීන් 26 දෙනකු වෙත නිවාඩු දින 998 ක් වෙනුවෙන් රු.2,060,455 ක් හා අතිකාල පැය 8,520 ක් වෙනුවෙන් රු.1,977,619 ක් ලෙස 1/20 දීමනාව හා අතිකාල දීමනා යන දීමනා දෙකම ගෙවා තිබුණි.
(ඇ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
	(i) මුදල් රෙගුලාසි 237 (ආ)	භාණ්ඩ ලැබී ඇති බවටද, අදාළ බඩු ලේඛන හෝ තොග පොත්වලට ඇතුළත් කර ඇති බවටද සහතිකයක් ලබා නොගෙන සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 08 කදී රු.578,958 ක ගෙවීම් වවුචර් සහතික කර තිබුණු බව නියැදි විගණන පරීක්ෂාවකදී අනාවරණය විය.

(ii)	මුදල් රෙගුලාසි 371(2) (ආ) හා 2015 ජූලි 14 දිනැති අංක 03/ 2015 දරන රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තු චක්‍රලේඛය	මාණ්ඩලික නිලධාරියෙකුට පමණක් උපරිමය රු.100,000 ක තත්කාර්ය අත්තිකාරම් නිකුත් කළ හැකි වුවද, මාණ්ඩලික නොවන නිලධාරීන් 08 දෙනෙකු වෙත අවස්ථා 17 කදී රු.1,794,000 ක් තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි. තවද නිකුත් කළ අත්තිකාරම් පියවීමට ප්‍රථම නැවත අත්තිකාරම් නිකුත් කර තිබුණු අවස්ථාද විය.
(iii)	මුදල් රෙගුලාසි 128(1)(ඉ), 507, 756, 757, 758, 770 හා 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ I කොටසේ 11.1 ඡේදය	ගණන්දීමේ නිලධාරී විසින් සෑම මුදල් වර්ෂයකම දෙසැම්බර් 15 දිනට ප්‍රථම සමීක්ෂණ මණ්ඩල පත්කිරීමට හා එහි වාර්තා ඊලඟ වර්ෂයේ මාර්තු 31 දිනට පෙර ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත පිටපතක් සහිතව විගණකාධිපති වෙත යොමු කිරීමට කටයුතු කළ යුතු වුවද, අධිකාරිය පිහිටවූ 2015 වර්ෂයේ සිටම මුළු පිරිවැය රු.114,561,686 ක්වූ ජංගම නොවන වත්කම් සමීක්ෂණය කර එම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.
(iv)	මුදල් රෙගුලාසි 1645 (අ) හා 1647(ඉ)	වාහන භාර නිලධාරියා විසින් තමා භාරයේ ඇති එක් එක් වාහනය වෙනුවෙන් 267 වැනි පොදු ආකෘතිය ප්‍රකාරව සම්පූර්ණ කර විධිමත් ලෙස වාහන ලොග් සටහන් පොත් යාවත්කාලීන කර පවත්වා නොතිබුණි. එසේම වාහන භාර නිලධාරී විසින් තමා භාරයේ ඇති මෝටර් වාහන පිළිබඳව වාහන ලේඛනයක් පවත්වා නොතිබුණි.

(ඉ) භාණ්ඩාගාර චක්‍රලේඛ

(i)	1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය	මුළු පිරිවැය රු.114,561,686 ක් වූ දේපල පිරියත හා උපකරණ සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි.
(ii)	2017 ජුනි 28 දිනැති අංක 01/2017 දරන මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශ වත්කම් කළමනාකරණ චක්‍රලේඛය	සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම තම ආයතනය යටතේ වන සියලුම වත්කම් පිළිබඳව නිවැරදිව තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර එම කටයුතු සම්බන්ධීකරණය කිරීම සඳහා සෑම ආයතනයක් විසින්ම සුදුසු නිලධාරියකු නම් කළ යුතු වුවද, අධිකාරිය විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඊ) රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ

(i) 1994 ජුනි 14 දිනැති අංක 95 දරන හා 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන චක්‍රලේඛය	භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව, කාර්ය මණ්ඩලය සඳහා කොවිඩ් 19 දිරි දීමනා යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කර සාමාන්‍ය රාජකාරි දින හා නිවාඩු දිනයන් ලෙස නොසලකා රාජකාරියට වාර්තා කරන දිනකට දින 1 ½ බැගින් දීමනා ගණනය කර ඉකුත් වර්ෂයේදී රු.17,843,781 ක්ද, සමාලෝචිත වර්ෂයේදී රු.44,273,092 ක්ද වශයෙන් රු.62,116,873 ක් දීමනා ලෙස ගෙවා තිබුණි.
(ii) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන චක්‍රලේඛයේ 5.1.1, 5.1.2 හා 5.1.3 ඡේද	චක්‍රලේඛයේ 5.1.1 හා 5.1.2 ඡේද ප්‍රකාරව සංයුක්ත සැලැස්මක් පිළියෙල කර, 5.1.3 ඡේදය ප්‍රකාරව එහි පිටපත් රේඛීය අමාත්‍යාංශය, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය සහ විගණකාධිපති වෙත ගිණුම් වර්ෂය ආරම්භ වීමට දින 15 කට පෙර ඉදිරිපත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය සඳහා අධිකාරිය විසින් සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.
(iii) 2015 ජුනි 17 දිනැති අංක පීඊඩී/03/2015 දරන චක්‍රලේඛයේ 5.2 ඡේදය	චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව අධිකාරියේ සභාපතිවරයාට සමාලෝචිත වර්ෂය තුළදී කොවිඩ් 19 දීමනා ලෙස රු.454,827 ක් කිසිදු අනුමැතියකින් තොරව ගෙවා තිබුණි.

(උ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ

(i) 2013 ඔක්තෝබර් 07 දිනැති අංක 21/2013 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 02 (ආ) හා (ඇ) ඡේද	ලීන් මාසයකට උපරිම දින 02 ක් සඳහා පූර්ව අනුමැතිය මත නිවාඩු දිනවල සේවයේ යෙදවීමට හා ගෙවීම් කිරීමට කටයුතු කළ යුතු අතර දින 02 කට වැඩි ගණනක් සේවයේ යෙදවීම අවශ්‍ය වන්නේ නම් අදාළ අමාත්‍යාංශ ලේකම්ගේ පූර්ව අනුමැතිය පෞද්ගලිකව ලබා ගත යුතු වුවද, එවැනි අනුමැතියකින් තොරව අධිකාරියේ විධායක නිලධාරියෙකු ඇතුලු මාණ්ඩලික නිලධාරීන් 22 දෙනෙකුට සමාලෝචිත වර්ෂය තුළදී නිවාඩු දින 415 ක් වෙනුවෙන් රු.909,042 ක් ගෙවීම් කර තිබුණි.
(ii) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය	සෑම ඉන්ධන පරීක්ෂාවකටම පසු මාස 12 ක කාල සීමාවකින් පසුව හෝ කිලෝ මීටර් 25,000 ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්පිම සම්බන්ධ ප්‍රධාන අළුත් වැඩියාවකට පසුව හෝ යන කාරණා අතරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන පරීක්ෂාවක් කළ යුතු වුවද, අධිකාරිය විසින් භාවිතා කරන වාහන 09 ක් සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි.

පිටුව 10 | 17

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර අධිකාරියේ බලතල, කර්තව්‍ය, සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

(අ) 2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 14 (ඒ) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරිය විසින් බලපත්‍ර යටතේ ආනයනය කරන ලද ඖෂධ, වෛද්‍ය උපකරණ, සීමාස්ථ නිෂ්පාදන හෝ විමර්ශනාත්මක ඖෂධීය නිෂ්පාදනවල ප්‍රමාණය පිළිබඳ දත්ත රැස් කර නොතිබුණි.

(ආ) 2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 23 වන වගන්තිය ප්‍රකාරව, මුදල් වර්ෂය අවසන්වී මාස හයක කාලයක් ඇතුළත අමාත්‍යවරයා වෙත අධිකාරිය විසින් එම මුදල් වර්ෂය ඇතුළත සිදුකරනු ලැබූ කටයුතු පිළිබඳ වාර්ෂික වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එම වාර්තාවට විගණකාධිපති වාර්තාව සමඟ අදාළ වර්ෂය සඳහා වූ අධිකාරියේ විගණනය කරන ලද ගිණුම් වාර්තාව සහ එළඹෙන වර්ෂය සඳහා වූ යෝජිත කටයුතු පිළිබඳ වාර්තාවක්ද අමුණා තැබිය යුතුය. එම වාර්තාව ලද දින සිට මාස හයක කාලයක් ඇතුළත අමාත්‍යවරයා විසින් එය පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු වුවද, 2017 වර්ෂයේ සිටම වාර්ෂික වාර්තා පිළියෙල කර අමාත්‍යවරයා වෙත හා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) 2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතෙහි 41 (2), 66 (2) හා 87 (2) උප වගන්ති ප්‍රකාරව, වෛද්‍ය විද්‍යාව, ඖෂධ වෛද්‍ය විද්‍යාව හා ඖෂධවේදය හෝ වෙනත් අදාළ විෂයයන් පිළිබඳ උපාධියක් සහිත නිලධාරියෙකු, ඖෂධ නියාමන (Medicine Regulatory) අංශයේ, වෛද්‍ය උපකරණ නියාමන (Medicine Devices Regulatory) අංශයේ හා සීමාස්ථ නිෂ්පාදන නියාමන (Border Line Production Regulatory) අංශයේ ප්‍රධානීන් ලෙස පත්කර නොතිබුණි.

(ඈ) 2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 43(2) (අ) හා (ආ) සහ 68 (2) (අ) හා (ආ) උප වගන්ති ප්‍රකාරව, ඖෂධ ඇගයීම් කමිටුව හා වෛද්‍ය උපකරණ ඇගයීම් කමිටුව වෙත ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කරනු ලබන ඖෂධ හා වෛද්‍ය උපකරණවල ප්‍රතිලාභ, අවදානම්, ප්‍රත්‍යක්ෂභාවය, තත්ත්වය, ආරක්ෂාකාරී බව, අවශ්‍යතාවය, මිල සහ අවශ්‍ය අවස්ථාවලදී එම ඖෂධවල ඖෂධ ආර්ථික විශ්ලේෂණය නිශ්චිතව දක්වා තාක්ෂණික ඇගයීම් වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වුවද, ඖෂධ ඇගයීම් කමිටුව හා වෛද්‍ය උපකරණ ඇගයීම් කමිටුව විසින් එවැනි තාක්ෂණික ඇගයීම් වාර්තාවක් අධිකාරිය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ඉ) 2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 69(1)(ආ)(v) උපවගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ ඔහුගේ නාමිකයෙකු වෛද්‍ය උපකරණ ඇගයීම් කමිටුවට පත් කළ යුතු වුවද, එම පත්කිරීම සිදුකර නොතිබුණි. වෛද්‍ය උපකරණද ඇතුළුව විකිරණශීලී උපකරණ හා ද්‍රව්‍ය ආනයනය හා භාවිතය සම්බන්ධයෙන් බලපත්‍ර නිකුත් කිරීම හා නියාමනය පිළිබඳ බලතල හිමි ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාවට වෛද්‍ය උපකරණ ඇගයීම් කමිටුව නියෝජනය කිරීමේ අවශ්‍යතාවය ඉටුවී නොතිබුණි.

(ඊ) 2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 72(1) හා 93(1) උප වගන්ති ප්‍රකාරව, වෛද්‍ය උපකරණ හා සීමාස්ථ නිෂ්පාදන ඇගයීම් සඳහා ඒ ඒ ඇගයීම් කමිටු වෙත පොදු මාර්ගෝපදේශ නිකුත් කළයුතු වුවද එවැනි මාර්ගෝපදේශ පිළියෙල කර නොතිබුණි. තවද 72 (4) හා 93(4) උප වගන්ති ප්‍රකාරව අදාළ ඇගයීම් පැවැත්වීම සඳහා වූ නිශ්චිත කාලසීමා ඇතුළු අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය සඳහන් කරමින්, යහපත් නිෂ්පාදන පරිවයන් පිළිබඳ මාර්ගෝපදේශ සහ අධිකාරිය විසින් නිර්දේශ කරනු ලබන වෙනත් අදාළ මාර්ගෝපදේශ බලාත්මක කිරීම සඳහා වෛද්‍ය උපකරණ හා සීමාස්ථ නිෂ්පාදන සම්බන්ධ නියෝග පිළියෙල කරද නොතිබුණි.

(උ) 2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 74 (1) හා 95(1) උප වගන්ති ප්‍රකාරව, අවසර දෙනු ලබන වෛද්‍ය උපකරණ හා ලියාපදිංචි කරන ලද සීමාස්ථ නිෂ්පාදන අමාත්‍යවරයා විසින් කලින් කල ලැයිස්තුගත කර නොතිබුණි.

(ඌ) 2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 83 (4) (ආ) හා 102(4)(ආ) උප වගන්ති ප්‍රකාරව, ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කරනු ලබන වෛද්‍ය උපකරණ හා සීමාස්ථ නිෂ්පාදනවල තත්ත්වය පරීක්ෂා කිරීම සඳහා ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාරය වෙත ඉදිරිපත් කර නොතිබුණි. ඒ සඳහා අවශ්‍ය පහසුකම් පර්යේෂණාගාරය තුළ නොපවතින බවට අධිකාරියේ සභාපති විසින් අදහස් ඉදිරිපත් කර තිබුණි.

(එ) 2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 83 (6) හා 102(6) උප වගන්ති ප්‍රකාරව අමාත්‍යවරයා විසින්, වෛද්‍ය උපකරණ හා සීමාස්ථ නිෂ්පාදන ඇගයීම් කමිටු සහ ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාරය යන ආයතන විසින් පරීක්ෂා කිරීමේ හෝ ඇගයීමේ ක්‍රියාවලියේදී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, එම පරීක්ෂා කිරීම් හෝ ඇගයීම් ක්‍රියාවලියේ කාල සීමාවන්, වෛද්‍ය උපකරණ ඇගයීම් කමිටුව විසින් රැස්වීම් පැවැත්විය යුතු ආකාරය හා එම රැස්වීම්වලදී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය සහ ඉදිරිපත් කළ යුතු වාර්තාවල ඇතුළත් කළ යුතු කාරණා නිශ්චිතව දක්වමින් නියෝග පිළියෙල කර නොතිබුණි.

(ඒ) 2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 123 වගන්තිය ප්‍රකාරව, අධිකාරිය වෙත ඉදිරිපත් කරන අභියාචනා අසා තීරණය කිරීම සඳහා අභියාචනා කමිටුවක් පිහිටුවා නොතිබුණි.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර අධිකාරියේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

(අ) කුලී පදනම් මත ලබා ගෙන තිබුණු නව කාර්යාල ගොඩනැගිල්ලේ කාර්යාල කාමර වෙන් කිරීමේ (Partition) කොන්ත්‍රාත්තුව සඳහා රු.4,898,750 ක අවම ලංසුව ඉදිරිපත් කර තිබුණු ලංසුකරු වෙත 2020 දෙසැම්බර් 17 දින ප්‍රදානය කර තිබුණි. මෙම ප්‍රසම්පාදනයේදී, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.1 (ආ), 2.12, 5.4.8, 6.3.3, 6.3.6 හා 8.12.2 යන මාර්ගෝපදේශවලට අනුව කටයුතු කර නොතිබුණු අතර 5.4.4 මාර්ගෝපදේශය ප්‍රකාරව අත්තිකාරම් ගෙවීමේ සුරක්ෂණයක් ලබා ගැනීමකින් තොරව රු.979,750 ක අත්තිකාරම් නිකුත්කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී රු.6,854,519 ක් වැයකර වෙළඳපොල මිල සැඳහුම් ක්‍රමය අනුගමනය කරමින් ලී බඩු මිලදී ගෙන තිබුණු නමුත්, රජයේ ප්‍රසම්පාදන අත්පොතේ 2.14.1 ප්‍රකාරව, මුද්‍රා තැබූ මිල ගණන් 05 කට නොඅඩු සංඛ්‍යාවක් කැඳවිය යුතු වුවද, මිල ගණන් 03 ක් පමණක් කැඳවා මිලදී ගැනීම සිදුකර තිබුණි. තවද රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.1 (ආ), 6.3.5 (අ), (ආ), (ඇ), 6.3.6, 8.12.3 (අ),(ආ),(ඇ) යන මාර්ගෝපදේශවල සඳහන් විධිවිධානවලට පටහැනි වන ලෙස කටයුතු කරමින් මෙම මිලදී ගැනීම සිදුකර තිබුණි.

(ඇ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙහි 9.3.1 (ආ) මාර්ගෝපදේශය ප්‍රකාරව රු.200,000 කට වැඩි වාහන අළුත්වැඩියා කිරීම් සඳහා රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගත යුතු වුවද, එම සීමාව ඉක්මවා අධිකාරිය සතු වාහන 03 ක් අළුත්වැඩියා කිරීම වෙනුවෙන් එකතුව රු.3,676,401 ක් වැයකර තිබුණු අතර ඒ සඳහා අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. එසේම අළුත්වැඩියාවේදී ඉවත් කළ අමතර කොටස් හා ඒවා භාරගත් බවට ලොග් සටහන් තබා නොතිබුණි. වාහන භාර නිලධාරියා විසින් එම අමතර කොටස් භාර ගෙනද නොතිබුණි.

2.3 වෙනත් කරුණු

(අ) අධිකාරිය විසින් වැඩ නිමකළ ලිපිගොනු ප්‍රවාහනය කර ආරක්ෂිතව ගබඩා කර පවත්වාගෙන යාමේ කොන්ත්‍රාත්තුව 2015 දෙසැම්බර් 01 දින සිට පෞද්ගලික සමාගමක් වෙත ප්‍රදානය කර තිබුණි. කොන්ත්‍රාත්තුව ආරම්භයේ සිට 2021 දෙසැම්බර් 31 දින දක්වා වූ වර්ෂ 06 ක කාලපරිච්ඡේදය තුළදී කොන්ත්‍රාත්කරු වෙත රු.6,062,550 ක් ගෙවා තිබුණි. 2016 වර්ෂයේදී එවකට කොන්ත්‍රාත්කරු භාරයේ පැවති ලිපිගොනු කොටසක් ගංවතුරෙන් හානි වී තිබුණු බව සඳහන් කරමින් 2016 මැයි මාසයේ සිට 2017 අප්‍රේල් මාසය දක්වා වූ වර්ෂය වෙනුවෙන් කොන්ත්‍රාත්කරු වෙත මුදල් ගෙවීම් නවතා තිබුණු නමුත් ගංවතුරෙන් හානිවී තිබුණු ලිපිගොනු සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදුකර නොතිබුණි. තවද, 2022 ජුනි 30 දින වන විටත් කොන්ත්‍රාත්කරුගේ සේවය ලබා ගනිමින් පැවති අතර වර්ෂ 06 ක් තිස්සේ මේ සඳහා වැයවන පිරිවැය විශ්ලේෂණය කර අධිකාරිය විසින්ම ලේඛණාගාරයක් ස්ථාපිත කිරීම පිළිබඳව අවධානය යොමු කර නොතිබුණි.

(ආ) 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙහි II කොටසෙහි 5.1 ඡේදය ප්‍රකාරව සියළුම රජයේ ආයතන, තම ආයතනය විසින් මහජනතාවට සපයනු ලබන සේවාවන් සඳහා අයකරනු ලබන ගාස්තු සමාලෝචනය කර වසර තුනකට වරක් සියයට 15 ක උපරිමයකට යටත්ව සංශෝධනය කර, අදාළ ආදායම් ගණන්දීමේ නිලධාරියා විසින් තම අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශයද සහිතව භාණ්ඩාගාරයේ ලේකම්වරයාගේ හෝ භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයාගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතුය. අධිකාරිය විසින් ඖෂධ, වෛද්‍ය උපකරණ හා සීමාසහිත නිෂ්පාදන සම්බන්ධයෙන් ලියාපදිංචි සහතික නිකුත් කිරීම, බලපත්‍ර ලබාදීම, ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ අනුමැතිය, ඇසුරුම් කිරීම සඳහා අනුමැතිය, නියෝජිතායතන පැවරීම සඳහා අනුමැතිය වැනි අනුමැතීන් ලබාදීම, පරීක්ෂණ පැවැත්වීම සහ සපයනු ලබන අනෙකුත් සේවාවන් වෙනුවෙන් අය කරනු ලබන ගාස්තු 2018 ජනවාරි 05 දින අවසන් වරට සංශෝධනය කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය තුළදී ගාස්තු සමාලෝචනය කර අදාළ සංශෝධනයන් භාණ්ඩාගාර අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වුවද, ඒ අනුව කටයුතු කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ගාස්තු ආදායම රු.187,913,601 කින් පමණ අහිමිවී තිබුණි.

(ඇ) ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාරය (National Drugs Quality Assurance Laboratory) විසින් පර්යේෂණාගාරයේ ප්‍රමිතිය සම්බන්ධයෙන් අනුකූලතා තක්සේරු පිළිබඳ සහතිකය ලබාගැනීම සඳහා ශ්‍රී ලංකා ප්‍රතිතන මණ්ඩලය වෙත 2020 පෙබරවාරි 06 දින අයදුම්පතක් ඉදිරිපත් කර තිබුණු නමුත් 2022 ජූලි 31 දින වන විටත් එම ප්‍රමිති සහතිකය ලබාගැනීමට අපොහොසත්වී තිබුණු අතර ලබාගෙන ඇති වෙනත් ප්‍රමිති සහතික පිළිබඳ තොරතුරුද විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.

(ඈ) 2022 – 2026 පස් අවුරුදු සංයුක්ත සැලැස්ම 2022 වර්ෂය ආරම්භවීමට දින 15 කට පෙර පිළියෙල කළ යුතු වුවද, 2022 ජූලි 04 දින වන විට එය පිළියෙල කිරීම සඳහා අධිකාරිය විසින් රු.1,641,600 ක් වැය කර තිබුණු නමුත් එදින වන විටත් සංයුක්ත සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

(ඉ) 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරි පනතේ 39 වගන්තිය ප්‍රකාරව, තත්ත්වය පරීක්ෂා කිරීම සඳහා ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පර්යේෂණාගාරය වෙත ඉදිරිපත් කර තිබුණු ඖෂධ සාම්පල් අතරින් 2021 ජනවාරි 01 දින වන විට පරීක්ෂණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණු ඖෂධ සාම්පල් ප්‍රමාණය පිළිබඳව තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි. කෙසේ වෙතත් 2019 හා 2020 වර්ෂ වලදී ලැබී තිබුණු ඖෂධ සාම්පල් 216 ක් අතරින් 157 ක් සඳහාද, සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබුණු ඖෂධ සාම්පල් 477 කින් 299 ක් සඳහාද පමණක් සමාලෝචිත වර්ෂය තුළදී පරීක්ෂණ සහතික නිකුත් කර තිබුණි. ඒ අනුව 2019 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා වූ වර්ෂ 03 තුළදී ලැබී තිබුණු ඖෂධ සාම්පල් අතරින් 2022 ජූලි 31 දින වන විටත් පරීක්ෂණ වාර්තා නිකුත් කර නොතිබුණු සාම්පල් සංඛ්‍යාව 91 ක් වූ අතර ඉන් 42 ක්ම අධිකරණය විසින් ඉදිරිපත් කර තිබුණු සාම්පල් විය. අදාළ අධිකරණ කටයුතු සැලකිය යුතු කාලයක සිට ප්‍රමාදවීමට එය හේතුවන බවට වූ මතය විගණනයේදී බැහැර කළ නොහැකි වේ.

(ඊ) සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 18 කදී නිලධාරීන්ගේ අතපසුවීම් හා වෙනත් විවිධ හේතු මත එකතුව රු.1,620,119 ක ආදායම් ආපසු ගෙවා තිබුණි. මෙම තත්ත්වය වර්ෂ කිහිපයක සිට පැවති නමුත් අවම කර ගැනීම සඳහා ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.

(උ) 2018 වර්ෂයේදී, සේවක භාරකාර අරමුදලට ප්‍රමාදවී මුදල් යැවීම, වැටි බදු නිදහස් කිරීම නියමිත කාලය තුළ ඉල්ලීම් නොකිරීම හා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව වෙත ගෙවා තිබුණු වැටි බදු අයකර ගැනීමට ඉල්ලීම් කර තිබුණු නමුත් එම ඉල්ලීම ප්‍රතික්ෂේපවීම වැනි කරුණු හේතුවෙන් අධිභාර හා වැටි බදු ලෙස මුළු මුදල රු.756,173 ක් සමාලෝචිත වර්ෂය තුළදී දේශීය අදායම් දෙපාර්තමේන්තුව වෙත වැඩිපුර ගෙවා තිබුණි.

(ඌ) ඖෂධ නැවත ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කරන අයදුම්පත් වෙනුවෙන් නැවත ලියාපදිංචි සහතික නිකුත් කිරීම වෙනුවට පැවති ලියාපදිංචිය දිර්ඝ කිරීමේ ක්‍රමවේදයක් අනුගමනය කර තිබුණු නමුත් ඒ සඳහා විධිමත් අනුමැතියක් ලබා ගෙන නොතිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී ඖෂධ නැවත ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කර තිබුණු අයදුම්පත් 3,892 කින් අයදුම්පත් 2,904 ක් වෙනුවෙන් පැවති ලියාපදිංචිය දිර්ඝකර තිබුණු අතර අයදුම්පත් 988 ක් ප්‍රතික්ෂේප කර තිබුණි. ලියාපදිංචිය දිර්ඝ කිරීමේ ක්‍රමවේදය අනුගමනය කිරීම හේතුවෙන් 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරි පනතේ 47(3) හා 59(4) උප වගන්ති ප්‍රකාරව ඖෂධ ඇගයීමට අදාළ විධිවිධාන උල්ලංඝනයවී තිබුණු බව නිරීක්ෂණය විය.

(එ) ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කරන ගොනුවක් (Dossier) ඇගයීම සම්පූර්ණ කිරීමේ උපරිම කාලය දින 300 ක් වුවද, 2020 වර්ෂයේදී ඉදිරිපත් කර තිබුණු Dossiers 146 කට 2022 ජුනි 25 දින වන විටත් ලියාපදිංචි සහතික නිකුත් කර නොතිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී ලියාපදිංචි කර තිබුණු වෛද්‍ය උපකරණ ඩොසියර 25 ක නියැදියක් පරීක්ෂා කිරීමේදී ඩොසියර 06 කම ප්‍රධාන ඇගයීම් කටයුතු සඳහා දින 02 ක් ද, තවත් ඩොසියර 04 ක ප්‍රධාන ඇගයීම් කටයුතු සඳහා මාසයකට අඩු කාලයක්ද ගත කර තිබුණු නමුත් ලියාපදිංචිය අවසන් කිරීම සඳහා වර්ෂ 01 සිට වර්ෂ 03 දක්වා කාල පරාසයක් ගත කර තිබුණි. ඩොසියර 18 ක් අධිකාරියට ලද දින සිට ප්‍රධාන විධායක නිලධාරී විසින් ඖෂධවේදීන් වෙත පැවරීමට මාස 01 ½ ක සිට වර්ෂ 01 ත් අතර කාලයක් ගත කර තිබුණු අතර ඖෂධවේදීන් විසින් ඩොසියර 11 ක් කාර්යසාධන ඇගයීම සඳහා අදාළ විදුහල (College) හෝ බාහිර ඇගයුම්කරු (External Evaluator) වෙත ඉදිරිපත් කිරීමට මාස 05 ත් වසර 01 මාස 09 ත් අතර කාලයක් ගත කර තිබුණි. කාර්යසාධන ඇගයීමෙන් පසු ඩොසියර 09 ක තාක්ෂණික ඇගයීම ආරම්භ කිරීම සඳහා ඖෂධවේදීන් විසින් මාස 05 සිට වසර 01 මාස 04 ක් දක්වා කාලයක් ගත කර තිබුණු අතර වෛද්‍ය උපකරණ ඇගයීම් කමිටුව විසින් ලියාපදිංචිය සඳහා අනුමත කරන ලද ඩොසියර 09 ක් සඳහා එදින සිට ප්‍රධාන විධායක නිලධාරී විසින් අනුමැතිය ලබාදීමට දින 14 සිට මාස 02 දක්වා කාලයක් ගත කර තිබුණි. නමුත් අධිකාරිය විසින් මෙම ප්‍රමාදයන් අවම කර ගැනීමට හා ලියාපදිංචි ක්‍රියාවලිය කාර්යක්ෂම හා වේගවත් කර ගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඒ) ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කරන ඩොසියර පවත්වාගෙන යාමේදී හා අදාළ ලේඛන පිළියෙළ කිරීමේදී නොසැලකිලිමත්ව හෝ හිතාමතා හෝ වැරදි තොරතුරු ඇතුළත් කර තිබුණු අතර ඇතැම් කාර්යයන් ඉටුකළ දිනයන්, ඉටුකළ නිලධාරීන් පිළිබඳ තොරතුරු හා ඇතැම් අත්‍යාවශ්‍ය ලේඛන ඩොසියර තුළ ඇතුළත් කර නොතිබුණි. ඇතැම් ඩොසියර තුළ කාර්යසාධන ඇගයීම සඳහා ඩොසියරය හා සාම්පල අදාළ විදුහල වෙත ඉදිරිපත් කළ සහ නැවත ලද දිනයන්, ඖෂධවේදීන් විසින් තාක්ෂණික ඇගයීම ආරම්භ කළ හා අවසන් කළ දිනයන් මෙන්ම ඖෂධවේදීන්ගේ නිර්දේශය, කේතය හා අත්සන් සඳහන්ව නොතිබුණු අතර තාක්ෂණික ඇගයීම් පිරික්සුම් ලැයිස්තුව තුළ සාවද්‍ය තොරතුරු ඇතුළත් කර තිබුණි. ඇතැම් ඩොසියර තුළ අයදුම්පත පිළිබඳ සාරාංශ වාර්තාව සහ ඖෂධවේදීන් විසින් තාක්ෂණික ඇගයීම් සිදු කර නිර්දේශ ලබා දෙන තාක්ෂණික ඇගයීම් පිරික්සුම් ලැයිස්තුව ඇතුළත් කර නොතිබුණි.

(ඔ) වෛද්‍ය උපකරණ ඇගයීම් කමිටුවට සාමාජිකයන් 20 දෙනකු පත්කර තිබුණු නමුත් සමාලෝචිත වර්ෂය තුළදී පවත්වා තිබුණු රැස්වීම් 10 ක් සඳහා සාමාජිකයන්ගේ සහභාගීත්වය සියයට 35 ක් වැනි අඩු මට්ටමක පැවති අතර සමාජිකයින් 07 දෙනෙකු එකඳු රැස්වීමකට හෝ සහභාගීවී නොතිබීම හේතුවෙන් රසායනාගාර සේවා, ජීව වෛද්‍ය විද්‍යා ඉංජිනේරු, දන්ත වෛද්‍ය සේවා, ජීව රසායන විද්‍යා, ශල්‍ය රෝග සහ විකිරණ වේදය වැනි විශේෂඥ ක්ෂේත්‍රවල දැනුම කමිටු තීරණ සඳහා දායකවී නොතිබුණි.

(ඕ) ඔසුසල් බලපත්‍ර ලබා ගැනීම සඳහා මාර්ගගත (online) ක්‍රමය මත මුදල් ගෙවා තිබුණු නමුත් මාර්ගගත පරිගණක ස්වයංක්‍රියකරණ පද්ධතිය 2021 අගෝස්තු මාසයේදී බිඳවැටීම හේතුවෙන් නව බලපත්‍රයක් නිකුත් කිරීම වෙනුවට 2019 හා 2020 වර්ෂවලදී නිකුත් කර තිබුණු බලපත්‍ර මත රබර් මුද්‍රාව තබා ඒ මත දින දීර්ඝ කර අත්සන යොදා තිබුණි. එම දින දීර්ඝ කිරීම් ලේඛනගත කර නොතිබුණු අතර විධිමත් අනුමැතියක් නොලද නිලධාරීන් විසින් එම අත්සන් තබා තිබුණි.

(ක) අධිකාරියේ දත්ත පද්ධතිය ස්වයංක්‍රියකරණය කිරීමේ කොන්ත්‍රාත්තුව මුළු කොන්ත්‍රාත් වටිනාකම රු.මිලියන 29 කට වර්ෂ 05 ක කාලයක් සඳහා පෞද්ගලික සමාගමක් වෙත 2018 මැයි 03 දින ප්‍රදානය කර තිබුණි. මෙම ලේඛන සහ කාර්යප්‍රවාහ කළමනාකරණ පද්ධතිය සේවාවක් ලෙස ක්‍රියාත්මක කිරීම Operational Expenditure Financing මොඩලය අනුව ලබා ගෙන ක්‍රියාත්මක කිරීමට ගිවිසුම්ගතවී තිබුණු අතර 2019 ජුනි මාසයේ සිට 2021 මැයි මාසය දක්වා වූ කාලපරිච්ඡේදය තුළදී කොන්ත්‍රාත් සමාගම වෙත රු.12,253,328 ක් ගෙවා තිබුණි. නමුත් අදාළ පෞද්ගලික සමාගමේ නොසැලකිල්ලෙන් හෝ හිතාමතා හෝ මෙම දත්ත පද්ධතියට ඇතුළත් කර තිබුණු සමහර තොරතුරු මකා දමා තිබුණු අතර ඒ සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සිදුකරන විමර්ශන කටයුතු අවසන් වන තෙක් හා 2022 අගෝස්තු 31 දින වන විටත් සේවාව අක්‍රිය තත්වයට පත්වී තිබුණි. එසේම මෙම පද්ධතිය ක්‍රියාත්මක කිරීමේදී අවශ්‍ය උපදේශනය, කළමනාකාරීත්වය හා තාක්ෂණික උපදෙස් ලබාගැනීමට ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය සමඟ 2018 ජුනි 25 දින වර්ෂයක කාලයක් සඳහා අවබෝධතා ගිවිසුමකට එළඹ තිබුණද වර්ෂ 05 ක් වූ කොන්ත්‍රාත් කාලයට සමාන්තරව එම ගිවිසුම දිර්ඝ කිරීමට කටයුතු කර නොතිබුණි. තවද කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව, තොරතුරුවල රහස්‍යභාවය පිළිබඳ සැලකිලිමත් වීමට, මුරපද වෙනස් කිරීමට හෝ තොරතුරු අවභාවිතා කිරීම වැළැක්වීමට කටයුතු කර නොතිබුණු අතර පද්ධතිය ස්වයංක්‍රියකරණය කිරීමෙන් පසු manual හා automation පද්ධති දෙක සමාන්තරව ක්‍රියාත්මක කර අධිකාරියේ අභ්‍යන්තර වැඩ ප්‍රවාහය (workflow) පිළිබඳ විගණන පරීක්ෂණයක් (Audit trial) සිදුකර නොතිබුණි. එමෙන්ම, ලිපිගොනු කළමනාකරණය, සංරක්ෂණය හා ලේඛන පිටපත් ආරක්ෂිතව වර්ෂ 05 ක් දක්වා අදාළ දත්ත සමඟ ගබඩා කිරීමේ හැකියාව, දිනපතා, සතිපතා හා මාසිකව ස්වයංක්‍රීය පිටපත් ලබා ගැනීම හා වෘත්තීමය වගකීම් රක්ෂණාවරණ ලබාගැනීම පිළිබඳව තහවුරුවක් ලබා ගැනීම යන කරුණු කෙරෙහි කළමනාකරණය සැලකිලිමත්වී නොතිබුණු අතර අදාළ දත්ත හා ඇමුණුම් තොරතුරුවල ආරක්ෂිත පිටපත් ලබානොගෙන සමාගම වෙත ගෙවීම් සිදුකර තිබුණි. ගිවිසුම් කොන්දේසි ප්‍රකාරව, පිරිවැය රු.7,558,128 ක් වූ මෙම පද්ධතිය තුළ වූ වත්කම් ප්‍රාග්ධනගත කළ යුතු වුවද, ඒ වෙනුවට එම මුදල ලාභයට එරෙහිව කපාහැර තිබුණි. මෙම සිදුවීම් සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමට හා මකාදමා තිබුණු දත්ත නැවත ස්ථාපනය කිරීමට පත්කර තිබුණු විශේෂඥ කමිටුව විසින් 2022 ජූලි 15 දිනැතිව නිකුත් කර තිබුණු වාර්තාවට අනුව, පද්ධතියෙන් මකා දමා තිබුණු දත්ත නැවත ස්ථාපනය කළ නොහැකි බව තහවුරු කර තිබුණි. මෙම පද්ධතියේ කටයුතු අක්‍රිය කළ පසු තාවකාලික පිළියමක් ලෙස ගූගල් යෙදුමක් (Google Form) භාවිතයෙන් ඖෂධ, උපකරණ ආදිය ලියාපදිංචි කටයුතු සිදුකරන නමුත් එම ක්‍රමය අඩුපාඩු සහිතව පවත්වා ගෙන යන බව නිරීක්ෂණය විය.

(ග) 2018 ජනවාරි 05 දිනැති අංක 2052/33 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් සංශෝධිත 2017 ජුනි 14 දිනැති අංක 2023/30 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පල කරන ලද 2017 අංක 02, 03 හා 04 දරන ගාස්තු නියෝගයන් ප්‍රකාරව ඖෂධ, වෛද්‍ය උපකරණ හා සිමාසහිත නිෂ්පාදන පෞද්ගලික සැපයීම් සඳහා ලියාපදිංචියෙන් නිදහස් කිරීමට ඉල්ලුම් කිරීමේදී ගාස්තු අය කළ යුතු වුවද, අධිකාරිය විසින් ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ අනුමැතිය ප්‍රදානය කිරීමේදී ගාස්තු අය කිරීමට කටයුතු කර නිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී ප්‍රතික්ෂේප කර තිබුණු පෞද්ගලික අංශයේ වෛද්‍ය උපකරණ ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ඉල්ලුම්පත් 207 ක් සඳහා අය කළ හැකිව තිබුණු රු.11,473,421 ක ගාස්තු ආදායම අධිකාරියට අහිමිවී තිබුණි. 2018 වර්ෂයේ සිට 2022

අගෝස්තු 22 දින දක්වා කාලය තුළදී ඖෂධ, වෛද්‍ය උපකරණ හා සීමාස්ථ නිෂ්පාදන සම්බන්ධයෙන් මෙලෙස කටයුතු කර තිබීම හේතුවෙන් අධිකාරියට ගණනය කළ නොහැකි විශාල ආදායමක් අහිමිවී තිබුණි.

(ව) 2020 සහ 2021 වර්ෂ තුළදී පවත්වා තිබුණු විවිධ කමිටු සඳහා සහභාගීත්ව දීමනා, කොවිඩ් දීමනා හා ප්‍රසාද දීමනා වශයෙන් එකතුව රු.629,030 ක්, මුදල් රෙගුලාසි 271(2)(අ) සහ (ආ) ප්‍රකාරව අදාළ නිලධාරීන් වෙත ගෙවීමට හෝ දින 14 කදී ආපසු බැංකුගත කිරීමට හෝ කටයුතු නොකර අධිකාරියේ ගණකාධිකාරී විසින් දින 159 ත් දින 865 ත් අතර කාලයක් අත රඳවාගෙන තිබුණි. මෙම දීමනා ගෙවීම් සඳහා පිළියෙල කරන ලද ගෙවීම් වවුචර් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබීම හේතුවෙන් ඒ පිළිබඳව විමසීමේදී ඊට පසු දින එනම් 2022 ජූනි 08 දින රු.629,030 ක් සෘජුවම බැංකු ගත කර තිබුණි. මීට අමතරව 2022 වර්ෂයේදී කමිටු සහභාගිත්ව දීමනා, ප්‍රසාද දීමනා, පැමිණීමේ දීමනා හා අනිකාල දීමනා වශයෙන් එකතුව රු.537,600 ක් අදාළ නිලධාරීන් වෙත ගෙවීමට හෝ ආපසු බැංකුගත කිරීමට හෝ කටයුතු නොකර දින 15 ත් දින 228 ත් අතර කාලයක් අත රඳවාගෙන තිබුණු බව 2022 අගෝස්තු 23 දින සිදු කරන ලද භෞතික මුදල් සත්‍යාපනයේදී තහවුරු විය. මෙය රජයේ මුදල් අයථා පරිහරණයක් වන බව නිරීක්ෂණය වූ අතර මුදල් රෙගුලාසි 271(1) ප්‍රකාරව නොගෙවා ඉතිරිව ඇති මුදල් හා ඒවාට අදාළ ලියවිලි සේප්පුවක හෝ ඒ සඳහා නියමිත වෙනත් සුරක්ෂිත ස්ථානයක තැන්පත් කොට අගුළු ලා තැබිය යුතු වුවද, මෙම මුදල් ගණකාධිකාරීගේ කාර්යාල මේස ලාච්චුවේ අනාරක්ෂිතව රඳවා තිබුණු අතර අගුළු දෙකකින් හා කේතයකින් සුරක්ෂිත ආරක්ෂිත සේප්පුව ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ නිෂ්කාර්යව රඳවා තිබුණි.

(ඡ) අධිකාරියේ 2021 දෙසැම්බර් 31 දිනට අනුමත ස්ථිර කාර්යමණ්ඩලය 235 ක් සහ කොන්ත්‍රාත් පදනම මත 22 ක් ලෙස මුළු අනුමත කාර්යමණ්ඩලය 257 ක් විය. මුළු තථ්‍ය කාර්යමණ්ඩලය 160 ක් වුවද ඉන් 38 දෙනෙක් අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් නොවන අතිරික්ත සංඛ්‍යාවක් වූ බැවින් 2021 දෙසැම්බර් 31 දිනට අනුමත මුළු කාර්ය මණ්ඩලයෙන් සත්‍ය පුරප්පාඩු සංඛ්‍යාව 135 ක් විය. අනුමත කාර්ය මණ්ඩලය තුළ පවතින ඉහළ කළමනාකරණ තනතුරු 19 කින් තනතුරු 16 ක් හෙවත් සියයට 84 ක්ම පුරප්පාඩුවී පැවතුණු බැවින් අවශ්‍ය හා අවශ්‍ය නොවන තනතුරු හඳුනාගෙන අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කර ගැනීමට අපොහොසත්වී තිබුණු අතර අවශ්‍ය තනතුරු පුරප්පාඩුවී පැවතීම අධිකාරියේ සමස්ත කාර්යසාධනය කෙරෙහි බලපෑමක් ඇති විය හැකි බව නිරීක්ෂණය විය. ඖෂධ ඇගයීම් නිලධාරීන් 30 දෙනකු සහ සහකාර ඖෂධ ඇගයීම් නිලධාරීන් 12 දෙනෙකුගේ පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ නිර්දේශ පරිදි අන්තර්ග්‍රහණය කිරීමේ හෝ බඳවා ගැනීමේ ක්‍රමවේදය මෙම වාර්තාවේ දිනය වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

4 වන පරිච්ඡේදය

තිරසාර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීමේ කාර්ය සාධනය (SDG)

ජාත්‍යන්තර සංවර්ධනය ලොව පුරා ජීවත් වන මිනිසුන්ගේ අවශ්‍යතා සහ ලැදිකම් තුළින් ඔවුන්ගේ ජීවිත වැඩිදියුණු කිරීමට උත්සාහ කරයි. සෞඛ්‍යය, අධ්‍යාපනය, ප්‍රජාතන්ත්‍රවාදය, තිරසර බව සහ ආර්ථිකය වැනි ක්ෂේත්‍ර සමඟ වැඩි අවස්ථා සහිතව වඩාත් සාධාරණ ජීවිත ගත කිරීමට මිනිසුන් වඩාත් හොඳින් සූදානම්ව සිටිති. එක්සත් ජාතීන්, සිය සංවර්ධන වැඩසටහන (UNDP) තුළින් "2030 වර්ෂය වන විට දුප්පත්කම අවසන් කිරීම, පෘථිවිය ආරක්ෂා කර ගැනීම සහ සියලුම මිනිසුන් සාමයෙන් සහ සමෘද්ධිමත්ව සතුටින් ජීවත්වීම" සහතික කිරීම පිණිස තිරසර සංවර්ධන අරමුණු (SDG) සමඟ වැඩ කරමින් කටයුතු කරයි. රටවල් සහ පාලන ප්‍රදේශ 170 කටත් අධික ගණනක දිළිඳු බව, ඒඩ්ස් (AIDS), කාන්තාවන්ට සහ ගැහැණු ළමුන්ට එරෙහිව වෙනස්කම් කිරීම යන ප්‍රශ්න පිළිබඳව විසඳුම් ලබා දීමට අවශ්‍ය කටයුතු කරමින් සිටී.

තිරසාර සංවර්ධන ඉලක්ක 17 න් 3 වෙනි ඉලක්කය වන්නේ මිනිසුන්ට සෞඛ්‍ය සම්පන්නව ජීවත්වීමට ඔවුන්ගේ "යහපත් සෞඛ්‍යය සහ යහපැවැත්ම" සැලසීමට වගබලා ගැනීම ය. එමගින් ළමා මරණ නැති කොට මිනිසුන්ගේ අපේක්ෂා ඉහළ නැංවිය හැකි අතර එය ජාතික ඖෂධ නියාමන අධිකාරියේ (NMRA) විෂය පථයට ඉතාමත් සමීප ලෙස අදාල වේ.

ඒ අනුව ජාතික ඖෂධ නියාමන අධිකාරියේ (NMRA) සියලුම ක්‍රියාකාරකම් සකස් කරනු ලබන්නේ පහත පරිදි මෙම තිරසර සංවර්ධන අරමුණෙහි (SDG) අංක 03 ලෙස ඇති ඉලක්ක සාක්ෂාත් කරගැනීම සඳහා ය.

3.8 සියලුම දෙනාට මූල්‍ය අවදානම් ආරක්ෂාව, ගුණාත්මක බවින් යුත් අත්‍යාවශ්‍ය සෞඛ්‍යාරක්ෂක සේවාවන්ට ප්‍රවේශවීමේ හැකියාව සහ සුරක්ෂිත, ඵලදායී, තත්ත්වයෙන් ඉහළ සහ දැරිය හැකි මිලක් සහිත අත්‍යාවශ්‍ය ඖෂධ හා එන්නත් ලබා ගැනීමට ප්‍රවේශවීමේ හැකියාව ඇතුළුව විශ්ව සෞඛ්‍ය ආවරණයක් සාක්ෂාත් කර ගැනීම.

3.අ දුම්කොළ පාලනය සම්බන්ධ ලෝක සෞඛ්‍ය සංවිධාන සම්මේලනයේ වැඩරාමුව සියලුම රටවල යෝග්‍ය පරිදි ක්‍රියාත්මක කිරීම ශක්තිමත් කිරීම.

3.ආ සංවර්ධනය වෙමින් පවතින රටවලට මූලිකවම බලපාන බෝවන සහ බෝනොවන රෝග සඳහා එන්නත් සහ ඖෂධ සම්බන්ධයෙන් සිදුකරනු ලබන පර්යේෂණ සහ වැඩිදියුණු කිරීම්වලට සහාය වීම, මහජන සෞඛ්‍යය ආරක්ෂා කිරීමේ සුනම්‍යතා සම්බන්ධ බුද්ධිමය දේපළ අයිතීන්වල වෙළඳ සම්බන්ධ අංග සහිත ගිවිසුමේ (Agreement on Trade Related Aspects of Intelleatual Property Rights) දැක්වෙන ප්‍රතිපාදන සංවර්ධනය වෙමින් පවතින රටවල ජනතාවට සම්පූර්ණයෙන්ම භාවිතා කිරීමේ අයිතිය සහතික කරනු ලබන TRIPS ගිවිසුම හා මහජන සෞඛ්‍යය සම්බන්ධ දෝහා ප්‍රකාශනයට අනුකූලව දැරිය හැකි මිලකට ලබාගත හැකි අත්‍යාවශ්‍ය ඖෂධ හා එන්නත්වලට ප්‍රවේශය ලබාදීම සහ සියලුම දෙනා සඳහා ඖෂධවලට ප්‍රවේශය ලබාදීම.

3.ඇ සෞඛ්‍ය කටයුතු සඳහා මූල්‍ය දායකත්වය සැලකිය යුතු ලෙස වැඩි කිරීම හා සංවර්ධනය වෙමින් පවතින රටවල විශේෂයෙන්ම අඩුවෙන් සංවර්ධනය වී ඇති රටවල සහ සංවර්ධනය වෙමින් පවතින තත්ත්වයේ සිටින කුඩා දූපත්වල සෞඛ්‍ය ශ්‍රම බලකාය බඳවා ගැනීම්, ඔවුන් සංවර්ධනය කිරීම, පුහුණු කිරීම, සහ රඳවා ගැනීම.

මෙම සියලුම ඉලක්ක ඖෂධ හා වෛද්‍ය උපකරණවල සුරක්ෂිත බව, ගුණාත්මක බව, සඵලත්වය හා මිල සම්බන්ධ කරුණු පෙරදැරි කරගෙන ඒවා නියාමනය කිරීම ජාතික ඖෂධ නියාමන අධිකාරියේ (NMRA) විෂයපථය තුලින් ඉටු කරනු ලබයි.

5 වන පරිච්ඡේදය

අනුකූලතා වාර්තාව

	යෙදිය යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල / අදාළ නොවේ)	අදාළ නොවේ නම් - ඒ සඳහා කෙටි පැහැදිලි කිරීමක්	අනාගතයේදී අනුකූල නොවීම වැළැක්වීම සඳහා යෝජිත නිශ්චිත ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශන / ගිණුම් නියමිත වේලාවට ඉදිරිපත් කර ඇත**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශන	අනුකූලයි		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්	අනුකූලයි		
1.3	ව්‍යාපාර සහ නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම)	-		
1.4	අත්තිකාරම් ගිණුම් ගත කිරීම	-		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අනුකූලයි		
1.6	වෙනත්	-		
2	**පොත් සහ ලේඛන නඩත්තු කිරීම (FR 445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කිරීම සහ පවත්වාගෙන යාම	අනුකූලයි		
2.2	පුද්ගලික වැටුප් ලේඛන / පුද්ගලික වැටුප් කාඩ්පත් යාවත්කාලීන කිරීම සහ නඩත්තු කිරීම	අනුකූලයි		
2.3	විගණන විමසුම් ලැයිස්තුව යාවත්කාලීන කිරීම සහ නඩත්තු කිරීම	අනුකූලයි		
2.4	අභ්‍යන්තර විගණන වාර්තාව යාවත්කාලීන කිරීම සහ පවත්වාගෙන යාම	අනුකූලයි		
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ සකස් කර නියමිත වේලාවට භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූලයි		

2.6	චෙක්පත් යාවත්කාලීන කිරීම සහ නඩත්තු කිරීම සහ මුදල් ඇණවුම් ලේඛනය	අනුකූලයි		
2.7	බඩුතොග (Inventry) යාවත්කාලීන කිරීම සහ නඩත්තු කිරීම	අනුකූලයි		
2.8	තොග යාවත්කාලීන කිරීම සහ නඩත්තු කිරීම	අනුකූලයි		
2.9	අලාභ හා හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීන කිරීම සහ නඩත්තු කිරීම	අනුකූලයි		
2.10	වගකීම් ලැයිස්තුව යාවත්කාලීන කිරීම සහ නඩත්තු කිරීම	අනුකූලයි		
2.11	උප කඩදාසි පොත් ලේඛනය යාවත්කාලීන කිරීම සහ නඩත්තු කිරීම (GA-N20)	අනුකූලයි		
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යය නියෝජනය කිරීම**			
3.1	සංවිධානය තුළ මූල්‍ය බලතල පැවරීම	අනුකූලයි		
3.2	මූල්‍ය බලතල පැවරීම පිළිබඳව ආයතනය දැනුවත් කර තිබිය යුතුය	අනුකූලයි		
3.3	එක් එක් ගනුදෙනුව සඳහා නිලධාරීන් දෙදෙනෙකු හෝ වැඩි ගණනක් අනුමත කළ හැකි බලතල පැවරීම	අනුකූලයි		
3.4	2014.05.11 දිනැති රජයේ ගිණුම් චක්‍රලේඛ අංක 171/204 අනුව රජයේ වැටුප් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරීවරයාගේ පාලනය යටතේ ක්‍රියා කිරීම	අදාළ නොවේ		
4	**වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූලයි		
4.2	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අදාළ නොවේ		
4.3	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කර නියමිත දිනට රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම	අනුකූලයි		
4.4	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත	අදාළ නොවේ		

	වේලාවට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම			
5	**විගණන විමසුම**			
5.1	විගණකාධිපතිවරයා විසින් සඳහන් කර ඇති සියලුම විගණන විමසුම් සඳහා ඔහු විසින් නියම කර ඇති නියමිත දිනට පිළිතුරු ලබා දීම	අනුකූලයි		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	DMA/1-2019-FR 134(2) අනුව වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් පසු අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කර තිබීම	අදාළයි - සම්පූර්ණ කර නැත		ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත
6.2	මාසයක් ඇතුළත සෑම අභ්‍යන්තර විගණනයකටම ප්‍රතිචාර දැක්වීම	අදාළයි - සම්පූර්ණ කර නැත		ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත
6.3	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ -40 (4) උප වගන්ති ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණන කළමනාකරණ දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම.	අදාළයි - සම්පූර්ණ කර නැත		ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත
6.4	මූල්‍ය රෙගුලාසි 134(3) අනුව සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.	අදාළයි - සම්පූර්ණ කර නැත		ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත
7	**විගණන සහ කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ අංක 1-2019 අනුව අදාළ වර්ෂය තුළ අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් පවත්වා තිබීම.	අනුකූලයි		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 01/2017 හි 07 වන පරිච්ඡේදයට අනුව වත්කම් අත්පත් කර ගැනීම සහ බැහැර	අනුකූලයි		

	කිරීම පිළිබඳ තොරතුරු පාලක ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කිරීම			
8.2	ඉහත 13 වැනි පරිච්ඡේදයේ එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය කිරීම සඳහා සම්බන්ධීකරණ නිලධාරියෙකු පත් කිරීම සහ එම නිලධාරියා පිළිබඳ තොරතුරු පාලක ජනරාල් කාර්යාලයට වාර්තා කිරීම.	අනුකූලයි		
8.3	රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ අංක 05/2016 අනුව සමීක්ෂණ මණ්ඩලයක් පවත්වා නියමිත දිනට අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබිය යුතුය.	අදාළයි - කර නැත		ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත
8.4	චක්‍රලේඛයේ සඳහන් කාල සීමාව තුළ වාර්ෂික සමීක්ෂණ මණ්ඩලයේ හෙළිදරව් වූ අතිරික්තයන්, අඩුපාඩු සහ අනෙකුත් නිර්දේශ ඉදිරිපත් කර තිබීම	අදාළයි - කර නැත		ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත
8.5	FR 772 ප්‍රකාරව භාවිත කළ නොහැකි අයිතම බැහැර කිරීම	අදාළයි - කර නැත		ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් සහ මාසික සාරාංශ වාර්තා සකස් කර නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූලයි		
9.2	මාස 6ක කාලසීමාවකට නොඅඩු, සේවා කළ නොහැකි අනාරක්ෂිත වාහන ධාවනයෙන් බැහැර කර තිබිය යුතුය	අනුකූලයි		
9.3	වාහනවල ලොග් සටහන් නඩත්තු කිරීම සහ යාවත්කාලීන කිරීම	අනුකූලයි		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම FR 103,104,109 සහ 110 අනුව පියවර ගැනීම	අනුකූලයි		

9.5	2016.12.29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 2016/30 හි 3.1 ඡේදයේ විධිවිධාන අනුව වාහනවල ඉන්ධන දහනය නැවත පරීක්ෂා කිරීම	අනුකූලයි		
9.6	කල්බදු කාලයෙන් පසු කල්බදු වාහන පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගැනීම	අදාළ නොවේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ සකස් කර සහතික කර විගණනය සඳහා ඉදිරිපත් කර තිබිය යුතුය .	අනුකූලයි		
10.2	සමාලෝචන වර්ෂය තුළ හෝ ඊට පෙර ඉදිරිපත් කරන ලද අක්‍රිය බැංකු ගිණුම් පියවා තිබිය යුතුය	අනුකූලයි		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශනවල හෙළිදරව් කර සකස් කර ඇති ශේෂයන් සම්බන්ධයෙන් මුල්‍ය රෙගුලාසිවලට අනුකූලව ක්‍රියා කර මාසයක කාලයක් තුළ එම ශේෂ පියවා තිබීම.	අනුකූලයි		
11	**අරමුදල් භාවිතා කිරීම**			
11.1	සම්පාදනය කර තිබූ ප්‍රතිපාදන ඉක්මවා නොයන වියදම් දැරීම	අනුකූලයි		
11.2	සීමාව නොඉක්මවන 94 (1) වගන්තියට අනුව සපයා ඇති ප්‍රතිපාදන භාවිතා කිරීමෙන් පසු වසර අවසානයේ වගකීම් වෙත ළඟා වීම	අනුකූලයි		
12	**රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්ට අනුකූල වීම	අදාළ නොවේ		
12.2	හිඟ ණය ශේෂයන් පිළිබඳ වයස් විශ්ලේෂණයක් කර තිබීම	අදාළ නොවේ		
12.3	වසරකට වැඩි කාලයක් සඳහා හිඟ ණය ශේෂය පියවා තිබිය යුතුය	අදාළ නොවේ		

13	**සාමාන්‍ය තැන්පතු ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් FR 571 අනුව කටයුතු කර තිබිය යුතුය	අදාළ නොවේ		
13.2	සාමාන්‍ය තැන්පතු ගිණුම් සඳහා පාලන ගිණුම යාවත්කාලීන කිරීම සහ පවත්වාගෙන යාම	අදාළ නොවේ		
14	**Imprest ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ මුදල් පොත් ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත යොමු කර තිබිය යුතුය.	අදාළ නොවේ		
14.2	371 යටතේ නිකුත් කරන ලද අතුරු සටහන, නිශ්චිත වැඩ නිම කිරීමෙන් පසු මාසයක් ඇතුළත නිරාකරණය කිරීම	අදාළ නොවේ		
14.3	FR 371 ප්‍රකාරව අනුමත සීමාව නොඉක්මවන පරිදි දැනට අතුරු ප්‍රකාශය නිකුත් කර ඇත	අදාළ නොවේ		
14.4	Imprest ගිණුමේ ශේෂය භාණ්ඩාගාර පොත සමඟ මාසිකව ප්‍රතිසන්ධානය කිරීම	අදාළ නොවේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව එකතු කරන ලද ආදායමෙන් ආපසු ගෙවීම් කර තිබිය යුතුය	අනුකූලයි		
15.2	එකතු කරන ලද ආදායම තැන්පතු ගිණුමට තැන්පත් නොකර සෘජුවම ආදායම් ආදායම් ගිණුමට බැර කිරීම	අනුකූලයි		
15.3	FR 176 ප්‍රකාරව විගණකාධිපතිවරයාට හිඟ ආදායම් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූලයි		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය නඩත්තු කිරීම	අනුකූලයි		
16.2	සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයින්ට රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූලයි		

16.3	MSD චක්‍රලේඛ අංක ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම. 2017.09.20 දිනැති 04/2017	අනුකූලයි		
17	**මහජනතාවට තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනත සහ රෙගුලාසිවලට අනුකූලව තොරතුරු නිලධාරියෙකු පත් කිරීම සහ සපයන ලද තොරතුරුවලින් සමන්විත ලේඛනයක් යාවත්කාලීන කිරීම සහ නඩත්තු කිරීම	අනුකූලයි		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දීම සහ මහජනතාවට තම අදහස්/චෝදනා එම වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග ඔස්සේ ඉදිරිපත් කිරීමට පහසුකම් සැලසීම.	අනුකූලයි		
17.3	තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනතේ 8 සහ 10 වගන්තිවලට අනුව වසරකට දෙවරක් හෝ වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූලයි		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ අංක 05/2018 සහ 2018.05 (1) චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව පුරවැසි/සේවාදායක ප්‍රඥප්තියක් සකස් කර ක්‍රියාත්මක කර තිබීම.	අනුකූලයි		
18.2	එකී චක්‍රලේඛයේ 2.3 ඡේදය ප්‍රකාරව, පුරවැසි/සේවාදායකයන්ගේ ප්‍රඥප්තිය සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම පිළිබඳ කාරණය අධීක්ෂණය හා ඇගයීම සඳහා සංවිධානය විසින් ක්‍රමවේදයක් සකස් කර තිබිය යුතුය.	අනුකූලයි		

19	**මානව සම්පත් සැලැස්ම සකස් කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 මත පදනම්ව මානව සම්පත් සැලැස්ම සකස් කිරීම	අනුකූලයි		
19.2	ඉහත මානව සම්පත් සැලැස්ම තුළ කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකුටම වසරකට අවම වශයෙන් පැය 12 ක පුහුණුවක් දී තිබීම සහතික කර තිබිය යුතුය.	අනුකූලයි		
19.3	ඉහත චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දක්වා ඇති ආකෘතිය මත පදනම්ව සමස්ත කාර්ය මණ්ඩලය සඳහා වාර්ෂික කාර්ය සාධන ගිවිසුමක් අත්සන් කර තිබිය යුතුය.	අදාළයි - කර නැත		ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදයට අනුව කුසලතා සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කරන මානව සම්පත් සංවර්ධන සැලැස්ම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සකස් කිරීමේ වගකීම ඇති ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කර තිබීම.	අනුකූලයි		
20	**විගණන විමසුම් වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	පසුගිය වසර සඳහා විගණකාධිපතිවරයාගේ විගණන විමසුම් පෙන්වා දුන් අඩුපාඩු නිවැරදි කිරීම	අනුකූලයි		